# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත

---

**[සහතිකය සටහන් කළේ 2010 නොවැම්බර් මස 03 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 නොවැම්බර් මස 04 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **50.00 යි.** **තැපැල් ගාස්තුව :** රු. **20.00 යි.**

## 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත

[සහතිකය සටහන් කළේ 2010 නොවැම්බර් මස 03 වැනි දින]

එල්.ඩී.–ඕ. 52/2000.

**සිවිල් ගුවන් සේවාව විධිමත් කිරීම, පාලනය කිරීම සහ ඊට සම්බන්ධිත කාරණා සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම, අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතිය බලාත්මක කිරීම සහ ඊට සම්බන්ධ වූ හා ඊට ආනුෂංගික වූ කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම ද සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. මේ පනත වර්ෂ 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත වශයෙන් හඳුන්වන ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" වශයෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

### I වන පරිච්ඡේදය

### මූලික කාරණා

ශ්‍රී ලංකාව තුළ සිවිල් ගුවන් සේවා කටයුතු, සම්මුතිය මගින් පාලනය වන බව.

**2.** මේ පනතෙහි උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති සිවිල් ගුවන් සේවාවේ නිරුපද්‍රිතතාව, විධිමත්භාවය, කාර්යක්ෂමතාව සහ ආරක්ෂාවට අදාළ සම්මුතියේ වගන්ති මගින් ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය තුළ සිවිල් ගුවන් සේවාවට සම්බන්ධ සියලු ම කටයුතු පාලනය විය යුතු ය.

මේ පනතෙහි විධිවිධානවල අදාළත්වය.

3. (1) මේ පනතෙහි විධිවිධාන ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය ඇතුළත සිදු කෙරෙන සියලු ම සිවිල් ගුවන් සේවා කටයුතු සම්බන්ධයෙන් ද විශේෂයෙන් ම පහත සඳහන් දේ සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය :–

(අ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානා සහ ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය ඇතුළත හෝ පිටත හෝ සිටින, මේ පනත යටතේ බලපත්‍ර ලත් ගුවන් සේවා සේවක පිරිස් ;

(ආ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානා නොවන අනෙකුත් ගුවන් යානා සහ ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය ඇතුළත සපයනු ලබන ගගන නාවික සේවා පරිහරණය කරන්නන් ;

PL 005199 - 3,450 (2010/09)

(ඇ) ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය තුළ කරගෙන යනු ලබන සිවිල් ගුවන් සේවාවට සම්බන්ධ කටයුතු විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ ඒ පිළිබඳ නිරුපද්‍රිතතා අධීක්ෂණය ;

(ඈ) ගගන නාවික සේවා සැපයීම ; සහ

(ඉ) සිවිල් ගුවන් සංතරණයෙහි සහ ගුවන් ප්‍රවාහනයෙහි ආර්ථික සංවර්ධනය ද ඇතුළුව සිවිල් ගුවන් සංතරණයෙහි සහ ගුවන් ප්‍රවාහනයෙහි නිරුපද්‍රිත සහ ක්‍රමවත් මෙහෙයවීමට සහ සංවර්ධනයට අදාළ වෙනත් කාරණා.

(2) සන්නද්ධ හමුදා සේවය සඳහා හෝ එකී කාර්යය සඳහා අනන්‍ය වශයෙන් භාවිත කරනු ලබන යම් ගුවන් යාත්‍රාවක් හෝ ගගන යාත්‍රාංගනයක් හෝ සම්බන්ධයෙන් මේ පනතේ හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝග සහ රීතිවල හෝ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(3) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් භාවිත කරනු ලබන ගුවන් යානා සම්බන්ධයෙන් මේ පනතෙහි විධිවිධාන අදාළ වන්නේ, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබනතාක් දුරට පමණකි.

(4) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ සහ (3) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, සන්නද්ධ හමුදා විසින් මෙහෙයවනු ලබන ගුවන් යානා සහ ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාවිතයේ ඇති ගුවන් යානා, කුලියක් හෝ පරිදාන සඳහා මගීන් හෝ බඩු ප්‍රවාහනයෙහි යෙදී සිටින අවස්ථාවක මේ පනතේ විධිවිධාන එකී ගුවන් යානා සඳහා අදාළ වන්නේ ය.

අමාත්‍යවරයා සතු වගකීම්.

**4.** අමාත්‍යවරයා ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවාව සංවර්ධනය කිරීම, විධිමත් කිරීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වන අතර ඒ වගකීම් ක්‍රියාත්මක කිරීමේ දී ඔහු විසින් -

(අ) ශ්‍රී ලංකාව සඳහා ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තිය සකස් කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතුය ;

(ආ) ඉහත කී ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තිය වරින් වර සමාලෝචනය කරමින් සහ විග්‍රහ කරමින් අවශ්‍ය අවස්ථාවන්හි දී ඒ ප්‍රතිපත්තියේ වෙනස්කම් ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය ;

(ඇ) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් "ප්‍රනිප" සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික බැඳීම් ඉෂ්ට කිරීම සඳහාත් අවශ්‍ය නියෝග ප්‍රකාශයට පත් කළ යුතු ය ;

(ඈ) අන්තර්ජාතික ගුවන් ගමනාගමනය සම්බන්ධයෙන් වූ ශ්‍රී ලංකාවේ අයිතිවාසිකම් අන්තර්ජාතික ගිවිසුමකින් හෝ අන්‍යාකාරයෙන් සුරක්ෂණය කිරීම සඳහා සහ ඒ සම්බන්ධව සාකච්ඡා කිරීමට සහ මෙහෙයවීමට ආණ්ඩුවට සහායවීම සහ උපදෙස් දීම කළ යුතු ය ;

(ඉ) ගගන නාවික සේවා සහ සිවිල් ගුවන් සේවාවට සම්බන්ධ වෙනත් පහසුකම් සහ සේවා ස්ථාපනය කිරීම, වර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ සැපයීම කළ යුතු ය ;

(ඊ) ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් කටයුතුවල සංවර්ධනය වැඩිදියුණු වෙතැයි අමාත්‍යවරයාගේ මතය වන ව්‍යාපෘති, තාක්ෂණික පර්යේෂණ, අධ්‍යයන හෝ විමර්ශන කටයුතු ආරම්භ කළ යුතු ය ;

(උ) මේ පනතේ සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ විධිවිධාන යටතේ ප්‍රදානය කරනු ලබන සහතික, බලපත්‍ර, අවසර පත්‍ර හෝ බලය පැවරීම් හෝ, කවර හෝ සේවාවන් සැපයීම වෙනුවෙන් ගෙවිය යුතු අයකිරීම්, ගාස්තු සහ පිරිවැය ප්‍රමාණයන් නිශ්චිතව සඳහන් කළ යුතු ය ;

(ඌ) අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ හෝ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ හෝ ඒ පනත් යටතේ සාදනු ලැබ ඇති නියෝග හෝ රීති කිසිවක් යටතේ හෝ නිශ්චිත වශයෙන් විධිවිධාන සලස්වා නොමැති සිවිල් ගුවන් සේවාවට අදාළ කර්තව්‍යයක් ඉටු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙතැයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන විධාන අධිකාරිය වෙත නිකුත් කළ යුතු ය ; සහ

(එ) ඔහු විසින් සුදුසු යයි අදහස් කරනු ලබන සිවිල් ගුවන් සේවාවට අදාළ වෙනත් යම් ක්‍රියාකාරකමක් හෝ කර්තව්‍යයක් අධිකාරියේ එකඟත්වය ඇතිව භාරගනු ලැබිය යුතු ය.

අමාත්‍යවරයා විසින් පනත යටතේ ඔහුගේ බලතල පවරාදීම.

**5.** (1) අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ ඔහු වෙත පැවරී ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය සියල්ල හෝ ඉන් කිසිවක් හෝ අධිකාරිය වෙත හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ පවරනු ලැබිය හැකි අතර අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන යම් විධානවලට යටත්ව අධිකාරිය හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ එකී බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කළ යුතු ය; ඉටු කළ යුතු ය.

(2) (1) වන උප වගන්තිය යටතේ බලතල පවරාදීමක් සිදු කොට තිබුණ ද, එසේ පවරා දී ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය හෝ කිසිවක් අමාත්‍යවරයා විසින් ක්‍රියාත්මක කිරීමේ හෝ ඉටු කිරීමේ බලය අමාත්‍යවරයා සතුව පවතින්නේ ය.

## II වන පරිච්ඡේදය

### සේවා සැපයුම්කරුවන් පත් කිරීම

සේවා සැපයුම්කරුවන් පත් කිරීම.

**6.** (1) මේ පනතේ 31 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගගන නාවික සේවා සැපයීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් අධිකාරිය විමසා (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් යම් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ සේවා සපයන්නකු වශයෙන් (මෙහි මින් මතු ''සේවා සපයන්නා '' යනුවෙන් හඳුන්වනු ලබන) ඒ නියමයේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් සහ කොන්දේසි අමාත්‍යවරයා විසින් අධිකාරිය විමසා ඒ සඳහා පසුව කරනු ලබන නියමයක් මගින් කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි අතර, ඒ නියමය මගින් සේවා සපයන්නකුගේ නියමයන් සහ කොන්දේසි සංශෝධනය කරනු ලබන විට එසේ සංශෝධිත නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීම, ඒ සේවා සපයන්නාගේ කාර්යය වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සේවා සපයන්නකු පත් කරනු ලැබීම සම්බන්ධව පහත දැක්වෙන විධිවිධාන අදාළ වන්නේ ය :–

(අ) (i) 31 වන වගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් ගගන නාවික සේවා සැපයීම සඳහා සහ එකී වගන්තියේ (ඇ) සහ (ඈ) ඡේදවල නිශ්චිතව සඳහන් ගගන නාවික සේවා, එහි සඳහන්කොට ඇති යම් ජාත්‍යන්තර ගගන යාත්‍රාංගනයක දී සැපයීම සඳහා ; සහ

(ii) 31 වන වගන්තියේ (ඉ), (ඊ), (උ) සහ (ඌ) ඡේදවල සඳහන් ගගන නාවික සේවා සැපයීම සඳහා,

ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරු, සේවා සැපයුම්කරු ලෙස පත්කරනු ලැබිය යුතු ය.

(ආ) යම් විශේෂිත ගගන යාත්‍රාංගනයක් සම්බන්ධයෙන් 31 වන වගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව සඳහන් ගගන නාවික සේවා සැපයීම පිණිස පත් කරනු ලැබීමට ව්‍යවස්ථාදායි සේවා සැපයුම්කරු කැමති වන අවස්ථාවක, එවැනි ගගන යාත්‍රාංගන සම්බන්ධයෙන් එවැනි ගගන නාවික සේවා සහ එකී වගන්තියේ (ඇ) සහ (ඈ) ඡේදවල නිශ්චිතව සඳහන් ගගන නාවික සේවා සැපයීම පිණිස එකී ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරු, සේවා සැපයුම්කරු ලෙස පත් කරනු ලැබිය යුතුය;

(ඇ) ව්‍යවස්ථාදායි සේවා සැපයුම්කරු (ආ) ඡේදය යටතේ සේවා සැපයුම්කරු ලෙස පත්කරනු ලැබුවේ යම් ගගන නාවික සේවා සම්බන්ධයෙන්ද, එකී ගගන නාවික සේවා නොවන්නා වූ, 31 වන වගන්තියේ (ආ) ඡේදයෙහි නිශ්චිතව සඳහන් වෙනත් ගගන නාවික සේවා යම් විශේෂිත ගගන යාත්‍රාංගනයක් සම්බන්ධයෙන් සැපයීම පිණිස යම් වෙනත් සේවා සැපයුම්කරුවකු පත් කළ යුතු ය;

(ඈ) 31 වන වගන්තියේ (ඇ) සහ (ඈ) ඡේදවල නිශ්චිතව සඳහන් ගගන නාවික සේවා සැපයීම සඳහා, යම් විශේෂිත ගගන යාත්‍රාංගනයන් සම්බන්ධයෙන් සේවා සපයන්නන් එක් අයකුට වඩා පත් නොකළ යුතු ය; සහ

(ඉ) 31 වන වගන්තයේ (එ), (ඒ), (ඔ), (ඕ) සහ (ක) ඡේදවල නිශ්චිතව සඳහන් ගගන නාවික සේවා එකී වගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් යම් ගගන යාත්‍රාංගනයකදී සැපයීම සඳහා මේ ඡේදයේ කාර්ය සඳහා නියම කරනු ලබන පරිදි වූ රාජ්‍ය සංස්ථාවක් හෝ ආණ්ඩුව විසින් බහුතර කොටස් සංඛ්‍යාවක් දරනු ලබන යම් සමාගමක් හෝ සේවා සැපයුම්කරුවකු ලෙස පත් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, 31 වන වගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල සඳහන් යම් ගගන යාත්‍රාංගනයකදී මේ ඡේදයේ සඳහන් ගගන නාවික සේවා සැපයීම සඳහා මේ ඡේදය යටතේ පත්කරනු ලබන සේවා සැපයුම්කරුවකු කැමැති නොවන අවස්ථාවක, මේ ඡේදයේ සඳහන් ගගන නාවික සේවා සැපයීම සඳහා අමාත්‍යවරයා විසින් යම් වෙනත් සේවා සැපයුම්කරුවකු පත්කරනු ලැබිය හැකි ය.

**7.** (1) 31 වන වගන්තියේ (එ), (ඒ), (ඔ), (ඕ) සහ (ක) ඡේදවල නිශ්චිතව දක්වා ඇති ගගන නාවික සේවා සැපයීම සඳහා පත්කරනු ලැබ ඇති සේවා සැපයුම්කරුවකු විසින් ඔහු පත් කරනු ලැබීමට පෙර 31 වන වගන්තියේ (අ) ජේදයේ හෝ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ගගන නාවික සේවාව සැපයීම සඳහා පත් කරනු ලැබ සිටින සේවා සපයන්නා සමග අවස්ථාවෝචිත පරිදි සේවා ගිවිසුමකට හෝ සේවා ගිවිසුම්වලට ඇතුළත් විය යුතු බවට නියමිත වන්නේ ය.

සේවා ගිවිසුම්වලට ඇතුළත්විය යුතු බවට වූ නියමය.

(2) 31 වන වගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් ගගන නාවික සේවා සැපයීම සඳහා ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු නොවන වෙනත් සේවා සැපයුම්කරුවකු පත් කරනු ලැබ ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එකී සේවා සැපයුම්කරු හෝ සේවා සැපයුම්කරුවන් විසින් සලසනු ලබන සේවාවල ස්වභාවය සහ විෂය ප්‍රමාණය, එකී ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් සැපයීමට නියමිත ගගන නාවික සේවාවේ නිරුපද්‍රිතතාව සහ ආරක්ෂාව කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරන විටෙක, එකී වගන්තියේ (ඉ), (ඊ), (උ) සහ (ඌ) ඡේදවල නිශ්චිතව සඳහන් ගගන නාවික සේවා සැපයීම සඳහා පත්කරනු ලැබූ ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු සමග සේවා ගිවිසුමකට හෝ සේවා ගිවිසුම්වලට ඇතුළත්වීමට අවස්ථාවෝචිත පරිදි එකී සේවා සැපයුම්කරුට හෝ සේවා සැපයුම්කරුවන්ට නියම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ 6 වන වගන්තිය යටතේ සේවා සැපයුම්කරුවකු පත් කරනු ලැබීමට පෙර, මේ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් කරන ලද අදාළ සේවා ගිවිසුමෙහි හෝ සේවා ගිවිසුම්වල හෝ අන්තර්ගතයන් මගින්, ශ්‍රී ලංකාව ඇතුළත නිරුපද්‍රිත වූත්, කාර්යක්ෂම වූත්, විධිමත් වූත්, සුමට වූත් ගගන නාවික සේවාවන් මෙහෙයවන බවට සහතික කරගැනීම සඳහා තොරතුරු ප්‍රමාණවත් ලෙස හුවමාරු කරගැනීම, ගිවිසුමේ පාර්ශ්වයන් විසින් ගගන නාවික සේවා සැපයීමේ දී සියලු ම ක්‍රියාකාරකම් අතර නිසියාකාර සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම සහ එකිනෙකා සන්තකයේ හෝ පාලනයේ පවතින දේපළ, පහසුකම් හෝ සේවාවන් භාවිතයට ගැනීම ද සඳහා අවශ්‍ය විධිවිධාන සලස්වා ඇත්තේ ද යන්න අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

සේවා සැපයුම්කරුවන්ට දේපළ සපයාදීම.

**8.** (1) 6 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් සේවා සැපයුම්කරුවකුට, ඒ සේවා සැපයුම්කරුට මේ පනතේ මේ කොටසේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ යම් ගගන නාවික සේවා සැපයීම සම්බන්ධව ද එම ගගන නාවික සේවා සැපයීමේ දී සිය කර්තව්‍ය ඉටු කිරීම හැකි කරවීම සඳහා අධිකාරියට මාරු කර පවරා දී ඇති නිශ්චල දේපළ සහ ගගන යාත්‍රාංගන ද ඇතුළුව නිශ්චල දේපල හෝ ගගන යාත්‍රාංගන හෝ කිසිවක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ නියමයේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව ඒ සේවා සැපයුම්කරු වෙත අවශ්‍ය අවස්ථාවන්හිදී සපයා දීමට අධිකාරිය විසින් කටයුතු කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ දේපළ හෝ ගගන යාත්‍රාංගන හෝ කිසිවක් සපයා දෙනු ලැබ ඇත්තේ යම් සේවා සැපයුම්කරුවකු වෙත ද ඒ සේවා සැපයුම්කරු විසින් නියමයේ සඳහන් කොට ඇති

නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරනු ලැබීමත්, ඒ නිශ්චල දේපළ හෝ ගගන යාත්‍රාංගන හෝ මනා තත්ත්වයෙන් තබා ගැනීම සහ නඩත්තු කරනු ලැබීමත් ඔහුගේ කාර්යය වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිශ්චල දේපළ හෝ ගගන යාත්‍රාංගන හෝ කිසිවක් සපයා දෙනු ලැබ ඇත්තේ යම් සේවා සැපයුම්කරුවකු වෙත ද ඒ සේවා සැපයුම්කරු විසින් අධිකාරියේ පූර්ව ලිඛිත අනුමතය නොලබා -

(අ) ඒ යම් දේපළක හෝ ගගන යාත්‍රාංගනයක හෝ යම් වෙනස් කිරීමක් සිදු කිරීම හෝ ඒ දේපළ තුළ අලුතින් ඉදිකිරීම් කිසිවක් කිරීම ; හෝ

(ආ) ඒ දේපළක් හෝ ගගන යාත්‍රාංගනයක් හෝ කිසිවකුට බදු දීම,

නොකළ යුතු ය.

යම් පුද්ගලයන් සේවා සැපයුම්කරුවන් වශයෙන් පත් කිරීම ආදිය තහනම් කිරීම.

**9.** ශ්‍රී ලංකාවේ පොදු ආරක්ෂාව කෙරෙහි හෝ අන්තර්ජාතික සිවිල් ගුවන් සේවාව කෙරෙහි හෝ තර්ජනයක් වන හෝ එවැනි තර්ජනයක් විය හැකි හෝ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් හෝ මේ පනත යටතේ සේවා සැපයුම්කරුවකු වශයෙන් පත් කරනු නොලැබිය යුතු අතර එවැනි යම් තැනැත්තකු වෙත හෝ පුද්ගල මණ්ඩලයක් වෙත මේ පනත යටතේ ගගන නාවික සේවා සැපයීම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමට හිමිකමක් නොතිබිය යුත්තේ ය.

ගගන නාවික සේවා සැපයීම සඳහා බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාව.

**10.** ගගන නාවික සේවා සැපයීම, ඒ සඳහා අවස්ථාවෝචිත පරිදි අධිකාරිය හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ නිකුත් කරනු ලබන බලපත්‍රයක් ප්‍රකාරව සිදුවිය යුතු අතර, 6 වන වගන්තිය යටතේ පත්කර ඇති සේවා සැපයුම්කරුවකු එවැනි බලපත්‍රයක් ඉල්ලුම් කිරීමට සුදුසුස්සකු විය යුතු ය. 31 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති එක් එක් වර්ගයේ ගගන නාවික සේවා සම්බන්ධයෙන් වෙන් වෙන් බලපත්‍ර නිකුත් කරනු ලැබිය යුතු ය.

ගගන නාවික සේවා සැපයීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම.

11. (1) සේවා සැපයුම්කරුවකු විසින් ගගන නාවික සේවා සැපයීම සම්බන්ධයෙන් -

(අ) 31 වන වගන්තියේ (එ), (ඒ), (ඔ), (ඕ) සහ (ක) ඡේදවල නිශ්චිතව දක්වා ඇති එක් එක් සේවා වර්ග සැපයීම සඳහා අධිකාරිය විසින් ; සහ

(ආ) 31 වන වගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති එක් එක් සේවා වර්ග සැපයීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්,

මේ පනතේ 10 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඒ සේවා සැපයුම්කරුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) 1 වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා, ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු පටිපාටි, බලපත්‍රයක ඇතුළත් විය යුතු නියමයන් හා කොන්දේසි ද ඉල්ලුම්කරුවන් විසින් සපයනු ලැබිය යුතු තොරතුරු සහ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු සහ වෙනත් අයකිරීම් ද නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) යම් විශේෂිත ගගන නාවික සේවාවක් සපයනු ලබන ස්ථානය හෝ සේවාවේ ස්වභාවය හෝ විෂය පථය මත ගගන නාවික සේවා සැපයීම සඳහා වූ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා (2) වන උපවගන්තිය යටතේ නියම කළ යුතු නියමයන් වෙනස් විය හැකි ය.

(4) අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර 26 වන වගන්තිය යටතේ අත්හිටුවීම හෝ අවලංගු කිරීම කරනු ලබන තෙක් හෝ කරනු ලබන්නේ නම් මිස, වලංගුව පවතින්නේ ය. මේ කොටස යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තකු මත, නියම කරනු ලබන පරිදි වූ වාර්ෂික ගාස්තුවක් පනවනු ලැබිය යුතු ය.

සේවා සැපයුම්කරුවන්ට, යම් බලපත්‍ර දරන්නකු හෝ අවසර පත්‍ර දරන්නකු සමග සේවා ගිවිසුම්වලට ඇතුළත් විය හැකි බව.

**12.** (1) ගගන නාවික සේවා සැපයීම සඳහා 11 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් සේවා සැපයුම්කරුවකු විසින් සපයනු ලබන ගගන නාවික සේවා එකී සේවා සැපයුම්කරුට එකී බලපත්‍රය හෝ අවසර පත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද, එකී ක්‍රියාකාරකම් කරගෙන යාමේ කාර්යය සඳහා එකී බලපත්‍රය හෝ අවසර පත්‍රය නිකුත් කරනු ලැබූ තැනැත්තා විසින් ම අත්‍යවශ්‍යයෙන් සැපයිය යුතු ගගන නාවික සේවා බව අධිකාරියේ මතය වන අවස්ථාවක, මේ පනතේ 7 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අධිකාරිය විසින් මේ

පනත යටතේ යම් ගගන නාවික සේවා සඳහා නොවන බලපත්‍රයක් හෝ අවසරපත්‍රයක් වන්නා වූ යම් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබුවා වූ තැනැත්තකු සමග සේවා ගිවිසුමකට එළඹීමට එකී සේවා සපයන්නාට අධිකාරිය විසින් නියම කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ඇතුළත් වනු ලබන සෑම සේවා ගිවිසුමකම පිටපතක් අධිකාරිය වෙත ලබාදීම එක් එක් සේවා සැපයුම්කරුවන්ගේ කාර්යය වන්නේ ය. අධිකාරිය විසින්, තමන් වෙත සපයනු ලැබුණු සියලු සේවා ගිවිසුම්වල පිටපතක් හෝ පිටපත් තම භාරයේ තබාගත යුතු ය. අමාත්‍යවරයා විසින් තමන්හට පිටපතක් ලබාදෙන ලෙස ඕනෑම වේලාවක ඉල්ලා සිටිය හැකි අතර, එය එසේ ලබාදීම අධිකාරියේ කර්තව්‍යය වන්නේ ය.

ගගන යාත්‍රාංගන වර්ගීකරණය.

13. (1) තත්කාර්යය සඳහා නියමිත යම් නියෝගවලට අනුව අධිකාරිය විසින් ගගන යාත්‍රාංගන වර්ගීකරණය කළ යුතු ය. තත් කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් සෑදිය යුතු නියෝග ගගන යාත්‍රාංගන සැලැස්ම, මෙහෙයුම් තත්ත්වයන්, සපයනු ලබන ගගන නාවික සේවාවන්, පරිහරණය කිරීමේ ප්‍රමාණය සහ ගගන යාත්‍රාංගනයෙන් බලාපොරොත්තු වන කාර්ය යන කාරණා මත පදනම් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අන්තර්ජාතික ගගන යාත්‍රාංගනයක් වශයෙන් වර්ගීකරණය කරන ලද ගගන යාත්‍රාංගන කිසිවක් සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය ඇතුළත පිහිටි අනෙකුත් සියලුම ගගන යාත්‍රාංගන සම්බන්ධයෙන් ද වූ තොරතුරු ශ්‍රී ලංකා ගගන නාවික තොරතුරු ප්‍රකාශනයෙහි පළකිරීමට අධිකාරිය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

ගගන යාත්‍රාංගන පිහිටුවීම.

14. (1) ගගන යාත්‍රාංගනයක් පිහිටුවීමට අපේක්ෂා කරන යම් තැනැත්තකු හෝ ගගන යාත්‍රාංගනයක් පුළුල් කිරීමට අපේක්ෂා කරන බලපත්‍ර දරන්නකු හෝ විසින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන නියමයන්ට අනුකූලව, ප්‍රධාන සැලැස්මක් සකස් කළ යුතුය. ඒ ප්‍රධාන සැලැස්මේ පහත සඳහන් දෑ හඳුනාගෙන ඒ සඳහා කටයුතු සැලැස්විය යුතු ය:–

(අ) ගුවන් සේවා සහ ගුවන් සේවා නොවන යන දෙවර්ගයේ ම ගගන යාත්‍රාංගනවල භෞතික පහසුකම් සංවර්ධනය;

(ආ) ගගන යාත්‍රාංගනය වටා ප්‍රදේශයන්හි ඉඩම් භාවිතය සංවර්ධනය වනු ලබන ආකාරය;

(ඇ) ගගන යාත්‍රාංගනය ඉදිකිරීමෙන් සහ ක්‍රියාත්මකවීමේ දී සිදුවන පාරිසරික බලපෑම තක්සේරු කිරීම;

(ඈ) ගගන යාත්‍රාංගනයට ප්‍රවේශය ලබාගැනීමේ අවශ්‍යතාවන් ; සහ

(ඉ) ගගන යාත්‍රාංගනයෙහි ආරක්ෂාව සැලසීම පිළිබඳව සහ ව්‍යාපෘතියේ වියදම සහ මූල්‍ය සැලැස්ම.

(2) ගගන යාත්‍රාංගනයක් සම්බන්ධයෙන් වූ ප්‍රධාන සැලැස්ම අධිකාරිය විසින් අනුමත කරන තෙක් ගගන යාත්‍රාංගනයක් අවස්ථාවෝචිත පරිදි පිහිටුවීම හෝ පුළුල් කිරීම හෝ ආරම්භ කිරීම නොකළ යුතු ය. ප්‍රධාන සැලැස්ම අනුමත කිරීමට පෙර වෙනත් යම් ව්‍යවස්ථාපිත අධිකාරියක් විමසා බැලීම සුදුසු යයි හෝ අවශ්‍ය යයි හෝ අධිකාරිය විසින් සලකනු ලබන්නේ නම් ද, යෝජිත පිහිටුවීම හෝ පුළුල් කිරීම සම්බන්ධයෙන් සහ ඉන් පරිසරයට සිදුවන බලපෑම සහ වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් සහ නිරීක්ෂණ ඒ ප්‍රධාන සැලැස්ම අනුමත කිරීමට පෙර සලකා බැලීම අවශ්‍ය වන්නේ නම් ද ඒ වෙනත් යම් ව්‍යවස්ථාපිත අධිකාරියක් විමසා බැලීම අධිකාරිය විසින් කළ යුතු ය.

(3) 2 වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන අනුමැතියක්, අධිකාරිය විසින් තීරණය කරනු ලබන කොන්දේසි හා නියමයන්ට ද ගාස්තුවක් ගෙවීමකට ද යටත් විය යුතු ය. ප්‍රදානය කරන ලද යම් අනුමැතියක් සම්බන්ධයෙන් වූ දැන්වීමක්, අධිකාරිය විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ දක්වා ඇති තොරතුරු හැර, අනුමත කරන ලද ප්‍රධාන සැලැස්මේ පිටපතක් අධිකාරියේ කාර්යාලයේ තැබිය යුතු අතර අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් ගාස්තුවක් ගෙවීමෙන් පසු මහජනයාට පරීක්ෂා කිරීමට ඉඩ සලසා දිය යුතු ය.

(5) අධිකාරිය විසින් කලින් කල අවශ්‍ය යයි අදහස් කරන අවස්ථාවක දී හෝ (2) වන උපවගන්තිය යටතේ අනුමැතිය ප්‍රදානය කරනු ලැබූ තැනැත්තාගේ ඉල්ලීම මත හෝ ඒ ප්‍රධාන සැලැස්ම අනුමත කිරීමෙන් පසු සිදු වී ඇති යම් වෙනස්කම් කිසිවකට ගැලපෙන පරිදි ප්‍රධාන සැලැස්මක් සමාලෝචනය කිරීම හෝ තක්සේරු කිරීම කළ යුතු යයි ද, සුදුසු වැඩිදියුණු කිරීම් හෝ ගැලපීම් හෝ කළ යුතු යයි ද නියම කරනු ලැබිය හැකි ය.

**15.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වි තිබුණ ද, මේ පනතේ 14 වන වගන්තිය යටතේ වරක් අනුමත කරන ලද ප්‍රධාන සැලැස්මක්, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ තවදුරටත් අනුමැතියකට හෝ පිළිගැනීමකට හෝ යටත් නොවිය යුතුය. නැතහොත් අනුමැතියක් හෝ පිළිගැනීමක් ලබා ගත යුතු යයි නියමිත නොවිය යුතු ය.

වරක් අනුමත කරන ලද ප්‍රධාන සැලැස්ම තවදුරටත් අනුමත කිරීම අනවශ්‍ය බව.

**16.** (1) 13 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව නියමිත දිනයේ දී සහ ඉන් පසුව මේ පනතේ 11 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයකට අනුකූලව සහ එවැනි බලපත්‍රයක නියම සහ කොන්දේසිවලට යටත්ව මිස, තනිකර ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ම භාවිත කරනු ලබන ගගන යාත්‍රාංගන හැර, ආණ්ඩුවට අයත් හෝ පෞද්ගලික අයිතියේ ඇති හෝ කිසිම ගගන යාත්‍රාංගනයක් නඩත්තු කිරීම, මෙහෙයවීම හෝ වැඩිදියුණු කිරීම හෝ නොකළ යුතු ය.

ගගන යාත්‍රාංගන සඳහා බලපත්‍ර නිකුත් කිරීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් බලපත්‍රයක් නිකුත් කිරීමේ කාර්යය සඳහා ගගන යාත්‍රාංගනයක් මෙහෙයවීම යන්නට-

(අ) ගුවන් යානයක ඉගිලුම, ගොඩබැස්සවීම සහ ඊට සම්බන්ධිත පොළව මත වූ ගුවන් යානයේ චලන ;

(ආ) ගුවන්යානය සඳහා වූ ආරක්ෂාව සහ සැලකිල්ල ; සහ

(ඇ) ගගන යාත්‍රාංගනය නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම.

සහතික කරන්නා වූ ක්‍රියාවන් ඇතුළත් වේ.

(3) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් නියමිත ඉල්ලුම්පත් ගාස්තුව සමග අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) ගගන යාත්‍රාංගන සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වූ උපමාන 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් සිදු කරනු ලබන ගගන යාත්‍රාංගන වර්ගීකරණය මත පදනම් විය යුතු ය.

ජාතික සිවිල් ගුවන් සේවා ආරක්ෂක වැඩසටහන.

17. (1) අධිකාරිය විසින්, අදාළ ප්‍රතිපයන්ට අනුකූලව ජාතික සිවිල් ගුවන් සේවා ආරක්ෂක වැඩසටහනක් ක්‍රමවත්ව සකස් කළ යුතු ය.

(2) ගුවන් සේවා ආරක්ෂක සේවාවක් සැපයීම සහ පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ සිටින සේවා සැපයුම්කරුවකු විසින්, පහත සඳහන් එක් එක් කාර්යය සඳහා ඔහු විසින් භාවිත කරනු ලබන මානව සහ වෙනත් සම්පත් ද, ඒ එක් එක් කාර්යය සඳහා අනුගමනය කරනු ලබන කාර්ය පටිපාටීන් ද නිශ්චිතව සඳහන් කරමින්, අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ ක්‍රමවත්ව සකස් කරන ලද ජාතික සිවිල් ගුවන් සේවා ආරක්ෂක වැඩසටහනට අනුකූලව වැඩසටහනක් පිහිටුවනු ලැබීම ඒ සපයන්නාගේ කාර්යය වන්නේ ය -

(අ) ගගන යාත්‍රාංගනයක හෝ ගගන නාවික සේවා සපයනු ලබන වෙනත් යම් තැනක හෝ ස්ථානයක හෝ සිදුවන නීති විරෝධී ලෙස ගුවන් සේවාවන්ට මැදිහත්වීම් වැලැක්වීම, එවැනි මැදිහත්වීම් සොයා ගැනීම, ඒවාට බාධා කිරීම සහ ප්‍රතිචාර දැක්වීම ;

(ආ) ගුවන් යානයකට හෝ පියසරයෙහි යෙදෙන ගුවන් යානයකට හෝ එරෙහිව නීති විරෝධී ලෙස ගුවන් සේවාවන්ට මැදිහත්වීම සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම ;

(ඇ) ගුවන් යානයකට හෝ පියසරයෙහි යෙදෙන ගුවන් යානයකට හෝ එරෙහිව නීති විරෝධී ලෙස මැදිහත්වීම් හා සම්බන්ධ තර්ජනයන්ට ප්‍රතිචාර දැක්වීම ;

(ඈ) ගුවන් යානකට හෝ ගගන යාත්‍රාංගනයෙහි ප්‍රදේශ තුළට හෝ ගගන නාවික සේවාවන් සැපයීම සිදු කෙරෙන වෙනත් යම් ප්‍රදේශයකට හෝ අවසර නොලත් පුද්ගලයන්ගේ ප්‍රවේශය වැලැක්වීම ;

(ඉ) ගගන යාත්‍රාංගන බලපත්‍රයක් නිකුත් කරනු ලැබ සිටින සේවා සපයන්නකුගේ කාර්යය ඉටු කිරීමේ දී සිදුවන හෝ සිදුවිය හැකි බවට තර්ජනයක් තිබෙන යම් නීති විරෝධී මැදිහත්වීම් පිළිබඳ වාර්තා කිරීම.

ගුවන් සේවා ආරක්ෂක සේවාවක් සපයන සේවා සැපයුම්කරුවකුගේ කාර්ය.

18. (1) ගගන යාත්‍රාංගනයක සීමාවන් ඇතුළත හෝ ගගන නාවික සේවා සපයනු ලබන වෙනත් යම් තැනක හෝ ස්ථානයක ගුවන් සේවා ආරක්ෂක සේවාවක් සපයන සහ පවත්වාගෙන යන සේවා සැපයුම්කරුවකු විසින් -

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවට අයත් දේපළ සහ ගගන යාත්‍රාංගන පරිහරණය කරන්නන් සතු දේපළ ආරක්ෂා කිරීම සහ

සුරක්ෂිත කිරීම ද, ගගන යාත්‍රාංගනයට ඇතුළුවන සහ එය පරිහරණය කරන තැනැත්තන් සහ ගගන යාත්‍රාංගන සීමාව ඇතුළත තිබෙන ගුවන් යානා සහ අනෙකුත් උපකරණවල නිරුපද්‍රිතතාව ආරක්ෂා කිරීම ද කළ යුතු ය ;

(ආ) ගගන යාත්‍රාංගනය ඇතුළත හෝ ගගන නාවික සේවා සපයනු ලබන වෙනත් යම් තැනක හෝ ස්ථානයක හෝ සිදුවන යම් නීති උල්ලංඝනය කිරීම් සහ හිරිහැර වැලැක්විය යුතු ය ;

(ඇ) ගගන යාත්‍රාංගනය ඇතුළත හෝ ගගන නාවික සේවා සපයනු ලබන වෙනත් යම් තැනක හෝ ස්ථානයක හෝ සිටින නොහික්මුණු සහ සැකසහිත පුද්ගලයන් අත්අඩංගුවට ගත යුතු ය ; සහ

(ඈ) ගගන යාත්‍රාංගනයේ හෝ ගගන නාවික සේවා සපයනු ලබන වෙනත් තැනක හෝ ස්ථානයක හෝ ඒවා භාවිත කරන්නන්ගේ සහ ගුවන් යානා ඇතුළු ඒ තුළ පිහිටි දේපළෙහි හෝ නිරුපද්‍රිතතාව සහ ආරක්ෂාව සම්බන්ධව, අවස්ථාවෝචිත පරිදි අධිකාරිය විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ සේවා සැපයුම්කරුට දෙනු ලබන යම් විධානයකට අනුකූලව කටයුතු කළ යුතුය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් කාර්ය ඉටු කිරීමේ දී ඒ සේවා සපයන්නකුගේ යම් සේවා නියුක්තිකයකු විසින් පහත සඳහන් තැනැත්තකු රඳවා තබා ගැනීම නීත්‍යනුකූල වන්නේ ය :-

(අ) මේ පනත යටතේ හෝ 1982 අංක 24 දරන ගුවන් යානාවලට එරෙහිව වූ වැරදි පනත යටතේ හෝ 1996 අංක 31 දරන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපලවල දී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩපැවැත්වීම පනත යටතේ හෝ වරදක් සිදු කරන හෝ සිදු කරමින් සිටින හෝ තැනැත්තකු ;

(ආ) මේ පනත යටතේ හෝ 1982 අංක 24 දරන ගුවන් යානාවලට එරෙහිව වූ වැරදි පනත යටතේ හෝ 1996 අංක 31 දරන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපලවල දී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩපැවැත්වීම පනත යටතේ හෝ වරදක් සිදු කිරීමට ආසන්න බවට යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ සැකයක් පවතින්නේද, එවැනි තැනැත්තකු ;

(ඇ) මේ පනත යටතේ හෝ 1982 අංක 24 දරන ගුවන් යානාවලට එරෙහිව වූ වැරදි පනත යටතේ හෝ 1996 අංක 31 දරන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපලවල දී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩපැවැත්වීම පනත යටතේ හෝ වරදක් සිදු කිරීමට ආධාර සහ අනුබල දුන් බවට යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ සැකයක් පවතින්නේද, එවැනි තැනැත්තකු ;

(ඇ) සොරකම් කරන ලද බවට හෝ වංචාකාරී අන්දමින් අත් කර ගන්නා ලද බවට හෝ සාධාරණ අන්දමින් සැක කළ හැකි දරුණු හෝ අන්තරායකාරී හෝ ආයුධ හෝ ද්‍රව්‍ය හෝ කිසිවක් පිළිගත හැකි හේතුවකින් තොරව, ගගන යාත්‍රාංගනයක් ඇතුළත දී හෝ ගගන නාවික සේවා සපයනු ලබන වෙනත් යම් තැනක් හෝ ස්ථානයක් ඇතුළත දී හෝ තමන් භාරයේ හෝ සන්තකයේ හෝ තබා ගෙන සිටින යම් තැනැත්තකු ;

(ඉ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනතේ 32 වන වගන්තිය යටතේ වරෙන්තුවක් රහිතව තැනැත්තකු අත්අඩංගුවට ගත හැකි ආකාරයේ වරදක් ගගන යාත්‍රාංගනයක් ඇතුළත දී හෝ යම් ගගන නාවික සේවා සපයනු ලබන වෙනත් යම් තැනක හෝ ස්ථානයක් ඇතුළත දී හෝ සිදු කරන යම් තැනැත්තකු ;

(ඊ) ගගන යාත්‍රාංගනයක් තුළ තිබෙන යම් දේපළක් සොරකම් කරන හෝ ඒ දේපළට හානි පමුණුවන යම් තැනැත්තකු ;

(උ) ශ්‍රී ලංකා ආණ්ඩුවට අයත් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුව සන්තකයේ පවතින හෝ ගගන යාත්‍රාංගනයක් තුළ හෝ ගගන නාවික සේවාවක් සපයනු ලබන වෙනත් යම් තැනක හෝ ස්ථානයක් තුළ හෝ ඇති යම් දේපළක් සොරකම් කළ බවට හෝ ඒ දේපළවලට හානි සිදු කළ බවට හෝ එසේ සොරකම් කිරීමට හෝ හානි සිදු කිරීමට ආසන්න බවට සැක කිරීමට හේතු පවතින තත්ත්වයන් මත ගගන යාත්‍රාංගනයක් තුළ හෝ ගගන නාවික සේවාවන් සපයනු ලබන වෙනත් තැනක හෝ ස්ථානයක් හෝ තුළ සිටියදී සොයා ගනු ලබන යම් තැනැත්තකු ;

(ඌ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනතේ අර්ථය තුළ ඇති සංඥෙය වරදක් හෝ මේ පනත යටතේ වරදක් හෝ 1982 අංක 24 දරන ගුවන් යානාවලට එරෙහිව වූ වැරදි පනත යටතේ වරදක් හෝ 1996 අංක 31 දරන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපලවල දී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩ පැවැත්වීම පනත යටතේ වරදක් හෝ සිදු කිරීමේ අදහසින් එවැනි ආරක්ෂක උපක්‍රම යොදන බවට විශ්වාස කිරීමට තරම් හේතු සහිත කරුණු යටතේ තමන් එහි සිටින බව වසන්කිරීමට ආරක්ෂක උපක්‍රම යොදමින් සිටියදී සොයා ගනු ලබන යම් තැනැත්තකු ; හෝ

(එ) ගුවන් යානය පියාසර කරමින් සිටියදී වරදක් කරනු ලැබූ බවට අණදෙන ගුවන් නියමුවාගේ ඉල්ලීම මත සොයා ගනු ලැබූ තැනැත්තකු.

(3) (2) වන උපවගන්තිය යටතේ රඳවා ගන්නා ලද යම් පුද්ගලයකු මුදා නොහරින්නේ නම් නීතියට අනුකූලව කටයුතු කිරීම සඳහා වහාම පොලිස් නිලධාරියකුට භාර දිය යුතු ය.

සෝදිසි කිරීමේ බලය.

**19.** යම් පුද්ගලයකු 1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනතේ අර්ථය තුළ වූ යම් සංඥේය වරදක් හෝ මේ පනත යටතේ වරදක් හෝ 1996 අංක 31 දරන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපලවල දී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩපැවැත්වීම පනත යටතේ වරදක් හෝ 1982 අංක 24 දරන ගුවන් යානාවලට එරෙහිව වූ වැරදි පනත යටතේ වරදක් හෝ සිදු කර ඇති බවට හෝ එසේ සිදු කිරීමට ආසන්න බවට හෝ විශ්වාස කිරීමට හේතු තිබෙන අවස්ථාවක ගගන යාත්‍රාංගන පරිශ්‍රය තුළ හෝ ගගන නාවික සේවාවන් සපයනු ලබන වෙනත් තැනක හෝ ස්ථානයක් ඇතුළත හෝ ඒ පුද්ගලයාට අයත් බඩු බාහිරාදිය සහ ඔහුට අයත් යම් වාහනයක් ද ඇතුළුව ඒ පුද්ගලයා සෝදිසි කිරීම ගුවන් සේවා ආරක්ෂක සේවාවක් සපයන්නා වූ සහ පවත්වාගෙන යන්නා වූ සේවා සැපයුම්කරුගේ සේවා නියුක්තිකයකු විසින් කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය:

එසේ වුවද කාන්තාවක් සෝදිසි කිරීම අවශ්‍ය වූ අවස්ථාවක දී විනීතභාවය කෙරෙහි පූර්ණ සැලකිල්ල දක්වමින් තවත් කාන්තාවක් විසින් එය කළ යුතු වන්නේ ය.

ගින්නක දී හෝ වෙන යම් ආපදාවක දී කටයුතු කළ යුතු ආකාරය.

**20.** ගගන යාත්‍රාංගනයක් තුළ හෝ ගගන නාවික සේවාවන් සපයනු ලබන වෙනත් යම් තැනක හෝ ස්ථානයක ගින්නක් හෝ වෙනත් ආපදාවක් හටගන්නා සෑම අවස්ථාවක දී ම එයින් අන්තරාභිමුඛයට පත් වන සියලු ම තැනැත්තන් සහ දේපළ ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය සියලු ම පියවර ගැනීම, එකී ගගන යාත්‍රාංගනය ඇතුළත හෝ ගගන නාවික සේවාවක් සපයනු ලබන වෙනත් යම් තැනෙහි හෝ ස්ථානයෙහි සේවයේ යෙදී සිටින, ගුවන් සේවා ආරක්ෂක සේවා සපයන්නා වූ සහ පවත්වාගෙන යන්නා වූ සේවා සැපයුම්කරුගේ සෑම සේවා නියුක්තිකයකුගේ ම වගකීම වන්නේ ය.

සේවා සපයන්නකු විසින් යොදා ගනු ලබන කාර්ය මණ්ඩලය සහ පාවිච්චි කරනු ලබන ගිනි අවි සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය අවශ්‍ය බව.

**21.** (1) ගුවන් සේවා ආරක්ෂක සේවාවක් සපයන්නා වූ සහ පවත්වාගෙන යන්නා වූ සේවා සැපයුම්කරුවකු, ඔහු සේවයේ යොදවා ගන්නා සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව සහ ඒ සේවාව සපයනු ලැබීමේ දී පාවිච්චි කරනු ලබන ගිනි අවි සහ යුද්ධෝපකරණවල ස්වභාවය, වර්ගය සහ ප්‍රමාණයට අදාළව අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගත යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කිරීමට පෙර ඒ සඳහා රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු අතර එසේ නිකුත් කරනු ලබන අවසර පත්‍රය ගුවන් සේවා කටයුතුවල නිරුපද්‍රිතතාවට අදාළව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන යම් නියමයන්ට යටත් විය යුතු ය.

මේ පනතේ මෙම කොටස යටතේ සද්භාවයෙන් සිදු කරනු ලබන ක්‍රියා සඳහා ආරක්ෂාව.

**22.** ගුවන් සේවා ආරක්ෂක සේවාවක් සපයන්නකු විසින් හෝ සේවා සපයන්නකුගේ කවර හෝ සේවා නියුක්තිකයකු විසින් හෝ මේ පනත යටතේ හෝ, ගගන යාත්‍රාංගනයක් ඇතුළත හෝ පිටත හෝ තැනැත්තන්ගේ හෝ දේපළවල නිරුපද්‍රිතතාව සහ ආරක්ෂාව සහතික කිරීමේ කාර්යය සඳහා සද්භාවයෙන් කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද හෝ නොකර හරින ලද හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ ගුවන් සේවා ආරක්ෂක සේවාව සපයන්නා වූ සේවා සපයන්නාට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ අධිකාරියට හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ එරෙහිව නඩු පැවරීමක් හෝ චෝදනා ඉදිරිපත් කිරීමක් හෝ නොකළ යුතු ය.

ආරක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.

**23.** (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් -

(අ) සිවිල් ගුවන් සේවාව සඳහා නඩත්තු කරනු ලබන හෝ හවුලේ පාවිච්චි කිරීමේ පදනමක් මත නඩත්තු කරනු ලබන හෝ ගගන යාත්‍රාංගනයකට ;

(ආ) ගගන නාවික ආධාර සැපයීම සඳහා වූ උපකරණ ස්ථාපනය කර ඇති යම් ස්ථානයකට ; හෝ

(ඇ) 14 වන වගන්තිය යටතේ ගගන යාත්‍රාංගනයක් පිහිටුවීම සඳහා ප්‍රධාන සැලැස්මක් අනුමත කර ඇති යම් ප්‍රදේශයකට,

යාබදව හෝ සමීපව හෝ ඇති යම් භූමි ප්‍රදේශයක් මේ පනතේ කාර්ය සඳහා ආරක්ෂිත ප්‍රදේශයක් වශයෙන් (මේ පනතේ මින් මතු ආරක්ෂිත ප්‍රදේශයක් වශයෙන් සඳහන් කරනු ලබන) ප්‍රකාශයට පත් කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක, භූමි ප්‍රදේශයේ හෝ ඒ භූමි ප්‍රදේශයට ඇතුළත් එක් එක් ඉඩම්වල හෝ ප්‍රමාණය, වරිපණම් අංකය හෝ මිනුම් සහ මායිම් හෝ විස්තර කර දක්වා තිබිය හැකි ය.

(3) ආරක්ෂිත ප්‍රදේශයක ඉඩම් පරිහරණය කිරීමට අදාළ වූ ද ගුවන් යානා ඉගිලුම් සහ ගොඩබැස්වීම් නිරුපද්‍රිතව සිදු කිරීම සඳහා ආරක්ෂාව සැලැස්වීම පිණිස රක්ෂිත ප්‍රදේශ තුළ රක්ෂිත කලාප පිහිටුවීමට අදාළ ඉගිලුම සහ ගොඩබැස්වීම සඳහා ගුවන් අවකාශයෙහි නිරුපද්‍රිතතාවට අදාළ වූ ද පරිසරය ආරක්ෂා කිරීමට අදාළ සහ ගගන යාත්‍රාංගනයෙන් පිටත ප්‍රභවයන්ගේ ඉලෙක්ට්‍රොනික හෝ වෙනත් බාධාකිරීම් වලින් සිවිල් ගුවන් සේවා කටයුතු ආරක්ෂා කිරීමට අදාළ වූ ද උපදෙස්, විධාන හෝ කාර්ය පටිපාටි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගගන නාවික ආධාර සැපයීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති යම් සේවා සපයන්නකු වෙත නිකුත් කළ යුතු ය.

(4) ආරක්ෂිත ප්‍රදේශයක් ඇතුළත ගොඩනැගිලි හෝ වෙනත් ඉදිකිරීම් හෝ කිසිවක් ඉදිකිරීම හෝ පවතින ගොඩනැගිලි හෝ වෙනත් ඉදිකිරීම් හෝ කිසිවක වෙනස්කම් සිදු කිරීම හෝ සම්බන්ධයෙන් ගගන යාත්‍රාංගනයක හෝ ගුවන් මාර්ගයක හෝ අවට පිහිටි පැහැදිලි ආලෝක කිරීම් සහ සලකුණු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු නියමයන් දැක්වෙන උපදෙස්, විධාන සහ කාර්ය පටිපාටි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කවර විධිවිධානයක් තිබුණද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ මිස කිසිම තැනත්තකු හෝ අධිකාරියක් හෝ විසින් ආරක්ෂිත ප්‍රදේශයක් ඇතුළත යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් ඉදිකිරීම් ගොඩනැගීම සඳහා හෝ පවතින යම් ගොඩනැගිල්ලක හෝ ඉදි කිරීමක හෝ වෙනසක් සිදු කිරීම සඳහා හෝ අවසර දීම නොකළ යුතුය. එවැනි අවසර පත්‍රයක් ලබා නොගෙන යම් ගොඩනැගිල්ලක් ගොඩනගනු ලැබ තිබේ නම් හෝ වෙනසක් සිදුකරනු ලැබ තිබේ නම්, අවස්ථාවෝචිත පරිදි ඒ ගොඩනැගිල්ල හෝ සිදුකරන ලද වෙනස, ඒ හිමිකරුගේ වියදමින් කඩා ඉවත් කිරීමේ බලය අධිකාරිය සතු විය යුතු ය.

**24.** (1) ආරක්ෂිත ප්‍රදේශයක් තුළ පිහිටි රජයට අයත් ඉඩමක් හැර වෙනත් යම් ඉඩමක් මේ පනතේ යම් කාර්යයක් සඳහා අධිකාරියට අවශ්‍ය වන්නේ නම් සහ යෝජිත අත්පත් කර ගැනීම අමාත්‍යවරයා

ආරක්ෂිත ප්‍රදේශයක ඉඩම් අත්පත් කර ගැනීම.

විසින් අනුමත කරනු ලබන්නේ නම්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ඒ සඳහා අදාළ කර ගැනීම සඳහා, එසේ අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම පොදු කාර්යයක් සඳහා අවශ්‍ය වී ඇති බවට සලකා එය ඒ පනත යටතේ අත්පත් කර ගෙන අධිකාරියට පවරා දිය හැකි ය.

(2) අධිකාරිය වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් අවස්ථාවෝචිත පරිදි අධිකාරියේ අරමුදලෙන් ගෙවිය යුතු ය.

බලපත්‍ර දරන්නන් විසින් උපදෙස් නිකුත් කිරීම.

**25.** මේ පනතේ මේ කොටස යටතේ බලපත්‍රයක් ලැබී ඇති සේවා සැපයුම්කරුවකු විසින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව සහ ඒ සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි අමාත්‍යවරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ නිකුත් කරනු ලැබිය හැකි යම් විධානවලට ද යටත්ව, ඒ සේවා සැපයුම්කරු විසින් ඒ බලපත්‍රය යටතේ සපයනු ලබන ගගන නාවික සේවා පරිහරණය කරන්නන්ට උපදෙස් දීම නීත්‍යනුකූල වන්නේය. ඒ උපදෙස්වලට අනුකූලව ක්‍රියා කිරීම ඒ ගගන නාවික සේවා පරිහරණය කරන සියලු ම තැනැත්තන්ගේ කාර්යය වන්නේ ය.

බලපත්‍ර අත්හිටුවීම සහ අවලංගු කිරීම.

**26.** (1) මේ පනතේ මෙම කොටස යටතේ සේවා සැපයුම්කරුවකු වෙත නිකුත් කරනු ලබන බලපත්‍රයක් එය නිකුත් කරන ලද අවස්ථාවෝචිත පරිදි අධිකාරිය විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පහත දැක්වෙන හේතු මත, එනම්—

(අ) (i) බලපත්‍රයේ කොන්දේසි සහ නියමයන්ට ;

(ii) මේ පනතේ යම් විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන යම් නියෝගවලට හෝ රීතිවලට ; හෝ

(iii) අවස්ථාවෝචිත පරිදි අමාත්‍යවරයා, අධිකාරිය හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ විසින් නිකුත් කරන ලද යම් උපදෙස් හෝ විධාන කිසිවකට,

අනුකූලව කටයුතු නොකිරීම හෝ එසේ කටයුතු කිරීම ප්‍රතික්ෂේප කිරීම ;

(ආ) ගෙවිය යුතුව ඇති ගාස්තු හෝ අයකිරීම් හෝ කිසිවක් නොගෙවා සිටීම ; හෝ

(ඇ) අවස්ථාවෝචිත පරිදි අධිකාරිය විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ තීරණය කරනු ලබන, බලපත්‍රය යටතේ සපයනු ලබන සේවා සුමට ලෙස මෙහෙයවීම කෙරෙහි ද, එවැනි මෙහෙයුමක නිරුපද්‍රිතතාව කෙරෙහි ද බලපෑ හැකි වෙනත් යම් හේතු කිසිවක් මත,

අත්හිටවනු ලැබිය හැකි ය ; නැතහොත් අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අත්හිටුවීමක් තුන් මාසයකට වැඩි කාලයක් සඳහා නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අත්හිටුවන ලැබ සිටින හෝ අවලංගු කරනු ලැබ සිටින හෝ සේවා සැපයුම්කරුවකුට ඒ අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට හෝ විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාහට අභියාචන කළ හැකි අතර එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් ලේකම්වරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක වන්නේ ය. තව ද එම තීරණයට විරුද්ධව කිසිම උසාවියක් වෙත හෝ විනිශ්චය සභාවක් වෙත හෝ අභියාචනය කළ නොහැකි වන්නේ ය.

බලපත්‍රයක් අත්හිටුවා ඇති කාලය තුළ ගගන නාවික සේවා සැපයීම.

**27.** (1) යම් ගගන නාවික සේවා සැපයීම සඳහා යම් සේවා සැපයුම්කරුවකුට නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් අත්හිටුවනු ලබන අවස්ථාවක, එකී අත්හිටුවා ඇති කාලය තුළ —

(අ) එකී සේවා සැපයුම්කරු විසින් සපයනු ලැබූ ගගන නාවික සේවා සැපයීම දිගට ම පවත්වාගෙන යාම ; සහ

(ආ) අත්හිටුවනු ලැබූ බලපත්‍ර නිකුත් කිරීමේ සිට එකී සේවා සැපයුම්කරු විසින් ඇතුළත් වී ඇති යම් ගිවිසුම්වලින් පැන නගින ගිවිසුම් බැඳීම් සහ අයිතීන් දිගට ම පවත්වාගෙන යාම,

අධිකාරියේ කාර්යය වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කාල පරිච්ඡේදය තුළ අධිකාරිය විසින් ගගන නාවික සේවා සැපයීමේ දී, බලපත්‍රය අත්හිටුවනු ලැබූ සේවා සැපයුම්කරුගේ යම් සේවා නියුක්තිකයකුගේ අයිතීන් සහ කාර්යයන්ට අදාළව, රැකියා ගිවිසුමේ පටහැනිව කුමක් තිබුණද, සහ එවැන්නකුට අගතියක් නොවන පරිදි අධිකාරිය විසින් එකී සේවා නියුක්තිකයන්ගේ සේවා ලැබගැනීම කළ හැකි අතර, වෙනත් සේවා සැපයුම්කරුවකුගේ සේවා ලබා ගැනීම ද කළ හැකි වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කොට ඇති සේවාවන් ලබා ගැනීම සඳහා අවශ්‍යවන්නා වූ යම් ගෙවීමක් හෝ ගාස්තුවක් අධිකාරිය විසින් ස්වකීය අරමුදලින් ගෙවිය යුතු ය.

බලපත්‍රයක් අවලංගු කිරීමේ දී ගගන නාවික සේවා ආදිය සැපයීම.

28. (1) යම් සේවා සැපයුම්කරුවකුට නිකුත් කරනු ලැබූ ගගන නාවික බලපත්‍රයක් 26 වන වගන්තිය යටතේ අවලංගු කළ අවස්ථාවක, අධිකාරිය විසින් එකී අවලංගු කිරීම පිළිබඳව අනෙකුත් සේවා සැපයුම්කරුවන් වෙත වහා ම දැනුම් දිය යුතු අතර, එකී සේවා සැපයුම්කරු සමග යම් ගිවිසුමකට හෝ කොන්ත්‍රාත්තුවකට ඇතුළත් වූ සෑම තැනැත්තකු විසින් ම එකී ගිවිසුම හෝ කොන්ත්‍රාත් සියල්ලෙහි සහ එකී ගිවිසුම් හෝ කොන්ත්‍රාත්තු යටතේ ඉටු කිරීම සඳහා ඉතිරිව ඇති බැඳියාවන්වල ද විස්තර අධිකාරිය වෙත සැපයීම එකී සෑම තැනැත්තකුගේ ම කාර්යය වන්නේ ය.

(2) යම් ගගන නාවික සේවා සැපයීම සඳහා සේවා සැපයුම්කරුවකුට නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් අවලංගු කළ විටක දී. ජාතියේ යහපත සහ ශ්‍රී ලංකාවේ ගුවන් සේවා කර්මාන්තයේ යහපත ද තකා එකී ගගන නාවික සේවා සැපයීම සඳහා වෙනත් සේවා සැපයුම්කරුවකුට බලපත්‍රයක් නිකුත් කළ යුතු බව අධිකාරියේ මතය වන අවස්ථාවක:

(අ) බලපත්‍රය අවලංගු කරනු ලැබූ සේවා සැපයුම්කරු විසින් සපයනු ලැබූ සේවාව හෝ සේවාවන් දිගටම කරගෙන යාමේ කාර්යය සඳහා වෙනත් සේවා සැපයුම්කරුවකු වෙත අලුත් බලපත්‍රයක් නිකුත් කරන තෙක්, එකී ගගන නාවික සේවාව හෝ සේවා සැපයීම දිගට ම කරගෙන යාම සහතික වීම ;

(ආ) අලුත් බලපත්‍රයක් හෝ බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ යම් වෙනත් සේවා සැපයුම්කරුවකුට හෝ සේවා සැපයුම්කරුවන්ට ද, එකී වෙනත් සේවා සැපයුම්කරු හෝ සේවා සැපයුම්කරුවන් හට, එසේ නිකුත් කරනු ලැබූ අලුත් බලපත්‍ර යටතේ ගගන නාවික සේවා සැපයීමට හැකිවන පරිදි, බලපත්‍රය අවලංගු කරනු ලැබූ සේවා සැපයුම්කරුට ප්‍රයෝජනය සඳහා ලබාදුන් සියලු දේපළ එකී වෙනත් සේවා සැපයුම්කරුට හෝ සැපයුම්කරුවන්ට ලබා දීම ; සහ

(ඇ) බලපත්‍රය අවලංගු කරනු ලැබූ සේවා සැපයුම්කරු විසින් ඇතුළත් ව තිබිය හැකි වූ යම් ගිවිසුම්වලින් පැන නගින සියලු ගිවිසුම්ගත බැඳීම් හෝ අයිතීන් ඉටු කිරීම ගුවන් සේවා කර්මාන්තයේ යහපත සඳහා අවශ්‍ය බව, අධිකාරියේ මතය වන අවස්ථාවක, එකී සියලු ගිවිසුම්ගත බැඳීම් සහ අයිතීන් අලුත් බලපත්‍රය හෝ බලපත්‍ර නිකුත් කරනු ලැබුවේ යම් සේවා සැපයුම්කරුවකුට හෝ සැපයුම්කරුවන්ට ද එකී සේවා සැපයුම්කරු හෝ සේවා සැපයුම්කරුවන් විසින් ඉටු කරන බව සහතික වීම,

අධිකාරියේ වගකීම වන්නේ ය.

**29.** සේවා සැපයුම්කරුවකුට නිකුත් කර ඇති බලපත්‍රයක් අත්හිටුවනු ලැබූ කාලය තුළ ඒ සේවා සැපයුම්කරුට, මේ පනතේ 8 වන වගන්තිය යටතේ ප්‍රයෝජනය සඳහා ලබාදෙන ලද කිසිම දේපළකට ප්‍රවේශය නොලැබෙන අතර, බලපත්‍රයක් අවලංගු කරන ලද අවස්ථාවක දී, සේවා සැපයුම්කරුට ප්‍රයෝජනය සඳහා ලබාදෙන ලද සියලුම දේපළ අධිකාරිය වෙත පවරනු ලැබිය යුතු ය. තව ද අධිකාරිය විසින්, ඒ දේපළ අවලංගු කරන ලද බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් ගගන නාවික සේවාවක් සැපයීම සඳහා ද ඒ ගගන නාවික සේවාව සැපයීම සඳහා 28 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ වෙනත් යම් සේවා සැපයුම්කරුවකුට හෝ සේවා සැපයුම්කරුවන්ට ලබා දිය හැකි වන්නේ ය.

බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම මත පවරා දෙනු ලබන දේපළ කෙරෙහි වූ බලපෑම.

**30.** එසේ කිරීම යෝග්‍ය යයි හෝ අවශ්‍ය යයි හෝ අධිකාරිය සලකන විටෙක 31 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති යම් ගගන නාවික සේවා වර්ගයක් අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව අධිකාරිය විසින් ම සැපයීම වැළැක්වීම මේ පනතෙහි මේ කොටසෙහි ඉහත විධිවිධානවල අඩංගු කිසිවකින් සිදු නොවිය යුතු ය :

එසේ වුව ද, ඒ ගගන නාවික සේවාව, ඒ සේවාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ පනතේ මේ පරිච්ඡේදය යටතේ බලපත්‍රයක් නිකුත් කළ යුතු යයි නියමිතව ඇති සේවාවක් වන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එකඟත්වය ඇතිව පමණක් අධිකාරිය විසින් ඒ සේවාව සැපයිය යුතු ය.

ගගන නාවික සේවා සැපයීම සඳහා අධිකාරියට බලය ඇති බව.

**31.** මේ පනතේ කාර්ය සඳහා "ගගන නාවික සේවාව" යන්නෙන්—

"ගගන නාවික සේවාව" යන්නෙහි අර්ථ නිරූපණය.

(අ) 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ජාත්‍යන්තර ගගන යාත්‍රාංගන වශයෙන් වර්ගීකරණය කරනු ලබන ගගන යාත්‍රාංගන සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම ;

(ආ) (අ) ඡේදයේ සඳහන් කොට ඇති ගගන යාත්‍රාංගන නොවන වෙනත් ගගන යාත්‍රාංගන සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සහ එකී ගගන යාත්‍රාංගනවල දී ගගන යාත්‍රාංගන පහසුකම් සැලසීම ;

(ඇ) ගගන යාත්‍රාංගනයන්හි, සෝදිසි කිරීමේ, මුදා ගැනීමේ සහ ගිනි නිවීමේ සේවාවන් සැපයීම සහ පවත්වාගෙන යාම ;

(ඈ) ගුවන් සේවා ආරක්ෂක සේවාවක් සැපයීම සහ පවත්වාගෙන යාම ;

(ඉ) ගුවන් ගමන් සේවා සැපයීම ;

(ඊ) ගගන නාවික තොරතුරු සේවා සැපයීම ;

(උ) ගගන නාවික සංදේශන සේවා සැපයීම ;

(ඌ) සංදේශනය, ගුවන් සංතරණය සහ සෝදිසිය සඳහා ගගන නාවික ආධාරක සැපයීම ;

(එ) ගුවන් යානාවලට අවශ්‍ය ඉන්ධන සහ ස්නේහක සැපයීමට අදාළ සේවා සැපයීම ;

(ඒ) ගුවන් යානා පිරිසිදු කිරීමේ සේවාවන් ඇතුළුව, ඒප්‍රනය මත ගුවන් යානා පිටත් කරවීමට අවශ්‍ය සහාය හෝ උපකරණ හෝ සැපයීම ;

(ඔ) ගුවන් යානා සඳහා බිම් මෙහෙවර පහසුකම් හෝ සේවාවන් හෝ සැපයීම ;

(ඕ) ගුවන් යානාවලට ආහාර සැපයීමේ සේවාවන් සැපයීම ; සහ

(ක) ඉහත නිශ්චිතව දක්වා ඇති සේවාවන් හැර යම් වෙනත් සේවාවන් ගුවන් යානාවලට සැපයීම,

අදහස් වේ.

## 111 වන පරිච්ඡේදය

## සිවිල් ගුවන් සේවා විධිමත් කිරීම

විදේශ යුද හෝ රාජ්‍ය ගුවන් යානා ඇතුල්වීම.

**32.** (1) ඒ සඳහා රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ විශේෂ අවසරය හෝ අනුමැතිය නොලබා කිසිදු විදේශීය යුද හෝ රාජ්‍ය ගුවන් යානයක් ශ්‍රී ලංකා භූමි ප්‍රදේශයට ඇතුළුවීම නො කළ හැකිවේ.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විශේෂ අවසරයක් හෝ බලය පැවරීමක් හෝ රහිතව කිසිම විදේශ සිවිල් ගුවන් යානයකට ශ්‍රී ලංකා භූමි ප්‍රදේශයට ඇතුළු විය හැකි නොවිය යුතු ය.

33. සිවිල් ගුවන් යානාවල ආරක්ෂාව, නිරුපද්‍රිතතාව සහ අන්තර් ප්‍රතිග්‍රාහක කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අන්තර් ජාතික බැඳීම් සපුරාලීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් ආරක්ෂක කටයුතු විෂයයභාර අමාත්‍යවරයා විමසා රාජ්‍ය සහ යුද ගුවන් යානා මෙහෙයවීම් සම්බන්ධීකරණය කළ යුතු ය.

ආරක්ෂක අමාත්‍යවරයා විමසා මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.

34. (1) සන්නද්ධ අරගලයක් නියම වශයෙන් හෝ ආසන්න වශයෙන් හෝ පවත්නා කාලයක දී හෝ සම්මුතියේ නියම කර ඇති නියමයන්ට අනුකූලව දැනුම් දීමක් කර ඇති ජාතික හදිසි අවස්ථාවක දී සාමාන්‍ය හෝ විශේෂ හෝ නියෝගයක් මගින්, සියලු ම ගුවන් යානා හෝ යම් විස්තරයකට අයත් ගුවන් යානා හෝ ශ්‍රී ලංකා භූමි ප්‍රදේශය තුළ හෝ ඊට ඉහළින් හෝ ඉන් කොටසක හෝ ගුවන් සංතරණයෙහි යෙදීම විධිමත් කිරීම හෝ එසේ ගුවන් සංතරණයෙහි යෙදීම සම්පූර්ණයෙන් හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කොන්දේසි කිසිවකට යටත්ව හෝ තහනම් කිරීම ආරක්ෂක කටයුතු විෂයභාර අමාත්‍යවරයාට කළ හැකි වන්නේ ය. ඉන් අනතුරුව අමාත්‍යවරයා විමසා ආරක්ෂක කටයුතු විෂයභාර අමාත්‍යවරයා විසින් යම් පසු නියෝගයක් මගින්, එකී කාර්යය සඳහා පමණක් යම් ගගන යාත්‍රාංගනයක්, ගොඩබැස්සවීමේ භූමියක්, ගුවන් යානයක්, ගුවන් යානා නිෂ්පාදනය කිරීමේ හෝ නඩත්තු කිරීමේ පහසුකමක්, යන්ත්‍රෝපකරණ, යන්ත්‍රාගාර, ද්‍රව්‍ය හෝ ඒ තුළ හෝ ඒ මත තිබෙන වෙනත් සියලු දේ සමග සන්නද්ධ හමුදා භාරයට ගෙන පාවිච්චි කිරීමට සහ යම් ගගන යාත්‍රාංගනයක්, පියසර පුහුණු පාසලක් හෝ ගොඩබැස්සවීමේ භූමියක් භාවිත කිරීම, ඉදිකිරීම, ගොඩනැගීම, පවත්වා ගෙන යාම හෝ ස්ථාපනය කිරීම විධිමත් කිරීමට හෝ තහනම් කිරීමට ද බලය දෙනු ලැබිය හැකි ය.

හදිසි අවස්ථා සම්බන්ධ විශේෂ බලතල.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියෝගයක් ක්‍රියාත්මක වීමේ හේතුවෙන් සෘජු අලාභයක් විඳීමට සිදුවන තැනැත්තකුට පාර්ලිමේන්තුව විසින් ඒ කාරණය සඳහා සපයනු ලබන මුදලින් ආරක්ෂක කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගෙන් වන්දි ලබා ගැනීමට හිමිකම තිබිය යුතු ය. සම්බන්ධිත පාර්ශ්ව අතර පැවති ගිවිසුම කඩකිරීම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල් ප්‍රමාණය පාර්ශ්වකරුවන් විසින් එකඟවනු ලබන බේරුම්කරුවකු විසින් නියම කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශයට ඉහළින් හෝ ඉන් කොටසකට ඉහළින් ගුවන් සංතරණය තහනම් කරමින් මේ වගන්තිය යටතේ කරනු ලබන සාමාන්‍ය නියෝගයක් ක්‍රියාත්මකවීමේ හේතුවෙන් කිසිම වන්දියක් නොගෙවිය යුතු ය.

ගුවන් සේවා කටයුතුවල නිරතවන පුද්ගලයන්ට පනවනු ලබන සීමා කිරීම.

**35.** ගුවන් සේවා කටයුතුවල නිරතවන තැනැත්තකු වශයෙන් ඔහුගෙන් නියමිත කාර්යය ඉටු කිරීමේ දී, ඒ මගින් රාජ්‍යයෙහි සිවිල් ගුවන් යානා මෙහෙයුම්වල නිරුපද්‍රිතතාව කෙරෙහි බලපෑමක් ඇති කරවන යම් තැනැත්තකු විසින් මිනිස් ක්‍රියාකාරිත්වයට හානි සිදු කරවන ද්‍රව්‍යයක් පාවිච්චි කර, එහි බලපෑම යටතේ ඔහුගේ කාර්යය ඉටු නොකළ යුතු අතර, ඔහුගේ කාර්යය නිරුපද්‍රිතව ඉටු කිරීමට නොහැකි විය හැකි අන්දමේ වෙනත් ද්‍රව්‍ය භාවිතයෙන් ද වැලකී සිටිය යුතු ය.

ගුවන් යානයක් පරීක්ෂා කිරීම.

**36.** ගුවන් යානයක් ශ්‍රී ලංකාව ඇතුළත තිබෙන අතරතුර, ඒ ගුවන් යානය ගුවන් යෝග්‍යතාවය සහිත බවටත් එය නියමිත ලේඛන සහිතව සිටින බවට සහ එය, පනතෙහි විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීති හෝ ඒ යටතේ නිකුත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවලට අනුකූලව මෙහෙයුම් කෙරෙන බවටත් සහතිකවීමේ කාර්යය සඳහා ඊට ප්‍රවේශවීමේ සීමාරහිත බලයක් අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිසි පරිදි බලය පවරන ලද යම් පුද්ගලයකුට හෝ තිබිය යුතු ය.

පියසැරියක් වැලැක්වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකි බව.

**37.** අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඔහු විසින් නිසි පරිදි බලය පවරන ලද තැනැත්තකුට හෝ -

(අ) ගුවන් යානය , ගුවන් යෝග්‍යතාව රහිත යානයක් වීම ;

(ආ) සේවක පිරිස අවශ්‍ය සුදුසුකම් නොමැති අයවීම හෝ ඔවුන් කායික වශයෙන් හෝ මානසික වශයෙන් හෝ පියසරය මෙහෙයවීමේ හැකියාව නොමැති අය වීම ;

(ඇ) මෙහෙයුමේ හේතුවෙන් පුද්ගලයන්ට හෝ දේපළ කිසිවකට අනතුරක් වීමට ආසන්න බව ; හෝ

(ඈ) ගුවන් යානය සඳහා අනුමත කරන ලද පිටත් කරවීමේ කාර්ය පටිපාටියක් නොතිබීම හෝ එය අනුමත කරන ලද පිටත් කරවීමේ කාර්ය පටිපාටියකට අනුකූලව පිටත් කරවා නොතිබීම ,

යන තත්ත්වයන් පවතින බවට විශ්වාස කිරීමට තරම් ප්‍රමාණවත් හේතු ඇති අවස්ථාවන් හි දී, යම් ගුවන් යානයක් මෙහෙයුම් නොකරන ලෙස ඒ ගුවන් යානයේ මෙහෙයුම්කරුට හෝ එහි සේවක පිරිසට හෝ විධාන කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිසි පරිදි බලය පවරන ලද එකී තැනැත්තාට

තිබිය යුතු ය. තව ද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් නිසි පරිදි බලය පවරන ලද තැනැත්තා විසින් හෝ එවැනි අවස්ථාවක ඒ ගුවන් යානය හෝ එහි සේවක පිරිස හෝ රඳවා තබා ගැනීමට අවශ්‍ය සෑම පියවරක් ම ගත යුතු ය.

තැනැත්තන්ට හෝ දේපළවලට හෝ සිදුවිය හැකි අනතුරක් හෝ තර්ජනයක් හෝ වැළැක්වීමේ ක්‍රියාමාර්ග.

38. (1) යම් නිශ්චිත ගුවන් යානයක් හෝ ඒ වර්ගයට අයත් සියලු ම ගුවන් යානා හෝ මෙහෙයවීම හෝ යම් නිශ්චිත ගුවන් යානා සංඝටකයක් හෝ ඒ වර්ගයට අයත් යම් සංඝටකයක් හෝ යම් ගගන යාත්‍රාංගනයක් හෝ පාවිච්චි කිරීම හෝ යම් ගගන නාවික සේවාවක් සැපයීම හෝ හේතුවෙන් යම් පුද්ගලයකුට හෝ යම් පුද්ගලයකුගේ දේපළ කිසිවකට හෝ අනතුරක් සිදු විය හැකි බව ද එවැනි අනතුරක් හෝ තර්ජනයක් හෝ වලක්වාලීමට හෝ මගහැරවීමට ඉක්මන් ක්‍රියා මාර්ගයක් ගත යුතු බව ද සාධාරණ හේතු පදනම් කරගෙන අධ්‍යක්ෂ ජනරාල්වරයා විශ්වාස කරන අවස්ථාවක, මේ පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍රයක, අවසර පත්‍රයක හෝ සහතික පත්‍රයක හෝ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් -

(අ) යම් නිශ්චිත ගුවන් යානයක් හෝ ඒ වර්ගයට අයත් යම් ගුවන් යානයක් හෝ, එවැනි ගගන යාත්‍රාංගනයක් හෝ මෙහෙයුම් කිරීම නැතහොත් එවැනි ගගන නාවික සේවාවක් සැපයීම අත්හිටුවීම, තහනම් කිරීම හෝ ඒ සඳහා කොන්දේසි පනවනු ලැබීම හෝ කළ හැකි ය ;

(ආ) යම් නිශ්චිත ගුවන් යානා සංඝටකයක් හෝ ඒ වර්ගයට අයත් සංඝටක කිසිවක් හෝ පාවිච්චි කිරීම අත්හිටුවීම, තහනම් කිරීම හෝ ඒ සඳහා කොන්දේසි පනවනු ලැබීම හෝ කළ හැකි ය.

(ඇ) එවැන්නක් මෙහෙයුම් කිරීම හෝ පාවිච්චි කිරීම හෝ වලක්වාලීම සඳහා යම් නිශ්චිත ගුවන් යානයක් රඳවා ගැනීම හෝ යම් නිශ්චිත ගුවන් යානා සංඝටකයක් තහනමට අල්ලා ගැනීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සිදු කරනු ලබන යම් රඳවා ගැනීමක් හෝ තහනමට අල්ලා ගැනීමක් හෝ පිළිබඳව අවස්ථාවෝචිත පරිදි ගුවන් යානයේ හෝ සංඝටකයේ හෝ අයිතිකරුට, මෙහෙයුම්කරුට හෝ සේවා සැපයුම්කරුට හෝ වහාම දැනුම් දිය යුතු ය.

## IV වන පරිච්ඡේදය

### ගුවන් යානා ලියාපදිංචි කිරීම සහ සලකුණු කිරීම

ලියාපදිංචි කර ඇත්නම් මිස ගුවන් යානයක් පියාසර නොකළ යුතු බව.

**39.** යම් ගුවන් යානයක් –

(අ) ශ්‍රී ලංකාවේ ; හෝ

(ආ) සම්මුතියට පාර්ශ්වකරුවකු වන රාජ්‍යයක ; හෝ

(ඇ) යම් රාජ්‍යයක ලියාපදිංචි කර ඇති ගුවන් යානාවන්ට ශ්‍රී ලංකා භූමි ප්‍රදේශය තුළ හෝ ඊට ඉහළින් හෝ පියාසර කිරීමට විධිවිධාන සලස්වා ඇති බලපවත්නා ගිවිසුමකට ශ්‍රී ලංකා රජය, ඒ රාජ්‍යය සමග බැඳී ඇත්නම්, එවැනි රාජ්‍යයක; හෝ

ලියාපදිංචි කර ඇත්නම් මිස, ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය ඇතුළත හෝ ඊට ඉහළින් හෝ පියාසර නොකළ යුතු ය.

අත්හදා බැලීම් පියසර හෝ පරීක්ෂණ පියසර.

**40.** 39 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, ඒ විධිවිධාන නොසලකා, ඒ වගන්තියෙන් නියමිත පරිදි ලියාපදිංචි කර නොමැති ගුවන් යානයකට වුව ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ ශ්‍රී ලංකා භූමි ප්‍රදේශය තුළ හෝ ඊට ඉහළින් හෝ පියාසර කිරීමට අවසර දිය හැකි ය. අධ්‍යක්ෂ ජනරාල්වරයාට එවැනි අවසර පත්‍රයක් නිකුත් කළ හැක්කේ ඒ පියසරය සිදු කෙරෙන්නේ යම් අත්හදා බැලීම් හෝ පරීක්ෂණ හෝ කාර්යයක් සඳහා හෝ එවැන්නකට අදාළ කරුණක් සඳහා නම් හෝ එසේත් නැතහොත් ලියාපදිංචි කිරීමකින් තොරව පියාසර කිරීමට අවසර දීම සඳහා ප්‍රමාණවත් බවට අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන වෙනත් කාරණයක් සඳහා නම් හෝ පමණකි. එසේ වුව ද එවැනි අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසි හෝ සීමා කිරීම් හෝ කිසිවකට අනුකූලව ගුවන් යානය පියාසර කළ යුතු ය.

ගුවන් යානා ලියාපදිංචි කිරීම.

**41.** (1) වෙනත් යම් රාජ්‍යයක ගුවන් යානා නාම ලේඛනයක දැනට ලියාපදිංචිවී නැති සහ නම ඇතුළත් කොට නොමැති ගුවන් යානයක් පහත සඳහන් අවශ්‍යතා සපුරන අවස්ථාවක, ශ්‍රී ලංකාවේ ලියාපදිංචිවීමට සුදුසුකම් ලබන්නේ ය—

(අ) එය ශ්‍රී ලංකාවේ පුරවැසියකුට හෝ සංස්ථාවකට හෝ ශ්‍රී ලංකාවේ නීතියක් මගින් සංස්ථාගත පුද්ගල මණ්ඩලයකට හෝ අයිති වීම හා ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව තුළ පිහිටීම;

(ආ) රාජ්‍ය ගුවන් යානයක් සම්බන්ධයෙන් වන කල්හි එහි සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජය හෝ කිසියම් රාජ්‍ය සංස්ථාවක් හෝ සතුව පැවතීම; හෝ

(ඇ) බද්දට ගත් ගුවන් යානයක් සම්බන්ධයෙන් වන විට, එය, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් හිමි, එමෙන්ම සිය ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන ගුවන් යානා මෙහෙයුම්කරුවකු විසින් තනිකරම මෙහෙයුම් කරන්නක් වීම.

(2) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද කිසියම් ගුවන් යානයක අයිතිය, එය ලියාපදිංචි කිරීමෙන් පසුව, වෙනස්වන අවස්ථාවක එවැනි වෙනස්වීමක් පිළිබඳව වහාම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම්දීමත්, 42 වන වගන්තිය යටතේ නිකුත් කළ ලියාපදිංචි කිරීමේ සහතිකය අධ්‍යක්ෂ ජනරාල්වරයා හට භාරදීමත් එම ලියාපදිංචි කිරීමේ සහතිකය දරන්නාගේ වගකීම වන්නේ ය.

ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඉල්ලුම් කිරීම සහ නිකුත් කිරීම.

**42.** (1) 41 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ඇති යම් ගුවන් යානයක හිමිකරුවකුට හෝ මෙහෙයුම්කරුවකුට එවැනි ගුවන් යානයක් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීම සඳහා, නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම් පත්‍රයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ හැකි අතර, එම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් තොරතුරු අනුව අදාළ ගුවන් යානය ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට සෑහීමකට පත්විය හැකි නම් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එය ලියාපදිංචි කළ හැකි ය.

(2) යම් ගුවන් යානයක් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ විට අධ්‍යක්ෂ ජනරාල්වරයා ඊට නියමිත ගාස්තුව අයකර ගැනීමෙන් පසු, ඒ සඳහා අවස්ථානුකූලව ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කර, අදාළ ගුවන් යානය වෙනුවෙන් ජාතිකත්වය හඳුනාගැනීමේ ලකුණක් සහ ගුවන් යානයට විශේෂිත වූ ලියාපදිංචි කිරීමේ සලකුණක් වෙන් කර දිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සහතිකයක් එක් වර්ෂයක් නොඉක්මවන කාලයක් සඳහා වලංගු වන්නේ ය. එසේ වුව ද සිය අභිමතය පරිදි එක් වර්ෂයකට වැඩි කාලයක් සඳහා වලංගු වන බලපත්‍රයක් නිකුත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට අභිමතය ඇත්තේ ය.

(4) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, යම් ගුවන් යානයක්—

(අ) ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවට ගෙන ඒමට අදහස් කරන්නේ නම් ; හෝ

(ආ) අත්හදාබැලීම් හෝ පරීක්ෂණ කටයුතු සඳහා භාවිත කිරීමට අදහස් කරන්නේ නම් ; හෝ

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි, ශ්‍රී ලංකාවට ගෙන ඒමට හෝ යම් කාර්යයන් සඳහා භාවිත කිරීමට හෝ අදහස් කරන්නේ නම්,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අතුරු වැඩ පිළිවෙලක් වශයෙන් එකී ගුවන් යානය සඳහා තාවකාලික ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් යානා නාමලේඛනය.

**43.** (1) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලබන සියලුම ගුවන් යානාවලට අදාළ තොරතුරු සහ ඒ සඳහා නියම කරනු ලබන වෙනත් තොරතුරු ද ඇතුළත් " ශ්‍රී ලංකා සිවිල් ගුවන් යානා නාම ලේඛනය " ලෙස හැඳින්වෙන නාම ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, පවත්වාගෙන යා යුතු ය.

(2) ශ්‍රී ලංකා සිවිල් ගුවන් යානා නාම ලේඛනය අධිකාරිය වෙත ඊට නියමිත ගාස්තුවක් ගෙවීමෙන් පසු මහජනයාගේ පරීක්ෂාව සඳහා උපයෝජ්‍ය වශයෙන් තැබිය යුතු ය.

(3) යම් ගුවන් යානයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් යානා නාම ලේඛනයෙහි ඇතුළත් තොරතුරු එවැනි ගුවන් යානයක අයිතිය සම්බන්ධව බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් වන අතර එකී ලේඛනයෙන් ලබා ගත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යථා පරිදි සත්‍ය උපුටනයක් බවට සහතික කරන ලද උපුටනයක් මත, එහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට සාක්ෂි වශයෙන් ක්‍රියා කළ හැකි වේ.

ලියාපදිංචි කිරීමේ සහතිකයක් අවලංගු කිරීම.

**44.** (1) 42 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් පහත සඳහන් හේතුවක් හෝ හේතු මත අවලංගු කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඇත.

(අ) ගුවන් යානයක් ලියාපදිංචි කිරීමෙන් පසුව සිදු වූ එහි අයිතියේ වෙනස්වීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දීමට අපොහොසත් වීම ;

(ආ) ලියාපදිංචි කරන ලද ගුවන් යානයක් විනාශවීම හෝ එවැනි යම් ගුවන් යානයක බඳට යම් විනාශයක් සිදුවීම ; හෝ

(ඈ) ලියාපදිංචිය ලබාගෙන ඇත්තේ වංචා සහගත ආකාරයෙන් හෝ අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමෙන් හෝ බව විශ්වාස කිරීමට තරම් ප්‍රමාණවත් හේතු අධ්‍යක්ෂ ජනරාල්වරයාට තිබීම.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් හේතු කිසිවක් මත ලියාපදිංචි කිරීමක් අවලංගු කරනු ලබන අවස්ථාවක එම අවලංගු කිරීමට අදාළ සියලු ම විස්තර ශ්‍රී ලංකා සිවිල් ගුවන් යානා නාම ලේඛනයෙහි වාර්තා කර තැබීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කළ යුතු අතර එකී ලියාපදිංචි කිරීමේ සහතිකය දරන්නා එකී ලියාපදිංචි කිරීමේ සහතිකය වහා ම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ආපසු භාරදිය යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කිරීම.

**45.** ලියාපදිංචි කිරීමේ සහතිකයක් දරන්නකු එකී සහතිකයෙහි කාලය ඉකුත්වීමට, අවම වශයෙන් එක් මාසයකට පෙර එම සහතිකය අලුත් කරවා ගැනීම සඳහා, ඊට නියමිත ආකෘති පත්‍රය මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියමිත අලුත් කිරීමේ ගාස්තුව අයකර ගැනීමෙන් පසු, තවදුරටත් එක් වර්ෂයක කාලයක් සඳහා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන යම්, අඩු කාලයක් සඳහා අදාළ සහතිකය අලුත් කළ හැක.

ජාතිකත්වය සහ ලියාපදිංචි කිරීමේ සලකුණ ප්‍රදර්ශන කිරීම.

**46.** අධ්‍යක්ෂ ජනරාල්වරයා අන්‍යාකාරයෙන් ලිඛිතව බලය පවරා ඇත්නම් මිස සෑම ගුවන් යානයක ම, එහි ජාතිකත්වය සහ ලියාපදිංචි කිරීමේ සලකුණ නියම කරනු ලබන ආකාරයට තබා ගැනීමත්, එය ප්‍රදර්ශනය කිරීමත් කළ යුතු ය.

රාජ්‍ය සලකුණු සහ සිවිල් ගුවන් ලාංඡනය පාවිච්චි කිරීම.

**47.** (1) මෙම පනතේ විධිවිධාන යටතේ අවසර දී ඇති හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කර ඇති, එසේත් නැතහොත් අවසර දී ඇති සලකුණු හෝ අක්ෂර කිසිවක් හැර වෙනත් කිසිම ප්‍රචාරක දැන්වීමක් හෝ අක්ෂර හෝ සලකුණු කිසිවක් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානයක බාහිර පෘෂ්ඨයෙහි කිසිම කොටසක ප්‍රදර්ශනය නොකළ යුතු ය.

(2) ගුවන් යානයෙහි මෙහෙයුම්කරුගේ නම සහ ලාංඡනය ද ශ්‍රී ලංකාවේ ජාතික ධජය ද, ඒවා පැහැදිලිව, වෙන්කොට හඳුනාගත හැකි වන පරිදි මෙන් ම, යුද ගුවන් යානා හෝ රාජ්‍ය ගුවන් යානා විසින් පාවිච්චි කරනු ලබන සලකුණු සමග වරදවා වටහා ගැනීමක් ඇති නොවන ආකාරයට, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලැබ ඇති යම් ගුවන් යානයක් මත ප්‍රදර්ශනය කළ හැකි ය. (මේවා පිහිටුවන ස්ථානය, හැඩය සහ වර්ණය මගින් ගුවන් යානයේ ජාතිකත්වය සහ ලියාපදිංචි කිරීමේ සලකුණු පහසුවෙන් හඳුනා ගැනීමට බාධාවක් සිදු නොවන්නේ නම් පමණි.)

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අනුමැතිය සහිතව සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව මිස කිසිම ගුවන් යානයක ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් ලාංඡනය ගුවනේ ලෙළවීම, පින්තාරු කිරීම හෝ අන්‍යාකාරයකින් ප්‍රදර්ශනය කිරීම සිදු නොකළ යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලිඛිත පූර්ව අනුමැතියක් රහිතව කිසිම ගුවන් යානයක් ලියාපදිංචි කිරීමේ සහතිකයේ පෙන්නුම් කොට ඇති පරිදි ප්‍රධාන නැවතුම් ස්ථානයෙහි හැර වෙනත් කිසිම ස්ථානයක නවතා තැබීම, වෙනත් තැනකට ගෙනයාම හෝ රක්ෂාස්ථානගත කිරීම සිදු නොකළ යුතු ය.

## V වන පරිච්ඡේදය

### ගුවන් යානාවල ගුවන් යෝග්‍යතාව සහ උපකරණ

බලපත්‍රයක් රහිතව ගුවන් යානා නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම ආදිය තහනම් කිරීම.

**48.** (1) නියමිත ආකෘතියට අනුකූල වූ ඉල්ලුම් පත්‍රයක් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කිරීමෙන් පසු සහ නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක බලය යටතේ මිස, කිසිම තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් හෝ විසින් යම් ගුවන් යානයක්, ගුවන් යානා එංජිමක්, අවර රෝදයක්, උවාරණයක් හෝ සංඝටකයක් ආනයනය කිරීම, මෝස්තරය සකස් කිරීම, නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, නවීකරණය කිරීම, අලුත්වැඩියා කිරීම, පූර්ණ වශයෙන් අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම ද යම් ගුවන් යානයක්, ගුවන් යානා එංජිමක්, අවර රෝදයක්, උවාරණයක් හෝ සංඝටකයක් ආනයනය කිරීමට, මෝස්තරය සකස් කිරීමට නිෂ්පාදනය කිරීමට, එකලස් කිරීමට, නවීකරණය කිරීමට, අලුත්වැඩියා කිරීමට, පූර්ණ වශයෙන් අලුත්වැඩියා කිරීමට හෝ නඩත්තු කිරීමට තැත්කිරීම ද නොකළ යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් ගුවන් යානයක, ගුවන් යානා එංජිමක, අවර රෝදයක, උවාරණයක හෝ සංඝටකයක වර්ගය, මෝස්තරය, නිෂ්පාදනය, එකලස් කිරීම, නවීකරණය, අලුත්වැඩියාව හෝ පූර්ණ අලුත්වැඩියාව සඳහා හෝ නඩත්තුව සඳහා භාවිත කිරීමට යෝජිත උපකරණ, පහසුකම් සහ ද්‍රව්‍යවල නියමයන්, ප්‍රමාණවත් භාවය සහ යෝග්‍යතාව පිළිබඳව ද ඒ සම්බන්ධයෙන් උපදෙස් දීමේ කාර්යයෙහි නිරතව සිටින තැනැත්තන්ගේ ශක්තතාව පිළිබඳව ද සෑහීමට පත්වීමෙන් පසු, එකී ගුවන් යානය, ගුවන් යානා එංජිම, අවර රෝදය, උවාරණය, හෝ සංඝටකය ආනයනය කිරීම, මෝස්තරය සකස් කිරීම, නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, නවීකරණය කිරීම, අලුත්වැඩියා කිරීම, පූර්ණ අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා යම් තැනැත්තකුට අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක්, ඒ මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත් විය යුතු අතර, අවස්ථානුකූලව එකී අවසරය ලබන තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය එම කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට වගබලා ගත යුතු ය.

48 වන වගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය කිරීමේ ආදීනව.

**49.** (1) 48 වන වගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය වන ආකාරයට කටයුතු කරන යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් හෝ මෙම පනත යටතේ වරදකට වරදකරුවකු වේ.

(2) මේ පනත යටතේ වරදක් සිදු කරන බව විශ්වාස කිරීමට හේතු ඇති අවස්ථාවක අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සඳහා ලිඛිතව බලය පවරන ලද වෙනත් නිලධරයකුට, එසේ එම වරද සිදු කර ඇතැයි විශ්වාස කරන ස්ථානයට ඇතුළු වී අදාළ වරද හා සම්බන්ධ යම් ගුවන් යානයක්, ගුවන් යානයක යම් කොටසක් හෝ අවස්ථානුකූලව කිසියම් සැලැස්මක් හෝ, වරද සිදු කිරීමට පාවිච්චි කරනු ලබන මෙවලම් හා උපකරණ තහනමට ගැනීමට බලය ඇත.

(3) ඉහත (2) වන උපවගන්තිය අනුව තහනමට ගන්නා ලද භාණ්ඩ අධ්‍යක්ෂ ජනරාල්වරයා භාරයේ තබා ගත යුතු අතර, චූදිතයා අදාළ වරදකට වරදකරු බවට තීන්දු කිරීමෙන් පසු අදාළ භාණ්ඩ රාජසන්තක කිරීමට හෝ විනාශ කිරීමට අදාළ නියෝගයක් අධිකරණය විසින් කරනු ලැබිය යුතු ය.

(4) විත්තිකරු චෝදනාවට නිවැරදිකරු බවට තීන්දු කරනු ලැබුවහොත් ඉහත (2) වන උපවගන්තිය යටතේ තහනමට ගන්නා ලද භාණ්ඩ වහා ම නිදහස් කිරීමට අධිකරණය විසින් නියෝග කළ යුතු අතර, එසේ තහනමට ගන්නා ලද භාණ්ඩ කිසිවකට අධ්‍යක්ෂ ජනරාල්වරයා භාරයේ තිබූ කාලය තුළ සිදු වී ඇති යම් හානියක් සම්බන්ධයෙන්, එකී හානිය සිදුවූයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නොසැලකිලිමත්කම නිසා බව ඔප්පු වුවහොත් මිස, ඒ පිළිබඳව වගකීමෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා නිදහස් විය යුතු ය.

(5) මෙම වගන්තියේ කාර්යය සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව බලය පවරනු ලබන වෙනත් යම් නිලධරයකු, 1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනතේ අර්ථය ඇතුළත සහ එහි කාර්ය සඳහා "සාම නිලධාරීන්" වශයෙන් සැලකිය යුතු ය.

ගුවන් යෝග්‍යතා සහතිකයක් නොමැතිව ශ්‍රී ලංකා දේශයට ඉහළින් පියාසර කිරීම තහනම් කිරීම.

**50.** යම් ගුවන් යානයක් එකී ගුවන් යානය ලියාපදිංචි කරනු ලැබූ දේශයෙහි අදාළ බලධරයා විසින් එකී ගුවන් යානය සම්බන්ධයෙන් යථා පරිදි නිකුත් කරනු ලැබූ හෝ වලංගු භාවයට පත් කරනු ලැබූ හෝ ගුවන් යානා සහතිකයක් බලාත්මකව පවතින්නේනම් හෝ අදාළ වන අවස්ථාවන්හි දී ගුවන් යානයේ මෙහෙයුම්කරු අයත් රාජ්‍යයේ බලධරයා විසින් නිකුත් කරනු ලැබූ හෝ වලංගු භාවයට පත් කරනු ලැබූ ගුවන් යෝග්‍යතා සහතිකයක් බලාත්මකව පවතින්නේ නම් හෝ මිස, ශ්‍රී ලංකා දේශය තුළ හෝ ශ්‍රී ලංකා දේශයට ඉහළින් පියාසර කිරීම හෝ පියාසර කිරීමට තැත් කිරීම හෝ නොකළ යුතු ය. තව ද, අදාළ සහතිකය නිකුත් කිරීම හෝ වලංගුභාවයට පත්කිරීම යම් කොන්දේසිවලට යටත්ව සිදු කරනු ලැබූ විටෙක, යථා පරිදි එකී කොන්දේසිවලට අනුකූලව කටයුතු කොට තිබිය යුතු අතර, අදාළ සහතිකය නිකුත් කිරීමේ දී හෝ වලංගුභාවයට පත්කිරීමේ දී සම්පූර්ණ කොට තිබිය යුතු නියමයන්, සම්මුතිය යටතේ කලින් කල ස්ථිර කරනු ලබන අවම ප්‍රමිතීන්ට සමාන හෝ එකී ප්‍රමිතීන්ට වඩා ඉහළින් හෝ වූ නියමයන් විය යුතු ය.

ගුවන් යෝග්‍යතා සහතික නිකුත් කිරීම.

**51.** (1) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් ගුවන් යානයක් වෙනුවෙන් නියමිත අවශ්‍යතාවයන්ට අනුකූලව ගුවන් යෝග්‍යතා සහතිකයක් නිකුත් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් විධිවිධානවල කුමක් සඳහන් වුව ද අත්හදා බැලීමේ කාර්යයක්, පරීක්ෂණ කාර්යයක් හෝ වෙනත් කාර්යයක් හෝ සඳහා ගුවන් යෝග්‍යතා සහතිකයක් රහිතව යම් ගුවන් යානයකට ශ්‍රී ලංකා දේශය ඇතුළත පියාසර කිරීමට අවසර දීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමි වේ. කෙසේ වුවද එවැනි අවස්ථාවක දී අදාළ ගුවන් යානය පියාසර කළ යුත්තේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන කොන්දේසි සහ සීමා පැනවීම්වලට අනුකූලවය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන ගුවන් යෝග්‍යතා සහතිකයක් එම සහතිකයේ නිශ්චිතව සඳහන් කාලය දක්වා වලංගු වන අතර එකී කාලය කවර විටෙක හෝ, නිකුත් කළ දින සිට එක් වර්ෂයක් නොඉක්මවිය යුතු ය. එසේ නිකුත් කරනු ලැබූ සහතිකයක්, එකී කාල සීමාව ඉකුත්වීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත අලුත් කළ හැකි ය.

(4) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානයක, එය පියසරයේ යෙදවීම අනතුරුදායක වන ආකාරයේ දෝෂයක් ඇති බව සොයා ගනු ලැබූ අවස්ථාවක, එකී දෝෂය නිවරද කරනතාක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අදාළ ගුවන් යෝග්‍යතා සහතිකය අත්හිටුවිය යුතු අතර, අදාළ ගුවන් යානය ස්ථිරවම ගුවන් යෝග්‍යතාව රහිත වන බව පෙනී යන්නේ නම්, ගුවන් යෝග්‍යතා සහතිකය

අවලංගු කළ යුතු ය. එම සහතිකය එසේ අවලංගු කරන ලද අවස්ථාවක දී එහි හිමිකරු වහා ම එම සහතිකය අධ්‍යක්ෂ ජනරාල්වරයාට භාර දිය යුතු ය.

**52.** වෙනත් යම් රාජ්‍යයක් විසින් නිකුත් කරන ලද ගුවන් යෝග්‍යතා සහතිකයක් ඒ වෙනුවෙන් අදාළ ගුවන් යානයෙහි හිමිකරු හෝ මෙහෙයුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන, මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා වලංගු භාවයට පත් කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වේ.

ගුවන් යෝග්‍යතා සහතික වලංගු භාවයට පත් කිරීම.

## VI වන පරිච්ඡේදය
## පිරික්සුම් හා මුදාගැනීමේ මෙහෙයුම් සහ අනතුරු සහ සිද්ධි විමර්ශනය කිරීම

**53.** ආපදාවන්ට පත් ගුවන් යානාවලට සහායවීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට සහ සම්බන්ධීකරණයට අදාළ කාර්ය පටිපාටිය, ඊට අදාළ “ප්‍රනිප” පදනම් කරගෙන අධිකාරිය විසින් සම්පාදනය කරනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

ආපදාවන්ට පාත්‍ර වූ ගුවන් යානාවලට සහාය වීම.

**54.** (1) ගුවන් පිරික්සුම් හෝ මුදාගැනීමේ හෝ මෙහෙයුම් කිසිවක් සාධනය කිරීම පිණිස, ඕනෑම අවස්ථාවක සිවිල් ගුවන් යානයක් අවස්ථානුකූලව එහි හිමිකරුගෙන් හෝ මෙහෙයුම්කරුගෙන් අධිග්‍රහණය කිරීමටත් එවැනි පිරික්සුම් සහ මුදාගැනීමේ මෙහෙයුමක දී සහාය ලබා ගැනීම අත්‍යවශ්‍ය වන්නා වූ යම් පුද්ගලයකුගේ සේවය ඉල්ලා සිටීමටත්, අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයා විසින් ඒ සඳහා බලය පවරනු ලබන යම් පුද්ගලයකුටත් හැකි වන්නේ ය.

ගුවන් යානා අධිග්‍රහණය කිරීම සහ ගුවන් සේවක පිරිස්, බාහිර පුද්ගලයින් පිරික්සුම් සහ මුදාගැනීමේ මෙහෙයුම් සඳහා යෙදවීම.

(2) එසේ අධිග්‍රහණය කරන ලද යම් ගුවන්යානයක් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල් ද, (1) වන උපවගන්තිය යටතේ සේවය ලබාගන්නා ලද පුද්ගලයන්ට ගෙවිය යුතු මුදල් ද අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසු නිශ්චය කරනු ලබන ප්‍රමාණයන් අනුව ගෙවිය යුතු ය.

(3) යම් තැනැත්තකුගේ නීතිවිරෝධී ක්‍රියාවක් හෝ පැහැරහැරීමක් හේතුකොටගෙන ඇති වූ සිදුවීමකට සම්බන්ධ පිරික්සුම් සහ මුදාගැනීමේ මෙහෙයුම්, රාජ්‍යය විසින් භාරගෙන ඇති අවස්ථාවක එවැනි සෙවීමේ සහ මුදාගැනීමේ මෙහෙයුම් සඳහා රාජ්‍යය විසින් දැරීමට සිදුවන සියලුම වියදම් හෝ ඉන් කොටසක් එකී තැනැත්තාගෙන් අයකර ගැනීමට අමාත්‍යවරයාට බලය තිබේ. මෙවැනි

අවස්ථාවක දී සිද්ධියට සම්බන්ධ ගුවන්යානය විදේශ ගුවන් යානයක් වීමත්, එම සේවාවන් සපයන ලද්දේ ශ්‍රී ලංකාවේ මායිමේ නොවන වෙනත් ස්ථානයක වීමත් සැලකිය යුතු නොවන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන යම් නියෝගයකට හෝ උපදෙසකට හෝ අනුව කටයුතු කිරීම නීත්‍යානුකූල හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන හෝ එසේ කටයුතු කිරීමට අපොහොසත් වන පුද්ගලයකු වරදකට වරදකරු වන්නේ ය.

ගුවන් යානා අනතුරු හෝ සිද්ධීන් හෝ පිළිබඳ විමර්ශනය.

**55.** (1) ගුවන් සංතරණ කාර්යයේ දී පැනනගින්නා වූ හෝ ගුවන් සංතරණයේ යෙදී සිටින අතරතුර දී සිදුවන්නා වූ යම් හදිසි අනතුරක් හෝ සිද්ධියක්, ශ්‍රී ලංකා දේශභූමිය තුළ හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලැබූ ගුවන් යානයක් සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකාවේ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන ගුවන් යානයක් සම්බන්ධයෙන් හෝ සිදුවන අවස්ථාවක, අධිකාරිය විසින් නියම කරනු ලබන යම් නියෝගවලට අනුකූලව :-

(අ) එකී හදිසි අනතුරු හෝ සිද්ධියට අදාළ සිද්ධිමය කරුණු, තත්ත්වයන් හා අවස්ථානුගත කරුණු ද, එයට තුඩුදුන්නේ යයි සිතිය හැකි යම් හේතු ද නිශ්චය කර ගැනීම ; සහ

(ආ) දෝෂාරෝපණය හෝ වගකීම බෙදාදීමේ කාර්යය සඳහා නොව එවැනි සමාන හදිසි අනතුරු හෝ සිද්ධීන් මතුවට සිදුවීම වැළැක්වීම සහතික කිරීම,

යන කාර්ය සඳහා එකී හදිසි අනතුර හෝ සිද්ධිය පිළිබඳව විමර්ශනයක් පැවැත්විය යුතු ය.

(2) ඉහත (1) වන උපවගන්තියේ කාර්යය සඳහා අවශ්‍ය නියෝග පනවන කල්හි අමාත්‍යවරයා, අවස්ථානුකූලව ගුවන් යානා අනතුරු හෝ සිද්ධීන් හෝ සම්බන්ධව විමර්ශන පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු "ප්‍රනිප" වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

ගුවන් යානා අනතුරු විමර්ශන මණ්ඩලය පත්කිරීම.

**56.** (1) 55 වන වගන්තිය යටතේ විමර්ශනයක් පැවැත්වීමේ කාර්යය සඳහා, අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ සාමාජික සංඛ්‍යාවකින් සමන්විත (මේ පරිච්ඡේදයේ මින්මතු "මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) ගුවන් යානා හදිසි අනතුරු විමර්ශන මණ්ඩලයක් අධිකාරිය විසින් පත්කරනු ලැබිය හැකි අතර, එහි එක් සාමාජිකයකු ප්‍රධාන විමර්ශකවරයා ලෙස කටයුතු කළ යුතු ය. කෙසේ වුව ද අධිකාරිය විසින් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු හෝ එහි මණ්ඩලය විසින් විමර්ශනය කළ යුතු හදිසි අනතුර හෝ සිද්ධියට සම්බන්ධකම් ඇති යම් තැනැත්තකු හෝ පත් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විමර්ශන මණ්ඩලයක් පත් කරන කල්හි, විමර්ශනය පැවැත්වීමේ දී විමර්ශන මණ්ඩල සාමාජිකයින් විසින් අනුගමනය කළ යුතු නියමයන් සහ කොන්දේසි අධිකාරිය විසින් නියම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන මණ්ඩලයේ කර්තව්‍ය, එය පත්කරනු ලැබුවේ යම් හදිසි අනතුරක් හෝ සිද්ධියක් විමර්ශනය කිරීම සඳහා ද, එකී හදිසි අනතුර හෝ සිද්ධිය පිළිබඳ ස්වකීය අවසාන වාර්තාව අධිකාරියට ඉදිරිපත් කිරීමෙන් පසු අවසන් වන්නේ ය.

(4) ශ්‍රී ලංකාවට අයත් ගුවන් යානයක් සම්බන්ධ අනතුරක් හෝ සිදුවීමක් වෙනත් රාජ්‍යයක දී සිදු වී, එම රාජ්‍යය විසින් එකී අනතුර හෝ සිදුවීම සම්බන්ධව විමර්ශනයක් පවත්වන කල්හි එම විමර්ශනයේ දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම පිණිස නියෝජිතයින් පත් කර යැවීමට ද අධිකාරිය විසින් කටයුතු සම්පාදනය කළ යුතු ය.

රහස්‍යභාවය ප්‍රකාශ කිරීම.

**57.** (1) මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් ම සිය නිල කටයුතු ආරම්භ කිරීමට පෙර ඔහු හෝ ඇය හෝ විසින් විමර්ශනයේ දී හෙළිවන සියලු ම තොරතුරු සම්බන්ධයෙන් සම්පූර්ණ රහස්‍යභාවය ආරක්ෂා කරන බවට ප්‍රතිඥා දෙමින් ප්‍රකාශයකට අත්සන් තැබිය යුතු අතර එකී ප්‍රකාශය මගින් ඔහු හෝ ඇය මෙහි පහත සඳහන් අවස්ථාවන් හි දී හැර එනම් :-

(අ) එසේ කරන ලෙස අධිකරණ නියෝගයක් ලැබුණු අවස්ථාවක;

(ආ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ස්වකීය කාර්යය ඉටුකිරීමේ දී ; හෝ

(ඇ) මේ පනතේ හෝ මේ පනත යටතේ පනවන ලද යම් රීතියක හෝ නියෝගයක විධිවිධාන කිසිවකට අනුකූලව කටයුතු කිරීම සඳහා,

අවශ්‍ය වූ විටක හෝ හැර එකී තොරතුරු හෙළිදරව් නොකරන බවට එකී ප්‍රකාශය මගින් ප්‍රතිඥා දිය යුතු ය.

(2) මණ්ඩලය විසින් පවත්වනු ලබන සියලු ම විමර්ශන අප්‍රසිද්ධියේ පැවැත්විය යුතු ය.

සාක්ෂිකරුවන් සහ ඉදිරිපත්කර ඇති ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ බලය.

**58.** (1) හදිසි අනතුරක් හෝ සිද්ධියක් හෝ සම්බන්ධව විමර්ශනයක් පවත්වන මණ්ඩලයට එසේ එම විමර්ශනය පවත්වන අතරතුර දී පහත සඳහන් අයුරින් කටයුතු කිරීමට බලය ඇත්තේ ය, එනම් :-

(අ) අදාළ විමර්ශනයේ දී පරීක්ෂා කිරීම අවශ්‍ය වෙතැයි සලකනු ලබන සියලු ම පුද්ගලයන් ප්‍රධාන විමර්ශකවරයාගේ අත්සනින් මණ්ඩලය ඉදිරියට කැඳවා ඔවුන්ගෙන් කරුණු විමසීම;

(ආ) එසේ කැඳවනු ලබන යම් පුද්ගලයකුගෙන් ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු ඉල්ලා සිටීම හෝ අවශ්‍ය තොරතුරු සපයන ලෙස නියම කිරීම, විමර්ශනයට අවශ්‍ය වෙතැයි මණ්ඩලය අදහස් කරන පොත්පත්, ලේඛන හෝ ද්‍රව්‍ය හෝ කිසිවක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීම, සහ එසේ ලබාගන්නා පොත්පත්, ලේඛන සහ ද්‍රව්‍ය කිසිවක් විමර්ශන කටයුතු අවසන් වනතුරු රඳවා තබා ගැනීම ;

(ඇ) ප්‍රකාශ ලබාගැනීම අවශ්‍ය වන්නේ යයි මණ්ඩලය අදහස් කරන සියලු ම පුද්ගලයන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීම සහ එසේ යම් පුද්ගලයකුගෙන් ලබාගත් ප්‍රකාශයක සත්‍යභාවය පිළිබඳව ප්‍රකාශයකට අත්සන් ලබාගැනීම ;

(ඈ) ගුවන් යානයේ සුන්බුන්, පියසර පටිගතකරණයන්, ගුවන් ගමනාගමන වාර්තා, හදිසි අනතුර සිදුවූ ස්ථානය සහ යම් වෙනත් අදාළ ද්‍රව්‍යවලට බාධා රහිත සහ සීමා නොකළ ප්‍රවේශය සහ එකී කාර්යය සඳහා ප්‍රමාදයකින් තොරව සවිස්තරාත්මක විමර්ශනයක් පැවැත්වීමට හැකිවීම පිණිස අදාළ ගුවන් යානය හෝ එකී යම් උපකරණ කොටස් වෙනස්කමකට භාජන නොකොට සුරක්ෂිතව තැබීම ;

(ඉ) අදාළ ගුවන් යානය හෝ ඉන් යම් කොටසක් හෝ ඒ තුළ අඩංගු කිසිවක් හෝ පරීක්ෂා කිරීමට, ඉවත් කිරීමට, පරීක්ෂණයට භාජන කිරීමට, ආරක්ෂා සහිතව තැබීම සඳහා පියවර ගැනීමට සහ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අන්‍යාකාරයෙන් කටයුතු කිරීමට;

(ඊ) විමර්ශනයේ කාර්යයන් සඳහා අවශ්‍ය වන බව පෙනීයන අවස්ථාවක යම් ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට හෝ ඇතුළු වී එය පරීක්ෂා කිරීමට; සහ

(උ) ලබා ගන්නා සාක්ෂි ආරක්ෂා සහිතව තැබීම සඳහා අවශ්‍ය සෑම පියවරක්ම ගැනීමට.

(2) 55 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් ආරම්භ කරනු ලබන විමර්ශනයක් මගින්, වෙනත් යම් නීතියක් යටතේ යම් පොලිස්, අධිකරණ හෝ අන්‍යාකාර විමර්ශනයකට ආබද්ධ කරනු ලැබූ බලතල කිසිවක් හීන කරන බවක් අදහස් නොකළ යුතු ය. කෙසේ වුව ද, අදාළ සාක්ෂි පරීක්ෂා කිරීමේ දී මණ්ඩලයට ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

(3) අනතුරකට හෝ සිදුවීමකට සම්බන්ධ වූ ගුවන් යානයක කිසියම් කොටසක් හෝ එහි ලිපිලේඛන, හෝ වෙනත් භාණ්ඩ කිසිවක් ඒ සඳහා බලය නොලත් පුද්ගලයකු විසින් ඉවත් කිරීම හෝ ස්වකීය භාරයේ තබා ගැනීම හෝ වරදක් වන්නේ ය. එමෙන්ම එවැනි තැනැත්තකු විසින් යම් සාක්ෂි අයුතු ලෙස වෙනස් කිරීම හෝ ගුවන් යානයේ රැගෙන ගිය මගීන්ට හෝ ගුවන් කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හෝ අයත් බඩුබාහිරාදිය කිසිවක් හෝ ගුවන් බඩු කිසිවක් හෝ ඉවත් කිරීම නැතහොත් ඔහු හෝ ඇය භාරයේ තබා ගැනීම ද වරදක් වන්නේ ය.

(4) සම්මුතියට පාර්ශවකරුවකු වන රාජ්‍යයක ලියාපදිංචි කරන ලද ගුවන් යානයක් ශ්‍රී ලංකා දේශය ඇතුළත දී අනතුරකට පත් වී එයින් යම් පුද්ගලයකු මිය ගොස් ඇති හෝ බරපතල ලෙස තුවාල ලබා ඇති, නැතහොත් අදාළ ගුවන් යානයට සැලකිය යුතු ප්‍රමාණයක හානි සිදුවී ඇති අවස්ථාවක, අධිකාරිය විසින්, එකී ගුවන් යානයේ ලියාපදිංචි රාජ්‍යයෙහි සහ අදාළ වන පරිදි මෙහෙයුම්කරු අයත් රාජ්‍යයෙහි, ගුවන් යානාවේ මෝස්තරය නිර්මාණය කළ රාජ්‍යයෙහි, ගුවන් යානය නිෂ්පාදනය කරන ලද රාජ්‍යයෙහි, අනතුරට පත් වූවන්ගේ ජාතික රාජ්‍යයෙහි මෙන්ම අධිකාරිය විසින් උචිත යයි අදහස් කරනු ලබන වෙනත් රාජ්‍යයන්හි බලයලත් නියෝජිතයන්ට අදාළ විමර්ශනයට සහභාගිවීමට බලය පැවරිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ සඳහන් විධිවිධානවල කුමක් සඳහන් වුවද, අමාත්‍යවරයා විමසීමෙන් පසු, අදාළ ගුවන් යානය ලියාපදිංචි කරන ලද රාජ්‍යයේ හෝ අදාළ වන්නේ නම් ගුවන් යානයේ මෙහෙයුම්කරු අයත් රාජ්‍යයේ නැතහොත් අධිකාරිය විසින් උචිත යයි අදහස් කරනු ලබන වෙනත් රාජ්‍යයක හෝ යථා පරිදි බලය පවරන ලද විමර්ශන නිලධරයකුට හෝ විමර්ශන නිලධාරීන්ට හෝ විමර්ශනය පැවැත්වීමේ කාර්යය පැවරීමට අධිකාරියට බලය තිබේ. එකී විමර්ශන නිලධරයා හෝ විමර්ශන නිලධාරීන් ද ඔහුට හෝ ඔවුන්ට හෝ පවරන ලද කාර්ය ඉටුකළ යුත්තේ මෙම පනතේ මෙම පරිච්ඡේදයේ විධිවිධානයන්ට මෙන්ම ඒ යටතේ පනවා ඇති නියෝගවලට හෝ රීතීන්ට ද අනුකූලව සහ අධිකාරියේ අධීක්ෂණය ද යටතේ වන්නේ ය. විමර්ශනයක් පැවැත්වීමේ කාර්යය එසේ විමර්ශන නිලධාරීන්ට පවරන ලද අවස්ථාවක ඒ සඳහා අවශ්‍ය පහසුකම් හැකිතාක් සපයා දීමට, අධිකාරිය කටයුතු කළ යුතු ය.

(6) විමර්ශනයක දී සාක්ෂි දීමට කැඳවනු ලබන කිසිම පුද්ගලයකු -

(අ) මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන සිතාසියකට අකීකරු නොවිය යුතු ය;

(ආ) දිවුරුම්දීම හෝ සාක්ෂිකරුවකු වශයෙන් ප්‍රතිඥාදීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය;

(ඇ) ඔහු හෝ ඇය පිළිතුරු දීමට නීතියෙන් බැඳී ඇති යම් ප්‍රකාශයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය; හෝ

(ඈ) ඔහු හෝ ඇය ඉදිරිපත් කිරීමට නීතියෙන් බැඳී ඇති ලිපිලේඛන කිසිවක් හෝ ගුවන්යානයක කොටසක් හෝ සංඝටකයක් හෝ ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ පැහැර හැරීම සිදු නොකළ යුතු ය.

(7) මණ්ඩලය හෝ ඒ මගින් පැවරුණු අධිකාරි බලයක් යටතේ කටයුතු කරන යම් පුද්ගලයකු හෝ මෙම වගන්තිය යටතේ බලතල හෝ කාර්යයන් ක්‍රියාත්මක කරන අතරතුර දී එකී මණ්ඩලයට හෝ එවැනි බලයලත් පුද්ගලයකුට අවහිර කිරීම හෝ බාධා පැමිණවීම වරදක් වන්නේ ය.

ශ්‍රී ලංකාවෙන් පිටත සිදුවන හදිසි අනතුරු.

**59.** (1) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානයක් ශ්‍රී ලංකා දේශයෙන් පිටත දී යම් හදිසි අනතුරකට ලක්වී එයින් යම් පුද්ගලයකු මිය ගොස් හෝ බරපතල ලෙස තුවාල ලබා ඇති හෝ අදාළ ගුවන් යානයට සැලකිය යුතු ප්‍රමාණයේ හානියක් සිදු වී ඇති හෝ අවස්ථාවක දී, අනතුර සිදු වූ ස්ථානය පිහිටි රාජ්‍යය විසින් පවත්වනු ලබන යම් විමර්ශනයකට හෝ පරීක්ෂණයකට ශ්‍රී ලංකාව වෙනුවෙන් සහභාගි වීම සඳහා බලයලත් නියෝජිතයකුට බලය පවරා දීම හෝ එකී අනතුරට අදාළ යම් කරුණක් පිළිබඳව විමර්ශනයක් පැවැත්වීම සඳහා මණ්ඩලයට බලය පවරාදීම හෝ අධිකාරිය විසින් සිදු කළ යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් ගුවන් යානයක් ශ්‍රී ලංකා දේශයෙන් පිටත දී හදිසි අනතුරකට භාජනයවී එයින් යම් පුද්ගලයකු මිය ගොස් හෝ බරපතල ලෙස තුවාල ලබා ඇති හෝ එසේ නැතහොත් අදාළ ගුවන් යානයට සැලකිය යුතු ප්‍රමාණයේ හානියක් සිදු වී ඇති හෝ අවස්ථාවක දී, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී විමර්ශනයක් හෝ පරීක්ෂණයක් හෝ පවත්වන කිසියම් රාජ්‍යයකට, තමන් සතුව ඇති අදාළ තොරතුරු සපයා දීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වගකීම වන්නේ ය.

**60.** (1) විමර්ශනයක් අවසන් වූ විට මණ්ඩලය විසින් සිද්ධියට අදාළ වටපිටාව සහ තත්ත්වයන් ද, අනතුරට මුල් වී යයි සැලකිය හැකි හේතුව හෝ හේතූන් සම්බන්ධයෙන් එළඹෙන නිගමනය ද, ජීවිතාරක්ෂාව සහ අනාගතයේ දී එවැනි සිද්ධීන් වලක්වාලීම අරමුණු කරගෙන ඉදිරිපත් කිරීම සුදුසු යයි සලකනු ලබන නිරීක්ෂණ සහ නිර්දේශ කිසිවක් ද අන්තර්ගත වන වාර්තාවක්, නියම කරනු ලබන ආකාරයට සකස් කළ යුතු ය. මෙම වාර්තාව අධිකාරිය වෙත ඉදිපත් කරනු ලැබිය යුතු අතර අධිකාරිය විසින් සුදුසු යයි අදහස් කරනු ලබන ආකාරයට එම සම්පූර්ණ වාර්තාව හෝ ඉන් කොටසක් හෝ ප්‍රසිද්ධ කළ යුතු ය.

මණ්ඩලය විසින් වාර්තාවක් සකස් කළ යුතු බව.

(2) අධිකාරිය විසින්, අවම ප්‍රමාදයක් සහිතව, නියම කරනු ලැබිය හැකි තැනැත්තන්ට සහ සංවිධානවලට අවසාන වාර්තාවේ කෙටුම්පත් පිටපතක් යැවිය යුතු ය.

(3) අධිකාරියට වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසු, මණ්ඩලය විසින් විමර්ශනය පවත්වන අතරතුර තමන්ට දැනගැනීමට ලැබුණු රහස්‍යභාවය පවත්වාගත යුතු බවට මණ්ඩලය විසින් සලකනු ලබන යම් ආරක්ෂක තොරතුරු අධිකාරියට සැපයිය යුතු අතර අධිකාරිය විසින්, එවැනි යම් ආරක්ෂක තොරතුරු ලැබීමේ දී, මේ පනතේ 116 වන වගන්තිය යටතේ ස්ථාපිත රාජ්‍ය ආරක්ෂක වැඩසටහනෙහි, (SSP) එකී තොරතුරු වාර්තාගතකොට සංරක්ෂණය කළ යුතු ය.

**61.** අධිකාරිය හෝ මණ්ඩලය විසින්, යම් හදිසි අනතුරකට හෝ සිද්ධියකට අදාළ අනාගත විමර්ශන කාර්ය සඳහා හැර වෙනත් කවර හෝ කාර්යයන් සඳහා පහත දැක්වෙන වාර්තා යම් තැනැත්තකුට ප්‍රයෝජන ලබා ගැනීම පිණිස ලබා නොදිය යුතු ය.:-

අධිකාරිය විසින් යම් යම් වාර්තා එළි දැක්වීම නොකළ යුතු බව.

(අ) විමර්ශනය පවත්වාගෙන යාමේදී මණ්ඩලය විසින් පුද්ගලයන්ගෙන් ලබා ගන්නා සියලු ම ප්‍රකාශ;

(ආ) අනතුරට හෝ සිදුවීමට මැදිහත් වී ඇති පුද්ගලයන් අතර සිදු වූ සියලු සංදේශන;

(ඇ) අනතුරට හෝ සිදුවීමට මැදිහත් වූ පුද්ගලයන් සම්බන්ධ පෞද්ගලික හෝ වෛද්‍ය තොරතුරු;

(ඈ) නියමු කුටි ශබ්ද තැටිගත කිරීම්, පියසර දත්ත තැටිගත කිරීම්, ගුවන් ගමනාගමන පාලක ඒකකවලින් ලබාගත් තැටිගත කිරීම් සහ එවැනි තැටිගත කිරීම්වලින් ලබා ගත් පිටපත් ;

(ඉ) පියාසර තොරතුරු තැටිවලින් ලබාගත් තොරතුරු ඇතුලු ව තොරතුරු විශ්ලේෂණයේ දී ඉදිරිපත් වූ මත ; සහ

(ඊ) විමර්ශනය කරනු ලැබූ හදිසි අනතුරට හෙර් සිද්ධියට සෘජුව සම්බන්ධකමක් නොමැති යම් වාර්තා.

මණ්ඩලයේ සාමාජිකයන් රාජ්‍ය සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

**62.** 56 වන වගන්තිය යටතේ පත් කරන ලද මණ්ඩලයේ සාමාජිකයින් එසේ එම මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් කටයුතු කරන තාක් කල් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථය ඇතුළත රාජ්‍ය සේවකයන් වශයෙන් සැලකිය යුතු වන්නේ ය.

විමර්ශනය යළි ආරම්භ කිරීම.

**63.** (1) විමර්ශනය සම්පූර්ණ කිරීමෙන් පසු විමර්ශනය කරනු ලැබූ හදිසි අනතුරට හෝ සිද්ධියට හෝ අදාළව, අධිකාරියේ මතය අනුව, පවත්වා නිම කළ විමර්ශනයේ ප්‍රතිඵල කෙරෙහි වැදගත් බලපෑමක් හෝ අදාළ භාවයක් ඇති කිරීමට හැකියාව තිබූ යම් අලුත් සාක්ෂි සොයාගත් අවස්ථාවක අධිකාරිය විසින් 60 වන වගන්තිය යටතේ වාර්තාවක් ඉදිරිපත් කිරීම නොතකා, එකී විමර්ශනය යළි ආරම්භ කිරීමට නියම කරනු ලැබිය හැකි වන්නේ ය.

(2) අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ විමර්ශනයක් යළි ආරම්භ කිරීම නියම කරනු ලැබූ අවස්ථාවක, අධිකාරිය විසින්, තම අභිමතය පරිදි, එකී විමර්ශනය මුල් විමර්ශනය පැවැත්වූ මණ්ඩලය ම විසින් පැවැත්විය යුතු බව නියම කිරීම හෝ එය පැවැත්වීම සඳහා 56 වන වගන්තිය යටතේ අලුත් මණ්ඩලයක් පත් කිරීම හෝ කළ හැකි වන්නේය.

(3) යම් හදිසි අනතුරක් හෝ සිද්ධියක් පිළිබඳව විමර්ශනයක් පවත්වාගෙන යාමට අදාළ වූ මේ පනතේ මේ කොටසේ විධිවිධාන, (1) වන උපවගන්තිය යටතේ යළි ආරම්භ කරනු ලබන විමර්ශනයක් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ විය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතිකාරී පියවර ගත යුතු බව.

**64.** විමර්ශනයක අවසාන වාර්තාවකින් හෝ අතුරු වාර්තාවකින් හෝ හෙළිදරව් වන කරුණු පදනම් කරගෙන ගුවන් සේවාවේ නිරුපද්‍රිතතාව, ක්‍රමවත් භාවය සහ කාර්යක්ෂම භාවය උදෙසා හෝ ඉදිරියේදී සමාන අනතුරු හෝ සිද්ධීන් ඇතිවීම වැළැක්වීම උදෙසා වහා ම ප්‍රතිකාරී පියවර සහ නිවරද කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වගකීම වන්නේ ය.

අර්ථ නිරූපණය.

**65.** මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා :-

"හදිසි අනතුර" යන්නෙන්, මිනිස් සේවකයන් සහිත ගුවන් යානයක් වන විට, පියසැරියක් නිම කිරීමේ චේතනාවෙන් යුතුව යම් තැනැත්තකු ගුවන්යානයට ඇතුළුවීමේ වේලාව සහ ඒ තැනැත්තන් ගුවන් යානයෙන් ගොඩ බසින වේලාව අතරතුර කාලයේ දී හෝ මිනිස් සේවකයන් රහිත ගුවන් යානයක් වන විට, එකී ගුවන් යානය පියසැරියක් අදහස් කරගෙන පිටත්ව යාමට සූදානම් වේලාව සහ පියසැරිය අවසානයේ එකී යානය

නිසලවී ප්‍රදාන පද්ධතියේ ක්‍රියාකාරීත්වය වසා දමන තෙක් වෙලාව අතරතුර කාලයේදී ගුවන් යානයේ මෙහෙයවීම හා බැඳුණු සහ -

(අ) අවස්ථාවෝචිත පරිදි ගුවන් යානය තුළ සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් හෝ ගුවන් යානයෙන් ගැලවී ගිය යම් කොටසක් ඇතුළුව, ගුවන් යානයේ යම් කොටසක් හා ඍජුව ගැටීමේ හේතුවෙන් හෝ යානයේ පිපිරුමට ඍජුව නිරාවරණය වීමේ හේතුවෙන් හෝ යම් තැනැත්තකුට මරණීය තුවාල සිදුවීම හෝ අන්‍යාකාරයෙන් බරපතල තුවාල සිදුවීම ; හෝ

(ආ) සාමාන්‍ය අවස්ථාවක සිදුවූයේ නම් විශාල අලුත්වැඩියාවක් හෝ බලපෑමට භාජනය වූ සංඝටක ප්‍රතිස්ථානය කිරීමක් හෝ අවශ්‍ය විය හැකි සහ ගුවන් යානයේ ව්‍යූහමය ශක්තිය, ක්‍රියාකාරීත්වය හෝ පියසර ලක්ෂණවලට අහිතකර අයුරින් බලපෑමක් ඇති කරන්නා වූ යම් හානියක් හෝ ව්‍යූහමය කඩාවැටීමක් ගුවන් යානයට සිදුවීම ; හෝ

(ඇ) ගුවන් යානය සොයා ගැනීමට නොහැකි වීම හෝ කවර ලෙසකින් හෝ ප්‍රවේශය නොමැතිවීම,

සිදු කරනු ලබන යම් සිදුවීමක් අදහස් වේ.

"බලයලත් නියෝජිතයා" යන්නෙන් මේ පනතේ 56 වන වගන්තිය යටතේ පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන විමර්ශනයකට සහභාගී වීමේ කාර්යය සඳහා යම් රාජ්‍යයක් නියෝජනය කිරීම පිණිස එකී රාජ්‍යය විසින් පත් කරනු ලබන තැනැත්තකු අදහස් වේ.

"සිද්ධිය" යන්නෙන්, යම් ගුවන් යානයක මෙහෙයුමේ ආරක්ෂාවට බලපෑමක් වන්නා වූ හෝ බලපෑමක් විය හැකි හදිසි අනතුරක් නොවන, එකී ගුවන් යානයේ මෙහෙයුම හා ආශ්‍රිත යම් සිද්ධියක් අදහස් වේ.

## VII වන පරිච්ඡේදය

### ගුවන් සේවා පිරිස් සහ පුහුණු කිරීමේ ආයතන

**66.** (1) සිවිල් ගුවන් සේවා කාර්යයන්හි සුරක්ෂිතතාව සහ නිරුපද්‍රිතතාව සහතික කිරීමේ අරමුණු ඇතිව, අමාත්‍යවරයා විසින්, සම්මුතිය යටතේ ශ්‍රී ලංකාව වෙත පැවරී ඇති ජාත්‍යන්තර බැඳීම් සමග අනුකූල වෙමින් නියමිත සිවිල් ගුවන් සේවා කාර්යයන් ඉටු කිරීමෙහි නිරතව සිටින හෝ එම කාර්යයන්ට සම්බන්ධ වී සිටින

සේවක පිරිස් විසින් බලපත්‍ර ආදිය ලබාගත යුතු බවට නියෝග පැනවීම.

සියලුම සේවක පිරිස් හෝ ආයතන වෙනුවෙන් බලපත්‍ර, ප්‍රමාණන, නිපුණතා සහතික සහ අවසර පත්‍ර කිසිවක් නිකුත් කිරීමේ පටිපාටි නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් ලබාගෙන ඉටු කළ යුතු කාර්යයන් ද, සම්පූර්ණ කළ යුතු සුදුසුකම් සහ අනෙකුත් අවශ්‍යතා ද, ඉල්ලුම් පත්‍ර ගාස්තු ප්‍රමාණයන් ද සහ එවැනි බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් දරන්නකුට පිරිනැමිය යුතු වරප්‍රසාද. එවැනි බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් සංශෝධනය කිරීමට, අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට පදනම් වන හේතූන් මෙන්ම ඒවා අලුත් කළ යුතු අවස්ථාවන් සහ ආකාරය ද (1) වන උපවගන්තිය යටතේ පනවනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(3) යම් සිවිල් ගුවන් සේවා කාර්යයක් ඉටු කිරීම සඳහා බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් ලබා ගත යුතු බවට (1) වන උපවගන්තිය යටතේ පනවා ඇති නියෝග මගින් නියම කරනු ලබන කිසිම තැනැත්තෙක් එසේ නියමිත පරිදි බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් ලබා නොගෙන එවැනි කාර්යයක නිරත නොවිය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් මෙම පනතේ මෙම පරිච්ඡේදය යටතේ බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් ලබාගත යුතු බවට නියම කර ඇති අවස්ථාවක එවැනි කාර්යයක දෙවන පුද්ගලයකු නිරත කරවන කල්හි, එකී දෙවන පුද්ගලයා නියමිත පරිදි බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් දරන්නකු බව කිසිදු සැකයකින් තොරව සෑහීමකට පත්විය හැකි නම් මිස, පළමු පුද්ගලයා විසින් දෙවන පුද්ගලයා එම කාර්යයෙහි නොයෙදවිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ පනවනු ලබන නියෝග මගින් සම්මුතියේ පාර්ශ්ව රාජ්‍යයක් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් වලංගු භාවයට පත් කිරීම සඳහා විධිවිධාන යෙදීම කළ හැකිය. තව ද මෙහි දී එකී පාර්ශ්ව රාජ්‍යය විසින් එවැනි බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කිරීමේ දී යම් නියමයන්ට යටත්ව නිකුත් කරනු ලැබුවේ ද, එකී නියමයන් එවැනි බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් නිකුත්

කිරීමට අදාළ ප්‍රමිති ක්‍රියාත්මක කිරීම සඳහා පනවන ලද නියෝග මගින් නියම කොට ඇති නියමයන්ට සමාන හෝ ඒවාට ඉහළින් හෝ වූ නියමයන් විය යුතු ය.

**67.** 66 වන වගන්තියෙහි සඳහන් සියලුම බලපත්‍ර, ප්‍රමාණනයන්, නිපුණතා සහතික සහ අවසර පත්‍ර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සඳහා විශේෂිතව බලය පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ නිකුත් කරනු ලැබිය යුතු අතර, එවැනි බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ වෙනත් කිසියම් අවසර පත්‍රයක් සංශෝධනය කිරීමේ, අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ බලය ද අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඔහු වෙනුවෙන් කටයුතු කරන වෙනත් යම් පුද්ගලයකුට හෝ හිමි වන්නේ ය.

නිපුණතා සහතික, බලපත්‍ර, ප්‍රමාණන හෝ අවසරපත්‍ර නිකුත් කිරීම, අත්හිටුවීම සහ අවලංගු කිරීම.

**68.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ යම් අවසර පත්‍රයක් හෝ දරන තැනැත්තකුහට තම කාර්යයන් ආරක්ෂාකාරී ලෙස ඉටු කිරීමට හානිදායක විය හැකි තෙහෙට්ටුව ඇතුළු තමන් පෙළෙන යම් රෝගයක් හෝ වෙනත් කායික හෝ මානසික දුබලතාවක් ගැන දැන ගැනීමට ලැබුණහොත් ඔහු විසින් එකී බලපත්‍රය, ප්‍රමාණනය, නිපුණතා සහතිකය හෝ අවසර පත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් කාර්යන් ඉටුකිරීමට ද එකී කාර්යයන් ඉටුකිරීමෙන් වැලකී සිටිය යුතු ය.

කායික හෝ මානසික දුබලතා.

(2) යම් මෙහෙයුම්කරුවකු විසින් තමාගේ යම් සේවා නියුක්තකයකු ඔහුගේ කාර්යයන් ආරක්ෂාකාරී ලෙස ඉටු කිරීමට හානිකර විය හැකි තෙහෙට්ටුව ඇතුළු කායික හෝ මානසික දුබලතාවකින් පෙළෙන බව දැනගන්නට ලැබුණු අවස්ථාවක එවැනි සේවා නියුක්තකයකු තවදුරටත් ඔහුගේ කාර්යයන්හි නිරතවීම වැළැක්වීම සඳහා ගත යුතු සියලු ම පියවර ඉක්මනින් ගැනීම කළ යුත්තේ ය.

(3) යම් පුද්ගලයකු විසින් මෙම වගන්තියෙහි (1) වන හෝ (2) වන උපවගන්තිවල සඳහන් නියමයන් උල්ලංඝනය කිරීම මෙම පනත යටතේ වරදක් වන අතර එවැනි පුද්ගලයකුට දඬුවම් වශයෙන් එස්ඩීආර් විසිපන්දහසකට සමාන ශ්‍රී ලංකා රුපියල් සංඛ්‍යාවකට නොවැඩි දඩයක් නියම කළ හැකි අතර, එම දඬුවමට අමතරව, එවැනි පුද්ගලයකුට මේ පනතේ මේ පරිච්ඡේදය යටතේ නිකුත්කර ඇති බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ යම් අවසර පත්‍රයක් අවලංගු කිරීම ද සිදු කළ හැකි ය.

(4) මේ පනතේ මේ කොටස යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ යම් අවසර පත්‍රයක් දරන්නකු තෙහෙට්ටුවට පත්වීම වැළැක්වීම සඳහා ඔහුට අදාළ සේවා කාලය සම්බන්ධ සීමා පැනවීමේ සහ විවේක කාල පිළිබඳ නියෝග නිකුත් කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිවන අතර, එවැනි නියෝගවලට අනුකූලව කටයුතු කිරීම අදාළ බලපත්‍රය, ප්‍රමාණනය, නිපුණතා සහතිකය හෝ අවසර පත්‍රය දරන පුද්ගලයාගේ වගකීම වන්නේ ය. එවැනි යම් බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් දරන්නකු එම නියෝගවලට අනුව කටයුතු කිරීමෙන් වලක්වන යම් සේවායෝජකයකු වරදකට වරදකරු වන්නේ ය.

(5) එසේ කිරීම අවශ්‍ය හෝ යෝග්‍ය හෝ බව අදහස් කරන අවස්ථාවක, මේ පනතේ මේ පරිච්ඡේදය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් දරන යම් තැනැත්තකුට ඕනෑම අවස්ථාවක වෛද්‍ය පරීක්ෂණයකට යටත් වන ලෙස නියම කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන අතර එවැනි නියමයක් අනුව කටයුතු කිරීම එකී තැනැත්තාගේ කාර්යය වන්නේ ය. එවැනි නියමයකට අනුව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කිරීම, මේ පනත යටතේ සිදු කරන වරදක් වශයෙන් සලකනු ලබන අතර එම වරද වෙනුවෙන් අධිකරණයකින් නියම කරන යම් දඬුවමකට අමතරව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවැනි තැනැත්තකුට නිකුත්කර ඇති යම් බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ යම් අවසර පත්‍රයක් අවලංගු කිරීමේ බලය ද අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

ගුවන් සේවා පුහුණු ආයතන.

**69.** (1) 66 වන වගන්තිය යටතේ බලපත්‍රයක්, ප්‍රමාණනයක්, නිපුණතා සහතිකයක් හෝ අවසර පත්‍රයක් ලබාගත යුතු බවට නියම කර ඇති කාර්යයන් සඳහා පුහුණු කිරීම් පාඨමාලා පවත්වන යම් පුද්ගලයකුට හෝ ආයතනයකට හෝ ඒ සඳහා අවස්ථාවෝචිත පරිදි බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමි වන්නේ ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා එවැනි බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කළ යුත්තේ අදාළ පුහුණු කිරීමේ පාඨමාලාවේ අන්තර්ගතයේ ප්‍රමාණවත් බව, පුහුණු කිරීමේ උපකරණ සහ පහසුකම් ආදියෙහි යෝග්‍යතාව සහ උපදේශකයන්ගේ නිපුණතාව සම්බන්ධයෙන් සෑහීමකට පත්වීමෙන් පසුව ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පුහුණු කිරීම් පාඨමාලා පැවැත්වීම සඳහා බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කරවා ගැනීමට සුදුසුකම් ලැබීම පිණිස සම්පූර්ණ කර තිබිය යුතු අවශ්‍යතාවන් වන, සේවයෙහි යොදවා ගන්නා උපදේශකයන් සතුව තිබිය යුතු සුදුසුකම්, උපකරණ

සහ පහසුකම් ආදියෙහි ස්වභාවය ආදී කරුණු මෙන්ම එවැනි බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කිරීම, අලුත් කිරීම සහ සංශෝධනය කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් ද නියම කරනු ලබන ආකාරයට විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් එක් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලැබිය යුතු අතර, එය තවදුරටත් එක් වරකට එක් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා අලුත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන හේතුවක් හෝ හේතු මත එවැනි බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් සංශෝධනය කිරීමේ අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

## VIII වන පරිච්ඡේදය

### ගුවන් යානා මෙහෙයුම්

ලේඛන, උපකරණ, මෙහෙයුම් සේවක පිරිසේ සංඛ්‍යාව සහ විස්තර.

**70.** (1) පිළිවෙලින් මෙම පනතෙහි 42 වන වගන්තිය සහ 51 වගන්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය සහ ගුවන් යෝග්‍යතා සහතිකය මෙන්ම මෙම පනත යටතේ නියමිත අවම උපකරණ සහ මෙහෙයුම් සේවක පිරිස ද වෙනත් අවශ්‍ය ලිපි ලේඛන කිසිවක් ද ඒ තුළ රැගෙන යන්නේ නම් මිස ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද කිසිම ගුවන් යානයක් ශ්‍රී ලංකා දේශය ඇතුළත හෝ ඉන් පිටත පියාසර නොකළ යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ ගුවන් යානයක් හැර වෙනත් කිසිම ගුවන් යානයක්, එම ගුවන් යානය ලියාපදිංචි කරන ලද රාජ්‍යයේ හෝ එහි මෙහෙයුම්කරු අයත්වන රාජ්‍යයේ හෝ නීතිරීතිවලට අනුව හෝ එවැනි රාජ්‍යයක් නොමැත්තේ නම් සම්මුතියේ 29 වන ව්‍යවස්ථාව අනුව එය ලියාපදිංචි කිරීමේ දී නිකුත් කරන ලද බලපත්‍රය හෝ සහතික පත්‍රය සහ නියමිත අවම උපකරණ සහ මෙහෙයුම් සේවක පිරිස ද, වෙනත් නියමිත ලියකියවිලි කිසිවක් ද ඒ තුළ රැගෙන යන්නේ නම් මිස ශ්‍රී ලංකා දේශය ඇතුළත පියාසර නොකළ යුතු ය.

(3) මෙම වගන්තියෙහි සඳහන් සෑම ගුවන් යානයක ම මෙහෙයුම් සේවක පිරිසට අයත් සාමාජිකයන් අදාළ ගුවන් යානය ලියාපදිංචි කරන ලද රාජ්‍යය විසින් හෝ අදාළ තන්හි මෙහෙයුම්කරු අයත්

රාජ්‍යය විසින් නිකුත් කරන ලද හෝ වලංගු භාවයට පත් කරන ලද නියමිත නිපුණතා සහතික, බලපත්‍ර, ප්‍රමාණන හෝ අවසර පත්‍ර දැරිය යුතු ය.

(4) පවත්වාගෙන යා යුතු ලොග් සටහන් පොත් වර්ග ද, ගුවන් යානා එන්ජින්, අවර රෝද, උපකරණ හෝ ගුවන් යානා මෙහෙයුම් සහ නඩත්තුවල යෙදෙන සේවක පිරිස සම්බන්ධයෙන් එකී ලොග් පොත් පවත්වාගෙන යාමේ දී සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා ද අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.

ගුවන් රීති.

**71.** (1) අමාත්‍යවරයා අදාළ "ප්‍රතිප" වලට අනුකූලව "ගුවන් රීති" පැනවිය යුතුය. ගුවන් යානයක් චලනය කළ යුතු හෝ පියාසර කළ යුතු හෝ ආකාරය, ගුවන් යානයක් හෝ තැනැත්තන් විසින් විහිදුවිය යුතු ආලෝක සහ නිකුත් කළ යුතු සංඥා, ගගන යාත්‍රාංගන ආලෝක කළ යුතු සහ සලකුණු යෙදිය යුතු ආකාරය මෙන්ම පියසරයේ යෙදෙන සහ චලනය වන ගුවන් යානයක නිරුපද්‍රිතතාවන්, ගොඩබිමෙහි හෝ ජලය මත හෝ පුද්ගලයන්ගේ සහ දේපළවල නිරුපද්‍රිතතාවන් සහතික කිරීම සඳහා අවශ්‍ය වෙනත් විධිවිධාන ද මෙම රීතිවල අඩංගු විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ පනවනු ලබන ගුවන් රීති අනුව කටයුතු කිරීම සෑම ගුවන් යානා අණදෙන නියමුවකුගේ ම වගකීම වන්නේ ය.

(3) ජාත්‍යන්තර පියසරයක යෙදෙන සෑම ශ්‍රී ලංකා ගුවන් යානයක් ම එය කිනම් දේශයක තිබුණ ද එම දේශයෙහි බලපැවැත්වෙන ගුවන් රීති පිළිපැදිය යුතු අතර, මහ මුහුදට ඉහළින් හෝ අවිනිශ්චිත රාජ්‍යත්වයක් සහිත ප්‍රදේශවලට ඉහළින් පියාසර කරන අතරතුර, සම්මුතිය යටතේ බලපවත්නා ගුවන් රීති පිළිපැදිය යුතු වන්නේ ය.

(4) මෙම වගන්තියේ (2) වන හා (3) වන උපවගන්ති මගින් නියම කරන ලද ආකාරයට, අදාළ ගුවන් රීති පිළිපැදීමට අපොහොසත් වන, ශ්‍රී ලංකා ගුවන්යානයක අණදෙන නියමුවකුට එවැනි උල්ලංඝනයක් සඳහා නියම කළ හැකි යම් දඩයකට අමතරව ඔහුට 67 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නිකුත් කර ඇති බලපත්‍රය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමකට යටත් වීමට ද සිදුවනු ඇත.

හදිසි අවස්ථාවකදී අණදෙන නියමුවකු කටයුතු කළ යුතු ආකාරය.

**72.** (1) 71 වන වගන්තියේ ඇතුළත් විධිවිධානවලට අගතියකින් තොරව අණදෙන ගුවන් නියමුවකු—

(අ) පියසැරියේ යෙදෙන ගුවන් යානයක නිරුපද්‍රිත මෙහෙයුම සහ ගුවන් යානය තුළ සිටින සියලු ම ගුවන් මගීන්ගේ සහ සේවක පිරිසගේත් ගුවන් යානයේ රැගෙන යන ගුවන් බඩු සියල්ලේත් නිරුපද්‍රිතතාව සහ යහපත සම්බන්ධව වගකිව යුතු ය.

(ආ) අණ දෙන ගුවන් නියමුවා වශයෙන් කටයුතු කරමින් සිටිය දී ගුවන් යානය පාලනය කිරීම සම්බන්ධවත් ගුවන් යානය තුළ සිටින සියලු ම පුද්ගලයන් අතර විනය පවත්වාගෙන යාම සම්බන්ධවත් අවසාන තීරණ ගැනීමේ බලය හිමි පුද්ගලයා වන්නේ ය ; සහ

(ඇ) (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව, මේ පනත යටතේ පනවා ඇති සියලු ම අදාළ විධිවිධාන සමග ද ඒ යටතේ පනවා ඇති රීති හෝ නියෝග සහ එමෙන්ම ගුවන් යානා මෙහෙයුම් සම්බන්ධයෙන් අදාළ වන්නා වූ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති පවත්වා ගැනීම පිළිබඳව ද වගකිව යුතු ය.

(2) යම් හදිසි අවස්ථාවක දී පහත සඳහන් කරුණු සම්බන්ධව තමන්ට සෑහීමකට පත් විය හැකි කල්හි අණ දෙන ගුවන් නියමුවකු විසින්, (1) වන උපවගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් වුව ද මෙම පනතේ විධිවිධාන කිසිවක් හෝ මෙම පනත යටතේ පනවා ඇති රීති හෝ නියෝග කිසිවක් හෝ ගුවන් යානා මෙහෙයුම්වලට අදාළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති හෝ අනුගමනය කිරීමෙන් අපගමනය වී වෙනස් ආකාරයකට ක්‍රියා කළ හැක :–

(අ) හදිසි අවස්ථාව, ජීවිත හෝ දේපළවලට සිදුවිය හැකි අනතුරක් සම්බන්ධයෙන් වීම ;

(ආ) හදිසි අවස්ථාවට අනුව අවශ්‍ය කටයුතු කිරීම සඳහා වෙනස් ආකාරයකට කටයුතු කිරීම අවශ්‍ය වීම ;

(ඇ) හදිසි අවස්ථාව මග හැරීමට හෝ මර්දනය කර ගැනීමට හෝ ප්‍රමාණවත් ක්‍රම නොමැති වීම ; සහ

(ඇ) පනතේ විධිවිධාන කිසිවක් හෝ පනත යටතේ පනවා ඇති රීති, නියෝග හෝ ගුවන් යානා මෙහෙයුම්වලට අදාළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති හෝ අනුගමනය කිරීමෙන් සිදු

විය හැකි අනතුරෙහි ප්‍රමාණය එකී රීති, නියෝග අනුගමනය නොකොට ඒවායින් අපගමනය වීම මගින් සිදුවිය හැකි අනතුරෙහි ප්‍රමාණයට වඩා ප්‍රත්‍යක්ෂ වශයෙන් ම අධික වීම.

(3) හදිසි අවස්ථාවක දී, (2) වන උපවගන්තිය යටතේ නියමයන් අනුගමනය නොකොට ඒවායින් අපගමනය වෙමින්, වෙනස් ආකාරයකට ක්‍රියාකරන එවැනි අණදෙන ගුවන් නියමුවකු පහත සඳහන් ආකාරයට කටයුතු කළ යුතු ය :—

(අ) එවැනි අපගමනය වීමක් සිදු කළ වහා ම එය අදාළ ගුවන් ගමන් පාලන අංශයට දැන්විය යුතු ය ; සහ

(ආ) එවැනි අපගමනය වීමක් සම්බන්ධව හැකි ඉක්මනින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දිය යුතු අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලා සිටි අවස්ථාවක තමා කටයුතු කළ ආකාරය සම්බන්ධව ලිඛිත වාර්තාවක් ද ඉදිරිපත් කළ යුතු ය.

(4) ජාතික හදිසි අවස්ථාවක්, ආපදාවක්, අර්බුදයක් හෝ ව්‍යසනයක්, එළඹ ඇති අවස්ථාවක හුදෙක් ජීවිත බේරා ගැනීමේ හෝ දේපළ බේරා ගැනීමේ කාර්ය සඳහා හෝ ඒ සිද්ධිය හේතුවෙන් අනතුරට පත් වී ඇති හෝ පත්විය හැකි පාර්ශ්වයන්ට සහන සැලසීමේ කාර්යය සඳහා එකී හදිසි අවස්ථාව, ආපදාව, අර්බුදය හෝ ව්‍යසනය සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රමාණයට මේ පනත මගින් හෝ එය යටතේ සාදන ලද යම් නියෝග, රීති, හෝ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති මගින් හෝ එය යටතේ නිකුත් කරන ලද යම් විධාන මගින් හෝ පනවන ලද යම් නියමයන් එකක් හෝ කිහිපයක් අදාළ කර ගැනීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තාවකාලිකව අත්හිටුවනු ලැබිය යුතු ය. එවැනි තාවකාලික අත්හිටුවීමක් සිදුකරනු ලබන එක් එක් අවස්ථා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අමාත්‍යවරයාට ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර එකී වාර්තාවේ ප්‍රශ්නගත අත්හිටුවීම පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් අඩංගු විය යුතු ය. අමාත්‍යවරයා විසින් එකී වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට සැලැස්විය යුතු ය.

ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකය.

73. (1) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලැබූ යම් ගුවන් යානයක් හෝ මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් මෙහෙයුම්කරුවකු විසින් යම් බද්දක්, චාටර් පත්‍රයක් හෝ හුවමාරුවක් හෝ ඒ හා සමාන වෙනත් සැකසුමක් හෝ පදනම් කරගෙන පාවිච්චි

කරනු ලබන වෙනත් යම් ගුවන් යානයක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී ගුවන් යානයේ හිමිකරුට හෝ මෙහෙයුම්කරුට හෝ නිකුත් කරන ලද ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක බලය යටතේ සහ එහි නියමයන් අනුව හැර මෙහෙයවීම සිදු නොකළ යුතු ය.

(2) විදේශ ගුවන් යානා මෙහෙයුම්කරුවකු විසින් ශ්‍රී ලංකාව තුළට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සිදු කරනු ලබන වාණිජ ගුවන් ප්‍රවාහන මෙහෙයුම් එසේ සිදුකළ යුත්තේ එවැනි විදේශ ගුවන්යානා මෙහෙයුම්කරුවකුහට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක බලය යටතේ සහ එකී නියමයන්ට අනුකූලව විය යුතු ය. එවැනි සහතිකයක් නිකුත් කිරීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එකී විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු තම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන රටේ වලංගු ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ ඒ හා සමාන කිසිවක් එකී විදේශ ගුවන්යානා මෙහෙයුම්කරුට නිකුත් කරනු ලැබ ඇති බවට සහතික විය යුතු අතර, එකී විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සම්මුතියේ සහ සම්මුතියේ ඇමුණුම්වල දක්වා ඇති ප්‍රමිති, පරිචයන් සහ කාර්ය පටිපාටිවලට අනුකූලව ක්‍රියාකරන බව සහ ඒවා පිළිපදින බව සාක්ෂාත් කරගැනීම සඳහා එකී ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකය නිකුත් කළ අධිකාරිය විසින් ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇති බවට ද අධ්‍යක්ෂ ජනරාල්වරයා සහතිකය විය යුතු ය.

(3) ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ ඉල්ලුම් කරනු ලබන යම් ගුවන් යානා මෙහෙයුම්කරුවකු හෝ හිමිකරුවකු හෝ විදේශ ගුවන්යානා මෙහෙයුම්කරුවකු ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවාවට තර්ජනයක් වන හෝ තර්ජනයක් විය හැකි පුද්ගලයකු වන කල්හි, එවැනි පුද්ගලයකුට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ සඳහන් යම් ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ විදේශ ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ නිකුත් කරනු නොලැබිය යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් ඉල්ලුම් පත්‍රයක් නියමිත ගාස්තුව අයකර ගැනීමෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සුදුසුකම් සඳහා පරීක්ෂා කළයුතු අතර, එම කාර්යය සඳහා, ප්‍රමිතීන් සහ ආශ්‍රිත අන් නියමයන් ද ක්‍රියාත්මක කරමින් නියම කරනු ලැබිය හැකි නියෝගවලට අනුකූලව, තමා විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් විමර්ශනයක්, පැවැත්විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් ම සහ විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් ම එසේ නිකුත් කරනු ලැබූ සහතිකවල නිශ්චිතව සඳහන් කරනු ලබන මෙහෙයුම් උපදේශවලට සහ නියම කරනු ලැබිය හැකි නියමයන් සහ කොන්දේසිවලට ද යටත් විය යුතු ය. තව ද එසේ නිශ්චිතව සඳහන් මෙහෙයුම් උපදෙස් සහ එකී නියමයන් සහ කොන්දේසි කරයේ පිළිපදිමින් සිය මෙහෙයුම් පවත්වාගෙන යන බවටත්, මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ පනවනු ලබන යම් නියෝග, නීති, ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති හෝ වෙනත් විධාන කිසිවක විධිවිධාන යටතේ පනවන ලද යම් නියමයන් හෝ අන්‍ය රාජ්‍යයක් සමග ඇතුළත්ව ඇති යම් ගිවිසුමක් යටතේ ශ්‍රී ලංකාව වෙත පැවරී ඇති වගකීම් කිසිවක් හෝ උල්ලංඝනය නොවන බවටත්, සහතික වීම එවැනි සහතිකයක් දරන්නකුගේ වගකීම වන්නේ ය.

(6) ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් එය නිකුත් කරනු ලැබූ දිනයේ සිට එක් වර්ෂයකට නොවැඩි කාල සීමාවක් සඳහා වලංගු විය යුතු අතර එවැනි බලපත්‍රයක් තව දුරටත් දැරීම සඳහා අවශ්‍ය සුදුසුකම් අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි පවත්වාගෙන යන්නේ නම් එය නැවත එක් වර්ෂයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා එක් එක් අවස්ථාවන්හි දී අලුත් කරනු ලැබිය හැකි ය.

(7) මේ පනත යටතේ නිකුත් කරන ලද, අවස්ථාවෝචිත පරිදි වලංගු ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ නොමැතිව හෝ එවැනි සහතිකයක නියමයන් හෝ කොන්දේසි උල්ලංඝනය කරමින් හෝ ගුවන් යානයක මෙහෙයුමක් සිදු කිරීම, එවැනි උල්ලංඝනයක් කරන එක් එක් දිනයක් සඳහා එස්.ඩී.ආර්. දස දහසකට නොවැඩි මුදලකට සමාන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක දඩයකට යටත් විය යුතුය.

ගුවන් යානා ආනයනය කිරීම.

**74.** ගුවන් යානයක් ආනයනය කිරීමේ දී:–

(අ) ආනයනය කිරීම සඳහා අදහස් කරනු ලබන ගුවන් යානය 73 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් යටතේ මෙහෙයුම් කරනු ලබන බවට ; සහ

(ආ) තත්කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි නියමයන් අදාළ තැනැත්තා විසින් පිළිපදිනු ලබන බවට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන්නේ නම් මිස ගුවන් යානයක් ආනයනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කිසිදු තැනැත්තකුට අනුමැතිය දෙනු නොලැබිය යුතු ය.

වගකීම් රක්ෂණය.

**75.** (1) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාව තුළට, ශ්‍රී ලංකාවේ සිට හෝ ශ්‍රී ලංකාව හරහා මෙහෙයුම් කිරීම් කරනු ලබන අවස්ථාවෝචිත පරිදි යම් ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් දරන්නකු හෝ විදේශීය ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් දරන්නකු මගින් සිදුවිය හැකි මරණ හෝ ශාරීරික හානි සම්බන්ධයෙන් ද කිසියම් සිදුවීමක් හේතුවෙන් ගමන් මලු, ගුවන් භාණ්ඩ සහ තැපැල් භාණ්ඩ නැතිවීම සම්බන්ධයෙන් ද සහ මගීන්, ගමන් මලු, ගුවන් භාණ්ඩ හෝ තැපැල් භාණ්ඩ ප්‍රවාහනයේ දී සිදුවිය හැකි ප්‍රමාදවීම් සම්බන්ධයෙන් ද තමන්ගේ වගකීම ආවරණය කිරීමට ප්‍රමාණවත් වූ වලංගු රක්ෂණ සහතිකයක් සෑමවිටම තමන් වෙත තබාගත යුතු ය. තව ද, එවැනි තැනැත්තකු විසින්, ගුවන් යානය මගින් පොළොව මත දී හෝ ගුවනේ දී යම් තුන්වන පාර්ශ්වයකට සිදුවිය හැකි අලාභ ආවරණය කිරීම සඳහා, ප්‍රමාණවත් වූ වලංගු රක්ෂණ සහතිකයක් ද, තමන් වෙත තබා ගැනීම නියමිත වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලබන වගකීම් රක්ෂණ ආවරණයේ ප්‍රමාණවත් බව නිශ්චය කිරීම සඳහා ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ විදේශ ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ දරන්නකු විසින් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය :–

(අ) රක්ෂණ වූ පුද්ගලයාගේ සියලු යෝජිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඔහු මත පැවරෙන සියලු ම තථ්‍ය වගකීම් සහ විභව වගකීම් සඳහා සර්වව්‍යාපී ආවරණයක් අදාළ රක්ෂණයෙන් සැපයේ ද යන වග ;

(ආ) ගුවන්යානා ලියාපදිංචි කරන ලද රටෙහි හෝ රක්ෂණය සපයන්නා ඔහුගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යන රටෙහි හෝ රක්ෂණය සපයන්නා පදිංචි ස්ථානය පිහිටි රටෙහි හෝ නීති යටතේ රක්ෂණය සපයන්නාට එවැනි රක්ෂණයක් ක්‍රියාත්මක කිරීමට නිසි පරිදි බලය පැවරී ඇත් ද යන බව සහ ඔහුගේ මූල්‍යමය වගකීම් හැකියාව සනාථ කොට ඇත් ද යන බව ; සහ

(ඇ) ගුවන් යානය මගින්, භූමිය මත දී හෝ ගුවනේ දී හෝ තුන්වන පාර්ශ්වයන්ට සිදුවිය හැකි ජීවිත හානි, ශාරීරික හානි හෝ දේපළ හානි සම්බන්ධයෙන් දැරීමට සිදුවන වගකීම් සඳහා එකී රක්ෂණය මගින් සර්වව්‍යාපී ආවරණයක් සැපයේ ද යන බව.

(3) අදාළ සහතිකය දරන්නා විසින් කරගෙන යනු ලබන මෙහෙයුම්වල විෂය ප්‍රමාණය සහ ස්වභාවය සැලකිල්ලට ගනිමින් ඒ අනුව අවශ්‍ය වන්නා වූ අවම රක්ෂණ ආවරණ සීමා නිශ්චය කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කරනු ලැබිය යුතු ය.

ගුවන් යානා මෙහෙයුම්කරු සහතික සංශෝධනය, අත්හිටුවීම සහ අවලංගු කිරීම.

**76.** (1) ගුවන්යානා මෙහෙයුම්කරුවකුහට නිකුත් කර ඇති ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ සංශෝධනය කරන ලෙස අදාළ සහතිකය දරන්නා විසින් ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, එය සංශෝධනය කිරීම උචිත යයි තමන් අදහස් කරන්නේ නම් ඒ සඳහා නියමිත ගාස්තුව අයකර ගැනීමෙන් පසු, ඒ සහතිකය යටතේ ප්‍රදානය කර ඇති වරප්‍රසාද හෝ පනවා ඇති සීමා කිරීම් වෙනස් කරමින් අවස්ථාවෝචිත පරිදි එකී ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකය හෝ විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකය සංශෝධනය කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කළ හැකි වන්නේ ය.

(2) යම් ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් හෝ විදේශ ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකයක් නිකුත් කරනු ලැබුවේ යම් කොන්දේසිවලට යටත්ව ද එකී කොන්දේසි වෙනස් වුවහොත් හෝ එකී සහතිකය දරන්නා එකී සහතිකයේ නිශ්චිතව සඳහන් මෙහෙයුම් විස්තර කිසිවක් හෝ 73 වන වගන්තියේ (5) වන උපවගන්තියේ නියම කොට ඇති කොන්දේසි කිසිවක් හෝ 75 වන වගන්තිය මගින් පනවා ඇති යම් නියමයන් හෝ මේ පනතේ යම් විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග, රීති, ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති හෝ විධාන යටතේ නියම කොට ඇති නියමයන් කිසිවක් හෝ පිළිපැදීමට අපොහොසත් වන්නේ නම් අවස්ථාවෝචිත පරිදි එකී ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකය හෝ විදේශ ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකය ඕනෑම වේලාවක අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත්තේ ය.

බදු, චාටර් ගිවිසුම් හෝ ගුවන්යානා හුවමාරු කර ගැනීමේ හෝ ගිවිසුමක් යටතේ මෙහෙයවනු ලබන ගුවන්යානා

**77.** (1) ශ්‍රී ලංකාව හැර, ප්‍රඥප්තියේ පාර්ශ්වකරුවකු වන්නා වූ වෙනත් රාජ්‍යයක ලියාපදිංචි කරන ලද ගුවන් යානයකට බදු ගිවිසුමක් හෝ චාටර් ගිවිසුමක් හෝ ගුවන් යානා හුවමාරු කරගැනීමේ ගිවිසුමක් හෝ යටතේ හෝ ඒ හා සමාන වෙනත් වැඩ පිළිවෙලක් යටතේ ශ්‍රී ලංකාවේ දී මෙහෙයුම් කරනු ලැබිය හැකි ය. එහෙත් මේ සඳහා ප්‍රඥප්තියේ 83 bis (අතිරේක) ව්‍යවස්ථාව ප්‍රකාර

නිරුපද්‍රිතතා අධීක්ෂණයට සහ ගුවන් යානයේ මෙහෙයුම් කටයුතුවලට අදාළ වගකීම් සහ කාර්යයන් පැවරීම පිළිබඳව ගුවන්යානා ලියාපදිංචි කරන ලද රාජ්‍යයේ ගගන නාවික බලධාරියා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා ගිවිසුමකට එළඹ තිබිය යුතු අතර, මෙවැනි අවස්ථාවක දී මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ පනවන ලද නියෝග කිසිවක් අදාළ වන්නේ එකී ගිවිසුමෙහි නියම කරනු ලබන ප්‍රමාණයට පමණකි.

(2) බදු ගිවිසුමක් හෝ චාටර් ගිවිසුමක් හෝ ගුවන් යානා හුවමාරු කරගැනීමේ ගිවිසුමක් හෝ යටතේ හෝ වෙනත් ඒ හා සමාන වැඩ පිළිවෙලකට අනුගාමීව සම්මුතියේ වෙනත් පාර්ශ්ව රාජ්‍යයක ගුවන් යානා මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයුම් කිරීමට නියමිත ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානයක නිරුපද්‍රිතතා අධීක්ෂණය හා සම්බන්ධ වූ කර්තව්‍ය හා කාර්ය එකී වෙනත් රාජ්‍යයට පවරාදීම කළ හැකි බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන අවස්ථාවක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධිකාරියේ අනුමැතියට යටත්ව එකී කර්තව්‍ය හා කාර්ය එකී වෙනත් රාජ්‍යයට පවරාදීම සඳහා එකී වෙනත් රාජ්‍යයේ ගුවන් බලධාරීන් සමග එකඟවනු ලැබිය හැකි ය.

එවැනි අවස්ථාවක දී එකී වෙනත් රාජ්‍යයට පවරා දෙනු ලබන වගකීම් සහ කාර්යයන්හි ස්වභාවය සහ විෂය ප්‍රමාණය එකී එකඟතා ගිවිසුමෙහි නියම කරනු ලබන ප්‍රමාණයට පමණක් සීමා විය යුතු ය.

(3) වලංගු ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් ඒ වන විටත් දරන මෙහෙයුම්කරුවකු සම්බන්ධයෙන්, මෙහි (1) වන උපවගන්තිය යටතේ පනවන නියමයන් ඒ සඳහා නියම කරනු ලැබිය හැකි කොන්දේසි කිසිවකට යටත්ව තුන් මාසයකට නොවැඩි කාල සීමාවක් සඳහා අත්හැර දැමීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකි වන්නේ ය. එසේ වුවද, යෝජිත වැඩ පිළිවෙල අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය අනුව නිරුපද්‍රිතතාවට අදාළ සියලු ම නියමයන් සපුරාලන්නක් විය යුතු ය.

අන්තරායකාරී ද්‍රව්‍ය ගුවනින් රැගෙන යාම.

**78.** (1) ගුවන් සංතරණයේත්, ගුවන් යානාවන්හි ගමන් කරන තැනැත්තන්ගේත් නිරුපද්‍රිතතාව සාක්ෂාත් කිරීමේ කාර්යය සඳහා, අන්තරායකාරී ද්‍රව්‍ය ගුවනින් ප්‍රවාහනය කිරීමේ දී එම ද්‍රව්‍ය වර්ග කිරීම, ඇසුරුම් කිරීම, ලේබල් යෙදීම, සලකුණු කිරීම, හැසිරවීම සහ ප්‍රවාහනය ආදී කාර්යයන්හි දී සම්පූර්ණ කළ යුතු නියමයන් අදාළ "ප්‍රතිප" යන්ට අනුකූලව නියෝග මගින් නියම කිරීම සහ එකී අන්තරායකාරී ද්‍රව්‍ය හැසිරවීම හෝ ගුවනින් ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමේ දී අය කළ යුතු ගාස්තු ප්‍රමාණයන් නියම කිරීම ද අමාත්‍යවරයා විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(2) ගුවනින් ප්‍රවාහනය කිරීම සඳහා අවසර දී ඇති අන්තරායාකාරී ද්‍රව්‍ය වර්ග කිරීම, ඇසුරුම් කිරීම, ලේබල් යෙදීම, සලකුණු යෙදීම, හැසිරවීම සහ ප්‍රවාහනය ආදී කාර්යයන්හි දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි, හදිසි අවස්ථා කාර්ය පටිපාටි, අන්තරායකාරී ද්‍රව්‍ය හා සම්බන්ධ අනතුරු හා සිදුවීම් විමර්ශනය කිරීමේ පිළිවෙල සහ එවැනි අන්තරායාකාරී ද්‍රව්‍ය තොග හැසිරවීමේ කාර්යයෙහි නිරත වන පුද්ගලයින්ට අවශ්‍ය පුහුණුව, සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ද ඒ වෙනුවෙන් නිකුත් කරනු ලබන විධාන මගින් නියම කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කරනු ලැබිය යුතු ය. මෙම උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන විධාන හෝ මෙම වගන්තිය යටතේ නියම කරනු ලබන නියමයන් කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාත්මක කිරීමේ උපදෙස් කලින් කල නිකුත් කිරීමේ බලය ද අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකි කාර්යය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයකින් පැවරෙන බලය යටතේ හැර, යුද්ධෝපකරණ හෝ වෙනත් යුද්ධ ආම්පන්න කිසිවක් කිසිම ගුවන් යානයකින් ශ්‍රී ලංකා දේශය ඇතුළත ගුවනින් රැගෙන යාම හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානයකින් රැගෙන යාම නොකළ යුත්තේ ය.

(4) මේ වගන්තියෙන් පනවන ලද නියමයන් හෝ මේ වගන්තිය යටතේ පනවනු ලබන නියෝග, විධාන හෝ ක්‍රියාත්මක කිරීමේ උපදෙස් කිසිවකට හෝ අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී එස්. ඩී. ආර්. විසිපන් දහසකට සමාන ශ්‍රී ලංකා රුපියල් සංඛ්‍යාවක දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

ගුවන් මාර්ග නිශ්චය කිරීම.

**79.** (1) සිවිල් ගුවන්යානා විසින් ශ්‍රී ලංකා පියසර තොරතුරු කලාපයට ඇතුළුවීමේ දී, ඉන් පිටවීමේ දී, සංක්‍රමණ අවස්ථාවේ දී හෝ ඒ කලාපය තුළ චලනයක් සිදු කරන අවස්ථාවන්හි දී අනුගමනය කළ යුතු ගුවන් මාර්ග සහ ගුවන් සංතරණ කාර්ය පටිපාටි නිශ්චය කිරීම, සහ ප්‍රසිද්ධ කිරීම අධිකාරිය විසින් ගුවන් ගමන් සේවා සැපයීම සඳහා පත්කරන ලද සේවා සැපයුම්කරුගේ ද සහාය ඇතිව අදාළ "ප්‍රනිප" යන්ටත් කලාපීය ගුවන් සංතරණ සැලැස්මටත් අනුකූලව සිදු කරනු ලැබිය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි අදාළ "ප්‍රතිප" වලට හෝ කලාපීය ගුවන් සංතරණ සැලැස්මට හෝ කරනු ලැබිය හැකි යම් වෙනස්කම් සමග යාවත්කාලභාවය පවත්වා ගැනීම සඳහා එසේ කිරීම අවශ්‍ය වූ විටෙක මෙහි (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කරනු ලබන ගුවන් මාර්ග සංශෝධනය කිරීම අධිකාරිය විසින් කළයුතු වන්නේ ය.

**80.** එකී කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද විශේෂ අවසර පත්‍රයක බලය යටතේ සහ නියමිත ගාස්තුව ගෙවීමෙන් ද පසුව මිස, හා ඒ බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව ද මිස නියමුවකු රහිතව පියාසර කරවිය හැකි යම් ගුවන්යානයක් ශ්‍රී ලංකා දේශය ඇතුළත මෙහෙයවීම සිදු නොකළ යුතු ය. නියමුවන් රහිත ගුවන්යානා.

**81.** (1) ඒ සඳහා නියමිත ගාස්තු ගෙවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලබාගත් විශේෂ අවසර පත්‍රයක බලය යටතේ සහ එකී අන්තර්ගත නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව මිස කිසිදු ගුවන්යානයකින් ශ්‍රී ලංකා දේශය ඇතුළත කරණම් පියසර සිදු කිරීම හෝ පියසර ප්‍රදර්ශන, පියසර තරග, රටා පියසර හෝ ගුවන් සංදර්ශන හෝ පැවැත්වීම සිදු නොකළ යුතු ය. ගුවන් කරණම් පියසර, පියසර ප්‍රදර්ශන, තරග සහ ගුවන් සංදර්ශන.

(2) අදාළ අවසර පත්‍රය නිකුත් කරනු ලබන ක්‍රියාකාරකම් හේතුවෙන් ගුවන් තලයෙහි පියසර නිරුපද්‍රිතතාවටත් පොදු ජනයාගේ සහ දේපළවල නිරුපද්‍රිතතාවටත් හානියක් සිදු නොවන බවට සෑහීමකට පත්වීමෙන් පසු මෙහි (1) වන උපවගන්තියෙහි සඳහන් ක්‍රියාකාරකම් සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කළ හැකි අතර, ඒ මගින් සිදුවිය හැකි අලාභහානි සම්බන්ධයෙන් වගකීම දැරීමට ප්‍රමාණවත් මහජන වගකීම් රක්ෂණයක් ලබාගෙන ඉදිරිපත් කරන ලෙස එවැනි ප්‍රදර්ශන, තරග හෝ රටා පියසර හෝ සංවිධානය කරන සංවිධායකයන්ට තවදුරටත් නියම කළ යුතු ය.

**82.** (1) ගොඩබිම හෝ දිය මත, සිටින යම් පුද්ගලයකුට හෝ තිබෙන යම් දේපළකට හෝ අනවශ්‍ය ලෙස අනතුරකට මුහුණ පෑමට සිදුවන පරිදි කිසියම් ගුවන් යානයක් පියාසර කරවූ අවස්ථාවක— අන්තරායකාරී පියසර මෙහෙයුම්.

(අ) එකී ගුවන් යානයේ අණදෙන නියමුවා සහ මෙහෙයුම්කරු; හෝ

(ආ) මෙහෙයුම්කරුවකු නොමැති අවස්ථාවක අණදෙන නියමුවා සහ ගුවන්යානයේ හිමිකරු,

මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර එසේ වරදකරුවන් කිරීමේ දී එස්. ඩී. ආර්. විසිපන්දහසකට සමාන ශ්‍රී ලංකා රුපියල් සංඛ්‍යාවක දඩයකට හෝ වර්ෂ දෙකකට නොවැඩි කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) අදාළ ගුවන්යානය (1) වන උපවගන්තියේ සඳහන් ආකාරයට පියාසර කරවා ඇත්තේ තම දැනුම හෝ අනුමැතිය නොමැතිව බව අධිකරණය සෑහීමකට පත්වන ආකාරයට ඔප්පු කිරීමට එහි මෙහෙයුම්කරුට හෝ හිමිකරුට හැකිවන විටක (1) වන උපවගන්තියේ සඳහන් වරද පිළිබඳව ඒ මෙහෙයුම්කරු හෝ හිමිකරු වගකීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනවා ඇත්තේ, මේ පනතේ සඳහන් පොදු නිරුපද්‍රිතතා විධිවිධාන සහ අනෙකුත් විධිවිධානවලට හෝ මේ පනත යටතේ පනවනු ලැබිය හැකි හෝ නිකුත් කරනු ලැබිය හැකි නම් නියෝග, රීති හෝ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති හෝ කිසිවකට අමතරව මිස ඒ වෙනුවට ආදේශ කිරීමට නොවන බව සැලකිය යුතු ය.

ගුවන්යානයක් තුළ සිදු කරන වැරදි.

**83.** ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලැබූ ගුවන්යානයක් ශ්‍රී ලංකා දේශය ඇතුළත හෝ ඉන් පිටත පියාසර කරමින් සිටිය දී හෝ විදේශීය ගුවන්යානයක් ශ්‍රී ලංකා දේශය ඇතුළත පියාසර කරමින් සිටිය දී—

(අ) ගුවන් සේවක පිරිසේ සාමාජිකයකුට පහර දීම, එවැන්නකු ප්‍රකෝප කරවීම, තර්ජනය කිරීම හෝ වෙනත් ඒ හා සමාන ක්‍රියාවක් සිදුකිරීම;

(ආ) ගුවන්යානයේ හෝ ඒ තුළ සිටින මගීන්ගේ හෝ නිරුපද්‍රිතතාව හෝ සුරක්ෂිතතාව හෝ කෙරෙහි බලපෑම් ඇතිකරවන කිසියම් කරුණක් සම්බන්ධයෙන් අණදෙන නියමුවා විසින් හෝ ඔහු වෙනුවෙන් ගුවන් සේවක පිරිසේ සාමාජිකයකු විසින් හෝ දෙනු ලබන නීත්‍යානුකූල උපදෙසක් පිළිපැදීම ප්‍රතික්ෂේප කිරීම;

(ඇ) ගුවන්යානය තුළ සිටින යම් වෙනත් මගියකුට පහර දීම, ප්‍රකෝප කරවීම හෝ එවැනි මගියකුට තර්ජනය කිරීම;

(ඈ) ගුවන්යානයේ යම් කොටසක හෝ අංශයක දුම්පානයේ යෙදී සිටීම;

(ඉ) ගුවන්යානයට හෝ එහි කිසියම් කොටසකට හෝ හිතාමතා අලාභහානි සිදු කිරීම හෝ ඒවා විනාශ කිරීම;

(ඊ) කිසියම් ආකාරයකින් අසභ්‍ය ලෙස හැසිරීම;

(උ) ගුවන්යානය තුළ ස්ථාපනය කර ඇති දුම් පරීක්ෂාකිරීමේ උපකරණයක් හෝ වෙනත් කිසියම් නිරුපද්‍රිතතා උපක්‍රමිකයක් හෝ වෙනස් කිරීම හෝ කඩා බිඳ දැමීම;

(ඌ) එකී ගුවන්යානයට අදාළ නීති අනුව එවැනි ක්‍රියාවක් තහනම්කර තිබිය දී කිසියම් ජංගම ඉලෙක්ට්‍රොනික උපක්‍රමිකයන් ක්‍රියාකරවීම; හෝ

(එ) ගුවන්යානය තුළ ඇති යම් නිරුපද්‍රිතතා හෝ හදිසි අවස්ථා උපකරණයක්, උපක්‍රමිකයක් හෝ ලේඛනයක් හෝ වෙනත් යම් උපකරණයක් හෝ උපක්‍රමිකයක් අණදෙන නියමුවාගේ අනුමැතිය නොමැතිව ඉවත් කිරීම,

එකී ගුවන් යානය තුළ සිදු කරනු ලබන සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේ දී එස්. ඩී. ආර්. විසිපත් දහසකට සමාන ශ්‍රී ලංකා රුපියල් සංඛ්‍යාවක දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

## IXවන පරිච්ඡේදය

## වාණිජ ගුවන් ප්‍රවාහනය

ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රය සහ විදේශීය ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රය.

**84.** (1) මෙම පනතේ 87 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් නිකුත් කරන ලද සහ ඒ කාර්යය සඳහා නියම කරනු ලැබූ ආකෘතියට සැකසූ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයකට අනුකූලව හැර කිසිම පුද්ගලයෙක් ශ්‍රී ලංකාව ඇතුළත දේශීය හෝ ජාත්‍යන්තර වාණිජ ගුවන් ප්‍රවාහන කාර්යයෙහි නිරත නොවිය යුතු ය.

(2) තත්කාර්යය සඳහා නියමිත ආකාරයට අධිකාරිය විසින් 89 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයකට අනුකූලව හැර කිසිම විදේශ ගුවන් යානා මෙහෙයුම්කරුවකු ශ්‍රී ලංකාව තුළට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට හෝ සිදු කරනු ලබන කිසියම් වාණිජ ගුවන් ප්‍රවාහන කාර්යයක නිරත නොවිය යුතු ය.

ගුවන්ගත කටයුතු.

**85.** (1) තත් කාර්යය සඳහා නියමිත ආකාරයට අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයකට අනුකූලව විනා කිසිම පුද්ගලයෙක් ශ්‍රී ලංකා දේශය ඇතුළත ගුවන්ගත කටයුතු කිසිවක් සිදු නොකළ යුතු ය.

(2) නිසි ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකයක් හා ඒ වෙනුවෙන් සාදන ලද රීති මගින් අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන්නා වූ සුදුසුකම් දරන යම් තැනැත්තකු ගුවන්ගත කටයුතුවල නිරතවීම සඳහා (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ ය.

වරප්‍රසාද, කොන්දේසි සහ සීමා පැනවීම්.

**86.** මේ පනත යටතේ නිකුත් කරනු ලබන ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක හෝ විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක, අදාළ ගුවන්යානා මෙහෙයුම්කරුට වාණිජ ගුවන් ප්‍රවාහනයේ නිරත වීමට බලය පවරා ඇති කාර්යයන්ගේ ස්වභාවය සහ විෂය ප්‍රමාණය නිශ්චය කොට දැක්විය යුතු අතර සැපයීමට ඇති සේවාවන්ට අදාළ වරප්‍රසාද, කොන්දේසි සහ සීමා පැනවීම් ද එවැනි බලපත්‍රයක අන්තර්ගත විය යුතු ය.

දේශීය හෝ ජාත්‍යන්තර හෝ වාණිජ ගුවන් ප්‍රවාහනය සඳහා වූ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රය.

**87.** (1) ශ්‍රී ලංකාව මුල් කොටගත් දේශීය හෝ ජාත්‍යන්තර වාණිජ ගුවන් ප්‍රවාහන කටයුතු සඳහා ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් ලබා ගැනීමට පහත සඳහන් තැනැත්තෝ සුදුසුකම් ලබති:—

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ;

(ආ) එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාවේ ඇති, කොටස් ප්‍රාග්ධනයෙන් අවම වශයෙන් 51 % ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට අයත්, ලියාපදිංචි කරන ලද පුද්ගල මණ්ඩලයක් ; හෝ

(ඇ) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක්.

(2) මෙහි (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විටක සහ, ඉල්ලුම්කරු මෙහි (3) වන උපවගන්තිය යටතේ නිශ්චය කර ඇති සුදුසුකම් පිළිපැද ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසු අධිකාරිය විසින් ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් නිකුත් කළ හැකි වන්නේ ය.

(3) පහත සඳන් නියමයන් පිළිපැද ඇති බවට සනාථ කිරීම සඳහා ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් ඉල්ලුම්කරන තැනැත්තකු

විසින් ඉදිරිපත් කළ යුතු තොරතුරු කවරේ ද යන්න අධිකාරිය විසින් ඒ සම්බන්ධයෙන් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය යුතු ය :-

(අ) ඉල්ලුම්කරු, වලංගු ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් දරන බව ;

(ආ) යෝජිත දේශීය වාණිජ ගුවන් ප්‍රවාහන මෙහෙයුම්, යෝජිත සේවා ආරම්භයේ සිට අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා නිත්‍ය වත්කම්, බැංකු ඇප හෝ වෙනත් ආරක්ෂණ හෝ මගින් මූල්‍යමය වශයෙන් ආරක්ෂිතව පවතින බව ;

(ඇ) යෝජිත මෙහෙයුම් නිසා සිදුවිය හැකි අලාභහානි කිසිවක් සම්බන්ධයෙන් වගකීම දැරීම සඳහා 75 වන වගන්තියේ (2) වන උපවගන්තියේ උපමාන මත නිශ්චය කරනු ලබන ප්‍රමාණවත් සහ වලංගු වගකීම් රක්ෂණ ආවරණයක් ඉල්ලුම්කරු සතුව ඇති බව;

(ඈ) සිවිල් ගුවන් සේවාව සමග නීතිවිරෝධී ලෙස මැදිහත්වීම් පවත්නා විටක ඊට එරෙහිව ආරක්ෂාව සඳහා 17 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් සම්පාදනය කරන ලද සිවිල් ගුවන් සේවා ආරක්ෂණ වැඩසටහනට අනුකූලව සකස් කළ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ඵලදායි සුරක්ෂිතතා වැඩසටහනක් ඇති බව;

(ඉ) එකී කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි වෙනත් නියමයන් කිසිවක් ඉල්ලුම්කරු විසින් සපුරනු ලබන බව.

ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ තැනැත්තකුට නිශ්චල දේපළ ප්‍රයෝජනය සඳහා ලබා දිය යුතු බව.

88. (1) අධිකාරිය විසින්, එසේ කිරීම අවශ්‍ය යයි එය විසින් සලකනු ලබන අවස්ථාවක, ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තකුට, ගැසට් පත්‍රයේ පලකරනු ලැබූ නියමයන් මගින් එකී නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි නියමයන් සහ කොන්දේසිවලට යටත්ව එකී බලපත්‍රය යටතේ ශ්‍රී ලංකාවේ දී ගෘහස්ථ සහ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවා සැපයීමේ කාර්යය සඳහා අධිකාරිය සන්තකයේ තිබෙන්නා වූ යම් නිශ්චල දේපළ ප්‍රයෝජනය සඳහා ලබා දිය හැකි වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් දේපළක් ප්‍රයෝජනය සඳහා ලබාදුන්නේ යම් ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් දරන්නකුට ද, එකී තැනැත්තා විසින් නියමයේ දක්වා ඇති නියමයන් හා කොන්දේසි පිළිපැදීම සහ එකී නිශ්චල දේපළ මනා තත්ත්වයෙන් පවත්වාගෙන යාම ද ඔහුගේ කාර්යය වන්නේ ය.

(3) යම් නිශ්චල දේපළක් ප්‍රයෝජනය සඳහා ලබා දෙනු ලැබූ යම් ගුවන් සමාගම් බලපත්‍රයක් දරන්නකු විසින්—

(අ) එවැනි යම් දේපළක් විකිණීම හෝ බැහැර කිරීම නොකළ යුතු ය;

(ආ) අධිකාරියේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව—

(i) එකී දේපළ මත යම් වෙනස් කිරීම් සිදුකිරීම හෝ එකී දේපළෙහි යම් නව ඉදිකිරීම් කිරීම ; හෝ

(ii) එකී දේපළ වෙනත් යම් තැනැත්තකුට බදු දීම,

නොකළ යුතු ය.

විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා සුදුසුකම්.

**89.** (1) අදාළ විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු පහත සඳහන් දේ, එනම්—

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් ලබාගෙන තිබීම ;

(ආ) එකී ගුවන් යානයේ මෙහෙයුම් නිසා පැන නැගිය හැකි වගකීම් ආවරණය කිරීම සඳහා 75 වන වගන්තියේ (2) වන උපවගන්තියේ උපමාන මත නිශ්චය කරනු ලබන ප්‍රමාණවත් වූ ද වලංගු වූ ද රක්ෂණ ආවරණයක් තිබීම ; සහ

(ඇ) සිවිල් ගුවන් සේවාව සමග නීති විරෝධී ලෙස මැදිහත්වීම් වලට එරෙහිව ආරක්ෂාවීම සඳහා 17 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් සකස් කරන ලද ගුවන් සේවා සුරක්ෂිතතා වැඩසටහනට අනුකූලව සකස් වූ ප්‍රමාණවත් ඵලදායි වැඩසටහනක් සකස් කරගෙන තිබීම,

කර ඇත්තේ නම් මිස, යම් තැනැත්තකුට විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(2) විදේශ ගුවන්යානා මෙහෙයුම්කරුවකු විසින් ඒ වෙනුවෙන් ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලුම් පත්‍රයක් මත සහ, ඒ ඉල්ලුම්කරු විසින් පහත සඳහන් දේ, එනම් -

(අ) (1) වන උප වගන්තියෙන් පනවන ලද නියමයන් ; සහ

(ආ) ඉල්ලුම්කරුගේ රාජ්‍යයේ අදාළ ගගන නාවික අධිකාරිය සහ ශ්‍රී ලංකාව අතර ඇතුළත්වනු ලැබූ ගුවන් සේවා ගිවිසුමේ නිශ්චිතව සඳහන් විය හැකි වෙනත් යම් නියමයන්, පිළිපදිනු ලැබ ඇති බවට සෑහීමට පත්වන්නේ නම්,

අධිකාරිය විසින් ඒ විදේශ ගුවන් යානා මෙහෙයුම්කරුට විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් නිකුත් කළ හැකි වන්නේ ය.

පනතේ 85, 87 හෝ 89 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් සංශෝධනය කිරීමේ බලය.

**90.** (1) මෙම පනතේ 85, 87 හෝ 89 වන වගන්ති යටතේ නිකුත් කරන ලද අවස්ථාවෝචිත පරිදි, ගුවන්ගත කටයුතු බලපත්‍රයක්, ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් හෝ විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් හෝ දරන්නකු විසින් ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, සහ ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු, එසේ කිරීම උචිත අවස්ථාවක දී, එවැනි බලපත්‍රයක් සංශෝධනය කිරීම අධිකාරිය විසින් කළ හැකි වන්නේ ය.

(2) දේශයේ ආරක්ෂාව, ගුවන් සංතරණයේ සුරක්ෂිතතාව හෝ සාධාරණ තරගයක් සහතික කිරීමේ කාර්යය හෝ උදෙසා එසේ කිරීම අවශ්‍ය යයි අදහස් කරන ඕනෑම අවස්ථාවක 85, 87 හෝ 89 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් සිය අභිමතය පරිදි අතිරේක කොන්දේසි හෝ සීමාපැනවීම් හෝ ඇතුළත් කරමින් සංශෝධනය කිරීමේ බලය අධිකාරිය සතුව පවත්නේ ය.

පනතේ 85, 87 හෝ 89 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අත් හිටුවීමේ හෝ අවලංගු කිරීමේ හෝ බලය.

**91.** මෙම පනතේ 85, 87 හෝ 89 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් හෝ විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් හෝ ගුවන්ගත කටයුතු බලපත්‍රයක් පහත සඳහන් හේතුන් එකක් හෝ වැඩි ගණනක් මත ඕනෑම අවස්ථාවක දී අත්හිටුවීම හෝ අවලංගු කිරීම අධිකාරිය විසින් කළ හැකි වන්නේ ය:—

(අ) බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් තත්ත්වයක් මත ද ඒ තත්ත්වයන් වෙනස් වී ඇති අවස්ථාවක ;

(ආ) බලපත්‍ර දරන්නා හෝ බලපත්‍ර දරන්නා විසින් මෙහෙයවනු ලබන කිසියම් ගුවන් යානයක් විසින් මේ පනතේ විධිවිධාන හෝ මේ යටතේ පනවා ඇති යම් බලපත්‍රයක අන්තර්ගත නියෝග, රීති හෝ ඒ බලපත්‍රයේ යම් නියමයන් හෝ කොන්දේසි කිසිවක් හෝ පිළිපැදීමට අපොහොසත් වී ඇති අවස්ථාවක ;

(ඇ) බලපත්‍රය දරන්නා, අදාළ ගිවිසුමේ හෝ වැඩපිළිවෙලෙහි යම් නියමයන් හෝ කොන්දේසි හෝ කිසිවක් අනුව කටයුතු කිරීමට හෝ එකී නියමයන් හෝ කොන්දේසි කිසිවක් පිළිපැදීමට හෝ අපොහොසත් වූ අවස්ථාවක ;

(ඈ) විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් දරන්නකු සම්බන්ධයෙන් වන විටක එවැනි බලපත්‍රයක් දරන්නකුට 74 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විදේශ ගුවන්යානා මෙහෙයුම් සහතිකය අවලංගු කොට ඇති අවස්ථාවක ; හෝ

(ඉ) ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවාවන් අතර සාධාරණ තරඟයක් සුරක්ෂිත කිරීමේ හෝ ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා, එසේ කටයුතු කිරීම අවශ්‍ය වන බව හෝ යෝග්‍ය වන බව හෝ අදහස් කරන අමාත්‍යවරයා විසින් කිසියම් බලපත්‍රයක් අත්හිටවන ලෙස හෝ අවලංගු කරන ලෙස හෝ අධිකාරියට නියම කරනු ලබන අවස්ථාවක.

නඩත්තු සේවා සැපයිය යුත්තේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් මත පමණක් බව.

**92.** (1) තත්කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි යම් තැනැත්තකු හැර වෙනත් කිසිදු තැනැත්තකු විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී කාර්යය සඳහා නිකුත් කරනු ලබන අවසර පත්‍රයක බලය යටතේ හැර, යම් ගුවන් ප්‍රවාහන සමාගමකට යම් අලුත්වැඩියා සේවා හෝ නඩත්තු සේවා සැපයීම නොකළ යුතු ය.

(2) ඒ සඳහා නියමිත ගාස්තුව සමග නියමිත ආකෘති පත්‍රයේ ඉල්ලුම් පත්‍රයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත (1) වන උපවගන්තියේ සඳහන් අවසර පත්‍රය ලබාගත හැකි වේ.

(3) ඉල්ලුම්කරුගේ තාක්ෂණික නිපුණතාව සම්බන්ධවත්, ගුවන් ප්‍රවාහන සමාගම් සඳහා නඩත්තු සේවා සැපයීමේ හැකියාව සම්බන්ධවත් සෑහීමකට පත්වීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සම්බන්ධයෙන් අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි නියමයන් සහ කොන්දේසි කිසිවකට යටත්කොට අදාළ අවසර පත්‍රය නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක්, එය නිකුත් කරනු ලබන දිනයේ සිට එක් වර්ෂයක කාලයක් සඳහා වලංගු වන අතර, ඒ කාලපරිච්ඡේදය අවසානයේ දී අලුත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් මත සහ නියමිත අලුත් කිරීමේ ගාස්තුව ගෙවීමේ දී නැවත අලුත් කරනු ලැබිය හැකි ය.

93. (1) ගුවන් යානා මෙහෙයුම්කරුවකු විසින් ඒ සඳහා නියමිත ආකාරයට ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් මගින් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු, විධිමත් කාලසටහනක් රහිත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන කාර්යය සඳහා බලය පැවරීමට හැකි වන්නේ ය :- විධිමත් කාලසටහනක් රහිත ජාත්‍යන්තර ප්‍රවාහනය.

(අ) මහජන සුභ සිද්ධිය සහ විශේෂයෙන් ශ්‍රී ලංකා ජාතික ආර්ථිකයට අත්වන ප්‍රතිලාභ ; සහ

(ආ) එවැනි බලය පැවරීමක් නිසා අදාළ පියසරයේ ආරම්භක සහ ගමනාන්ත ස්ථාන අතර සිදු කෙරෙන විධිමත් ගුවන් ප්‍රවාහනය කෙරෙහි ඇතිවිය හැකි අහිතකර බලපෑම් කිසිවක්.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක්, එහි නිශ්චිතව සඳහන් කරනු ලබන නියමයන් සහ කොන්දේසි වලට යටත් විය යුතු අතර, එය නිකුත් කරනු ලබන දිනයේ සිට එක් වර්ෂයකට නොවැඩි කාලයක් සඳහා වලංගු විය යුතුය. ඒ සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත සහ නියමිත අලුත් කිරීමේ ගාස්තුව ගෙවීමෙන් පසු එවැනි බලපත්‍රයක් අලුත් කිරීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්, එවැනි අවසර පත්‍රයකට නිශ්චිතව සඳහන් නියමයන් සහ කොන්දේසි කිසිවක් උල්ලංඝනය කිරීමේ හේතුව මත අවස්ථාවෝචිත පරිදි අත්හිටවනු හෝ අවලංගු කරනු හෝ ලැබිය හැකි ය.

94. (1) ගුවන් මගීන්ගේ සහ ගුවන් යානා භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සහතික කිරීමේ කාර්යය සඳහා මගීන්, ගමන් මලු, භාණ්ඩ සහ තැපැල ප්‍රවාහනය කිරීමට අදාළ කොන්දේසි සම්බන්ධවත්, ගුවන් යානාවන්ට ඇතුළුවීම අහිමිවීම සහ වෙනත් ගැටළු පිළිබඳව දැරිය යුතු වගකීම සම්බන්ධවත් මේ පනතේ මේ කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍ර හෝ අවසරපත්‍ර දරන්නකුට හෝ එවැනි වර්ගයකට විධාන, උපදෙස් හෝ කාර්ය පටිපාටි හෝ නිකුත් කිරීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි වන්නේ ය. ගුවන් යානා මගීන් සහ ගුවන් යානා භාවිතා කරන්නන් ආරක්ෂා කිරීම.

(2) එවැනි යම් විධානයක්, උපදෙසක් හෝ කාර්ය පටිපාටියක් හෝ නිකුත් කරනු ලැබ ඇති සියලුම තැනැත්තන් ඊට අනුකූලව කටයුතු කිරීම ඒ තැනැත්තන්ගේ කාර්යය වන අතර එසේ අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම මෙම පනත යටතේ වරදක් වන්නේ ය.

පියසර කාල සටහන්.

**95.** ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් හෝ විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍රයක් හෝ දරන සෑම තැනැත්තෙක්ම, අවස්ථාචෝචිත පරිදි ශ්‍රී ලංකාව ඇතුළත සිදු කරන මෙහෙයුම් සම්බන්ධව හෝ ශ්‍රී ලංකාවට ළඟාවීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත්වීම හෝ සම්බන්ධව යෝජිත පියසර කාල සටහන් නියම කරනු ලබන ආකාරයට අධිකාරියේ අනුමැතිය සඳහා අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවාහන කාර්යයක් නොවන කාර්යයන් සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන ගුවන් යානයක් හෝ ශ්‍රී ලංකා ගුවන් ප්‍රදේශයට ඉහළින් පියාසර කරන ගුවන් යානයක් හෝ සම්බන්ධයෙන් වූ කල්හි, අධිකාරිය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකාරයට අදාළ තොරතුරු ඉදිරිපත් කළ යුතු ය.

වාර වෙන්කර දීම.

**96.** ගුවන් යානාවල ක්‍රමවත් ප්‍රවාහනය සහතික කිරීම සඳහා ගුවන් යානා මෙහෙයුම්කරුවන්ට වාර වෙන්කර දීම සම්බන්ධ විධාන, උපදෙස් හෝ පටිපාටි නිකුත් කිරීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි වන්නේ ය. එකී විධාන, උපදෙස් හෝ පටිපාටි නිකුත් කිරීමේදී විධිමත් කාලසටහනක් සහිත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන කාර්යයන්ට වැඩි සැලකිල්ලක් දැක්විය යුතු ය.

එසේ වුව ද, අධිකාරිය විසින් සියලු ඉල්ලීම් සම්බන්ධයෙන්ම විශේෂ සැලකිලි දැක්වීමෙන් තොරව කටයුතු කළ යුතු ය.

ගුවන් ප්‍රවාහන සේවා බලපත්‍රය.

**97.** (1) අධිකාරිය විසින් ඒ සඳහා නිකුත් කරන ලද ගුවන් ප්‍රවාහන සේවා බලපත්‍රයක බලය යටතේ හෝ එවැනි බලපත්‍රයක නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව හැර, කිසිදු තැනැත්තෙක් ශ්‍රී ලංකාවේ ගුවන් ප්‍රවාහන ව්‍යාපාරයක් කරගෙන නොයා යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ලබාගැනීමට අපේක්ෂා කරන තැනැත්තකුට ඒ සඳහා නියමිත ගාස්තුව ද සමග අධිකාරිය වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකි අතර, ඉල්ලුම්කරු මෙහි (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු කර ඇති බවට අධිකාරිය සෑහීමට පත් වන විටක ඒ තැනැත්තාට බලපත්‍රයක් නිකුත් කිරීම අධිකාරිය විසින් කළහැකි වන්නේ ය.

(3) මේ වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබීම සඳහා ඉල්ලුම්කරුවකු විසින් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා පහත සඳහන් වේ :-

(අ) ප්‍රමාණවත් යටිතල පහසුකම් සහ කාර්ය මණ්ඩල අවශ්‍යතා ;

(ආ) ගුවන් ප්‍රවාහනයට අදාළ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් වූ යථා වගකීම් සහ විභව වගකීම් ඉටුකිරීමට අවශ්‍ය ප්‍රමාණවත් මුල්‍ය සැකැසුම් ; සහ

(ඇ) අනුග්‍රාහකයන් කෙරෙහි වූ මූල්‍යමය වගකීම් ආවරණය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ බැංකු සුරැකුම් හෝ වෙනත් ඇප.

(4) (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරනු ලබන ගුවන් යානා මෙහෙයුම්කරුවකුට, ඒ ඡේදය යටතේ නිශ්චිතව සඳහන් බැංකු සුරැකුම් හෝ වෙනත් ඇප හෝ ඉදිරිපත් කිරීමට නියම කරනු නොලැබිය යුතු ය.

*93 හෝ 97 වගන්ති යටතේ අවසර පත්‍ර හෝ බලපත්‍ර නිකුත් කරනු ලැබූ පුද්ගලයන් විසින් යම් වාර්තා පවත්වාගෙන යා යුතු බව සහ තොරතුරු සැපයිය යුතු බව.*

**98.** (1) අවස්ථාවෝචිත පරිදි 93 හෝ 97 වන වගන්තිය යටතේ බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන පරිදි වාර්තා පවත්වාගෙන යා යුතු අතර කලින් කල අධිකාරිය නියම කරනු ලැබිය හැකි වාර්තා හෝ තොරතුරු අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) 93 හෝ 97 වන වගන්ති යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන්නා විසින් -

(අ) ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද ඒ ව්‍යාපාරය කරගෙන යාම නවත්වා ඇති බවට ;

(ආ) ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය, මේ පනතේ විධිවිධානවලට හෝ පනත යටතේ පනවා ඇති යම් නියෝගයකට හෝ රීතියකට පටහැනිව, අනිසි ලෙස ලබාගෙන ඇති බවට ;

(ඇ) බලපත්‍ර දරන්නා හෝ අවසර පත්‍ර දරන්නා සමාගමක් වන අවස්ථාවක දී, එහි යම් ප්‍රධාන නිලධරයකු හෝ සියලුම ප්‍රධාන නිලධරයන් හෝ සමාගම් ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධ චරිත දූෂණය පිළිබඳ වරදකට වරදකරු හෝ වරදකරුවන් හෝ වී ඇති බවට ;

(ඈ) එවැනි බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් හෝ නිකුත් කිරීම සඳහා නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුව කටයුතු කිරීමට අපොහොසත්ව ඇති බවට ; හෝ

(ඉ) මේ පනතේ මේ කොටසේ විධිවිධාන කිසිවක් හෝ මේ කොටස යටතේ සාදා ඇති නියෝග කිසිවක් හෝ රීති කිසිවක් හෝ උල්ලංඝනය කර ඇති බවට,

අධිකාරිය සෑහීමට පත්වන අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එකී බලපත්‍රය හෝ අවසර පත්‍රය අවලංගු කිරීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි වන්නේ ය.

(3) අවස්ථාවෝචිත පරිදි බලපත්‍රය හෝ අවසර පත්‍රය, අවලංගු නොකළ යුත්තේ මන්දැයි දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත හේතු දක්වන ලෙස නිසි දැන්වීමක් කරනු ලැබීමෙන් පසුව මිස, (2) වන උපවගන්තිය යටතේ, බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් අවලංගු කිරීම යම් තැනැත්තකුට විරුද්ධව නොකළ යුත්තේ ය.

(4) අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් ලිඛිතව බලය පවරන ලද යම් නිලධරයකු විසින් -

(අ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදා ඇති යම් නියෝග හෝ රීති පිළිපදිනු ලබන්නේ ද යන්න නිශ්චය කර ගැනීම සඳහා, අධිකාරිය විසින් තත්කාර්යය සඳහා නිකුත් කර ඇති, අවස්ථාවෝචිත පරිදි යම් බලපත්‍රයකින් හෝ අවසර පත්‍රයකින් හෝ බලය පැවරී ඇති ව්‍යාපාරයක් ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය යටතේ පවත්වාගෙන යන ස්ථානයකට, දිවාකාලයේ දී හෝ රාත්‍රී කාලයේ දී, ඕනෑම යුක්තිසහගත වේලාවක ඇතුළු වී එම ස්ථානය පරික්ෂා කිරීම ; සහ

(ආ) එවැනි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් තබාගත යුතු බවට මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග හෝ රීති යටතේ නියමිත යම් වාර්තා හෝ වාර වාර්තා සහ එකී ව්‍යාපාරයකට අදාළ වෙනත් වාර්තා කිසිවක් පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් ලබා ගැනීම,

කළ හැකි වන්නේ ය.

(5) 93 හෝ 97 වන වගන්ති යටතේ අවස්ථාවෝචිත පරිදි බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් හෝ නිකුත් කරනු ලැබූ යම් තැනැත්තකු මේ පනතේ මේ පරිච්ඡේදයේ විධිවිධාන කිසිවක් හෝ මේ පනත යටතේ පනවා ඇති නියෝග හෝ

රීති උල්ලංඝනය කරන බවට හෝ ඊට පටහැනිව කටයුතු කරන බවට විශ්වාස කිරීමට තරම් ප්‍රමාණවත් හේතු අධිකාරියට පවතින අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයකුගේ අත්සනින් වරෙන්තුවක් ලබාගැනීමෙන් පසු එකී වරෙන්තුවේ නිශ්චිතව සඳහන් යම් ස්ථානයකට ඇතුල් වී එය පරීක්ෂා කර, වරද සිදු කිරීමට අදාළව භාවිතා කරන ලද ටිකට්පත්, තොග පොත් හෝ වෙනත් ලේඛන කිසිවක් අත් අඩංගුවට ගැනීම අධිකාරිය විසින් කළ හැකි වන්නේ ය.

ගුවන් ප්‍රවාහන සමාගම් වෙත නියෝග නිකුත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බලය

**99.** (1) පුද්ගලයන්ගේ පොදු සෞඛ්‍ය හා සුභසිද්ධිය ද, දේපළ ද සිවුපාවුන් හා කුරුල්ලන් ඇතුළත් පරිසරය ද ආරක්ෂා කිරීම අවශ්‍ය බව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවන්හි දී සෞඛ්‍යයට සහ සනීපාරක්ෂාවට අදාළ කාරණා සම්බන්ධයෙන් හෝ ජාතික වශයෙන් සැලකිලිමත් විය යුතු හෝ ජාතික යහපත පිළිබඳ හෝ ජාතික වශයෙන් වැදගත් වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ ගුවන් ප්‍රවාහන සමාගම් වෙත විශේෂ හෝ පොදු නියමයන් නිකුත් කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන යම් නියමයන් අනුව කටයුතු නොකිරීම මේ පනත යටතේ වරදක් වන්නේ ය.

## X වන පරිච්ඡේදය

### වැරදි සහ දණ්ඩන

ලිඛිත ඉල්ලීමක් පිළිපැදීමට අපොහොසත්වීම හෝ සාවද්‍ය තොරතුරු සැපයීම.

**100.** අධිකාරිය විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ මේ පනතේ විධිවිධාන යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝග හෝ රීති හෝ යටතේ කරනු ලබන ලිඛිත ඉල්ලීමක් පිළිපැදීමට අපොහොසත් වන හෝ සාවද්‍ය තොරතුරු හෝ සාවද්‍ය වාර්තාවක් හෝ ඉදිරිපත් කරන හෝ තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබූ කල්හි එස්. ඩී. ආර්. දස දහසකට සමාන වූ ශ්‍රී ලංකා රුපියල් සංඛ්‍යාවක් නොඉක්මවන දඩයකට හෝ වසර දෙකකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

ගුවන් යානයක් තහනමට ගැනීම

**101.** (1) මේ පනත යටතේ ගෙවිය යුතු කිසියම් ගාස්තුවක් හෝ දඩ මුදලක් හෝ ගෙවනු ලැබිය යුතු ගුවන් යානයක හිමිකරු හෝ මෙහෙයුම්කරු හෝ විසින් එකී ගාස්තුව හෝ දඩ මුදල හෝ ඉන් කොටසක් හෝ ඉල්ලා සිටි විටක ගෙවීම ප්‍රතික්ෂේප කරන්නේ නම්

හෝ පැහැර හරින්නේ නම්, වෙනත් කිසියම් නීතියක් යටතේ ලැබීමට තිබෙන වෙනත් ප්‍රතිකර්මයක් කෙරෙහි අගතියකින් තොරව, එසේ ගෙවීමට ඇති මුදල ගෙවන තෙක් අදාළ ගුවන් යානය තහනමකට ගෙන රඳවා තබා ගැනීමේ බලය අධිකාරිය සතු වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගුවන් යානයක් තහනමට ගැනීමේ දී, හෝ අත්අඩංගුවට ගැනීමේ දී හෝ රඳවා තබා ගැනීමේ දී අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන පරිදි දැරීමට සිදුවන වියදම අදාළ ගුවන් යානයේ හිමිකරු විසින්, මෙහෙයුම්කරු විසින් හෝ අණදෙන ගුවන් නියමුවා විසින් ගෙවිය යුතු අතර, එය දින දාහතරක් (14) ඇතුළත ගෙවනු නොලැබුවහොත් එකී සම්පූර්ණ මුදල අයකර ගැනීම සඳහා අදාළ ගුවන් යානය විකුණා දැමීමේ බලය අධිකාරිය සතුවේ. අදාළ ගුවන් යානය එසේ විකුණා දමා වියදම පියවා ගැනීමෙන් පසු ඉතිරිවන මුදලක් වෙතොත් එම ඉතිරිය, අවස්ථාචෝචිත පරිදි ගුවන් යානය හිමිකරුගේ, මෙහෙයුම්කරුගේ හෝ අණදෙන ගුවන් නියමුවාගේ හෝ ඉල්ලීම මත එකී ගුවන් යානය හිමිකරුට, මෙහෙයුම්කරුට හෝ අණදෙන ගුවන් නියමුවාට ගෙවනු ලැබිය හැකිය. වසර දෙකක කාල පරිච්ඡේදයක් ඇතුළත එවැනි ගෙවීමක් කරන ලෙස ඉල්ලීමක් නොලැබුණහොත්, අතිරික්තයක් ලෙස, ඉතිරිවන මුදල අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

නිරුපද්‍රිතතා විධිවිධාන හෝ සුරක්ෂිතතා විධිවිධාන හෝ උල්ලංඝනය කිරීම වරදක් බව.

**102.** (1) ගගන නාවික සේවා සැපයීමේ හෝ ගුවන් යානයක් මෙහෙයුම් කිරීමේ හෝ කාර්යයෙහි නිරතව සිටින සෑම තැනැත්තෙක් ම මෙම පනතේ නියම කර ඇති ආකාරයට ගගන නාවික සේවා සැපයීමට හෝ ගුවන් යානයක් මෙහෙයුම් කිරීමට හෝ අදාළ, එවකට පවත්නා නිරුපද්‍රිතතා විධිවිධානයන්ට හෝ සුරක්ෂිතතා විධිවිධානයන්ට හෝ අනුකූලව කටයුතු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියම කරන ලද නිරුපද්‍රිතතා හා සුරක්ෂිතතා නියමයන්ට අනුකූලවීමට නියම කරනු ලැබූ සහ එසේ අනුකූලවීමට අපොහොසත් වූ සෑම තැනැත්තකුම, නියම කරනු ලැබ ඇති පරිදි වූ දඩ මුදලක් ගෙවීමට යටත් විය යුතු ය. එසේ වුව ද, ඒ දඩ මුදල එස්. ඩී. ආර්. දස දහසකට සමාන ශ්‍රී ලංකා මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ පනවනු ලබන සියලුම දඩ මුදල් එක්රැස් කිරීමේ වගකීම අධ්‍යක්ෂ ජනරාල්වරයා මත පැවරෙන අතර, එසේ එක්රැස් කරනු ලැබූ මුදල් අරමුදලට බැර කළ යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (2) වන උපවගන්තියේ සඳහන් දඬ මුදල පනවනු ලබන අවස්ථාවේ දී, දඬ මුදලට යටත්වූ තැනැත්තා විසින් උල්ලංඝනය කරනු ලැබූ නිරුපද්‍රිතතා සහ සුරක්ෂිතතා පියවර, නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත නිසි අයුරින් පිළිපැදීම සාක්ෂාත් කිරීම පිණිස අවශ්‍ය නිසි සහ උචිත පියවර ගන්නා ලෙස එකී තැනැත්තාට ලිඛිතව නියම කරනු ලැබිය යුතු ය.

(5) යම් නිරුපද්‍රිතතා සහ සුරක්ෂිතතා පියවර (4) වන උපවගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කාලය තුළ නිසි අයුරින් පිළිපැදීම සාක්ෂාත් කිරීම පිණිස යම් පියවර ගැනීමට නියමිත යම් තැනැත්තකු විසින් එවැනි පියවර එසේ ගැනීමට අපොහොසත්වන හෝ නොසලකා හරිනු ලබන හෝ අවස්ථාවක දී, එකී තැනැත්තාට නිකුත් කරනු ලැබූ යම් බලපත්‍රයක් අවස්ථාවෝචිත පරිදි අධිකාරිය විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අත්හිටුවිය යුතු ය; නැතහොත් අවලංගු කළ යුතු ය.

103. (අ) මේ පනතේ කිසියම් විධිවිධානයක් හෝ, ඒ යටතේ පනවන ලද කිසියම් නියෝගයක් හෝ රීතියක් උල්ලංඝනය කරන හෝ එවැන්නකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින ; හෝ වැරදි.

(ආ) මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද කිසියම් නියෝගයක් හෝ රීතියක් හෝ යටතේ, නිකුත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියක්, මගපෙන්වීමක්, විධානයක්, ක්‍රියාපටිපාටියක් හෝ උපදෙසක් හෝ පිළිපැදීම පැහැර හරින ; හෝ

(ඇ) මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක්, නියමක්, ප්‍රමිතියක් හෝ කාර්ය පටිපාටියක් හෝ යටතේ තමන් වෙත පැවරී ඇති බලතල සහ කාර්ය ක්‍රියාත්මක කරන පුද්ගලයකුට බාධා කරන හෝ අවහිර කරන හෝ,

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමෙන් පසු එස්.ඩී.ආර්. විසිපන්දහසකට සමාන ශ්‍රී ලංකා රුපියල් සංඛ්‍යාවක් නොඉක්මවන දඩයකට හෝ වසර දෙකකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ වරදකරු විය යුත්තේ ය.

දණ්ඩන.

**104.** මේ පනත මගින් දණ්ඩනයක් ප්‍රකාශිතව සලසා නොමැති වරදකට මේ පනත යටතේ වරදකරු වන තැනැත්තන්, එසේ වරදකරු බවට තීන්දු කිරීමෙන් පසු එස්.ඩී.ආර්. දස දහසකට සමාන ශ්‍රී ලංකා රුපියල් සංඛ්‍යාවක් නොඉක්මවන දඩයකට හෝ වසර දෙකකට නොවැඩි දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුත්තේ ය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි.

**105.** මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද කිසියම් නියෝගයක් හෝ නීතියක් හෝ යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරන ලද විටක—

(අ) එකී පුද්ගල මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයක් නම් ඒ වරද සිදුකරන අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු වශයෙන්, සාමාන්‍යාධිකාරී වශයෙන්, ලේකම් වශයෙන් හෝ ඒ හා සමාන නිලයක් දරන්නකු වශයෙන් සිටි සෑම තැනැත්තකුම, හෝ

(ආ) එකී පුද්ගල මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයක් නොවන විටක, ඒ වරද සිදු කරන අවස්ථාවේ ඒ මණ්ඩලයේ සභාපති, කළමනාකරු, ලේකම් හෝ ඒ හා සමාන නිලයක් දරන්නකු වශයෙන් සිටි සෑම තැනැත්තකු ම හෝ,

එකී වරද සිදුකර ඇත්තේ තම දැනුම රහිතව බව හෝ එකී වරද සිදු කිරීම වලක්වාලීමට තමන්ට හැකි සෑම උත්සාහයක් ම දරන ලද බව හෝ ඔප්පු කරන්නේ නම් මිස ඒ වරදට වරදකරුවකු ලෙස සලකනු ලබන්නේ ය.

ලේඛන ඔප්පු කිරීම.

**106.** (1) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් මගින් හෝ යටතේ හෝ යම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති මගින් හෝ යටතේ අවස්ථාවෝචිත පරිදි අමාත්‍යවරයා විසින්, අධිකාරිය විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සාදන ලද හෝ නිකුත් කරන ලද සහ ඔවුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද යම් නියමයක් හෝ සාධන පත්‍රයක් ලෙස සැලකෙන සෑම ලේඛනයක් ම සාක්ෂි වශයෙන් පිළිගත යුතු අතර, එසේ නොවේ යයි ඔප්පු කරන තුරු, අවස්ථාවෝචිත පරිදි අමාත්‍යවරයා විසින්, අධිකාරිය විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ නිකුත් කරන ලද නියමයක් හෝ සාධන පත්‍රයක් හෝ වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(2) මෙහි (1) වන උපවගන්තියේ සඳහන් එවැනි නියමයක් හෝ සාධන පත්‍රයක් හෝ පිළිබඳ සාක්ෂි වශයෙන් අවස්ථාවෝචිත පරිදි අමාත්‍යවරයා, අධිකාරිය හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඔවුන් වෙනුවෙන් එකී නියමයේ හෝ සාධන පත්‍රයේ සත්‍ය පිටපතක් වශයෙන් සහතික කරන ලද ලේඛනයක් කිසියම් නීති කෘත්‍යයකදී ඉදිරිපත් කළ හැකිය.

මේ පනත යටතේ වැරදි සංඥේය වැරදි විය යුතු බව සහ වැරදි සම්බන්ධයෙන් නඩු පැවරිය යුතු අධිකරණ.

**107.** (1) මේ පනත යටතේ වූ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ වූ සියලු වැරදි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්යය සඳහා සංඥේය වැරදි වන්නේ ය.

(2) මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ යටතේ හෝ වූ යම් වරදක් නීතිපතිවරයාගේ අවසරය ඇතිව මිස, කිසිදු අධිකරණයක් විසින් සංඥේය වරදක් ලෙස නොසැලකිය යුතු ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ හෝ යම් වෙනත් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ යටතේ හෝ කරන ලද වරදක් සම්බන්ධයෙන් වූ නඩුවක් අවස්ථාවෝචිත පරිදි නීතිපතිවරයාගේ නියෝගය මත කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ හෝ අධිචෝදනා පත්‍රයක් මත, කොළඹ අධිකරණ කලාපය තුළ පවත්වන ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ හෝ පවරනු ලැබිය යුතු අතර වරදකරු කිරීමේ දී එකී වරද සිදුකිරීම සම්බන්ධයෙන් මේ පනතේ සඳහන්ව ඇති ආකාරයට දඬුවම් පැනවිය යුතු ය.

අයුතු ඇතුළුවීම, හිරිහැර කිරීම සහ අලාභයට වගකීම.

**108.** (1) යම් ගුවන් යානයක් යම් දේපළකට ඉහළින් සුළඟ, කාලගුණය සහ ඒ කටයුත්තේ සියලු පරිවේෂණීය කාරණා සැලකිල්ලට ගැනීමේදී සාධාරණ යයි සලකනු ලැබිය හැකි උසකින් පියාසර කරන කල්හි මේ පනතේ විධිවිධාන හෝ මේ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝග, රීති, ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති, විධි, නියෝග, විධාන හෝ, කාර්ය පටිපාටි උපදෙස්, යථා පරිදි පිළිපැද ඇත්නම් ඒ පියසැරිය නිසාම හෝ ඒ පියසැරියේදී සාමාන්‍යයෙන් සිදුවිය හැකි යම් සිද්ධියක් නිසාම හෝ පමණක් ඒ ගුවන් යානයේ හිමිකරුට එරෙහිව නඩු කටයුත්තක් ඇති නොවන්නේ ය.

(2) පියසැරියේ යෙදෙන, ඉගිලුමක් සිදුකරන හෝ ගොඩබැසීමක් සිදුකරන යම් ගුවන් යානයක් මගින් හෝ, එවැනි ගුවන් යානයක් තුළ සිටින පුද්ගලයින් මගින් හෝ එවැනි ගුවන් යානයකින් පතිත වන කිසියම් පුද්ගලයකු නිසා හෝ ද්‍රව්‍යයක් නිසා හෝ භූමිය මත හෝ දියමත කිසියම් පුද්ගලයකුට හෝ දේපළකට හෝ යම් සැලකිය යුතු හානියක් හෝ පාඩුවක් හෝ සිදු වී ඇති අවස්ථාවක, එකී හානිය හෝ පාඩුව එය විඳි තැනැත්තාගේ නොසැලකිලිමත්කම නිසා සිදුවූයේ නම් හෝ ඒ තැනැත්තා ඒ සඳහා දායක වූයේ නම් හෝ හැර, එවැනි හානියක් හෝ පාඩුවක් සම්බන්ධයෙන්, නොසැලකිලිමත්කම හෝ චේතනාව හෝ වෙනත් නඩු නිමිත්තක් ඔප්පු කිරීමකින් තොරව එකී අලාභය හෝ පාඩුව ගුවන් යානයේ හිමිකරු විසින් හිතාමතා කළ ක්‍රියාවකින් හෝ නොසැලකිලිමත්කම හෝ පැහැර හැරීම හෝ නිසා සිදුවූවක් සේ සලකා, ගුවන් යානයේ හිමිකරුගෙන් වන්දි අයකර ගැනීමට හැකි වන්නේ ය:

කෙසේ වුව ද එකී සැලකිය යුතු හානිය හෝ පාඩුව:—

(අ) ශ්‍රී ලංකාවේ බලපැවැත්වෙන අන් නීතියක් යටතේ ගුවන් යානයේ හිමිකරු හැර වෙනත් තැනැත්තකු එවැනි හානි හෝ පාඩු සම්බන්ධයෙන් වන්දි ගෙවීමට බැඳී ඇති; සහ

(ආ) එවැනි වන්දි ගුවන් යානය හිමිකරුගෙන් අයකරගත හැකි වන්නේ හා අයකරනු ලබන්නේ මේ පනතේ විධිවිධාන නිසාම පමණක් ද වන,

අවස්ථාවන් යටතේ සිදු වූ විටෙක ගුවන් යානය හිමිකරුගෙන් එසේ අයකරගනු ලබන වන්දි සම්බන්ධයෙන් එකී හිමිකරුට එකී වෙනත් තැනැත්තන්ගෙන් හානි පූරණය වනු ලැබීමට හිමිකම ඇත්තේ ය.

(3) යම් ගුවන් යානයක්, එහි හිමිකරු විසින් දින දාහතරක (14) ඉක්මවා යන කාලයක් සඳහා වෙනත් තැතැත්තකු හට බද්දට හෝ කුලියට දී ඇති සහ ඒ තැනැත්තා එකී ගුවන් යානයේ අණදෙන නියමුවකු, යාත්‍රිකයකු හෝ ගුවන් සේවක පිරිසට අයත් මෙහෙයුම් සාමාජිකයකු හෝ ගුවන් යානය හිමිකරු යටතේ සේවය කරන්නකු නොවන අවස්ථාවක, මේ වගන්තියේ යෙදී ඇති '' හිමිකරු '' යන යෙදුම කියවිය යුත්තේ සහ වටහා ගත යුත්තේ අදාළ ගුවන් යානය බද්දට හෝ කුලියට ලබා ගත් පුද්ගලයා සම්බන්ධව කෙරෙන යොමු කිරීමක් වශයෙනි.

## XI වන පරිච්ඡේදය

### පොදු කරුණු

**109.** (1) මේ පනත යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්, සහතිකයක්, අවසර පත්‍රයක්, බලය පැවරුමක් හෝ අනුමැතියක් දරන්නකු ශ්‍රී ලංකාවේ ජාතික සුරක්ෂිතතාව කෙරෙහි හෝ ජාතික ආරක්ෂාව කෙරෙහි හෝ තර්ජනයක් වන බව විශ්වාස කිරීමට තරම් ප්‍රමාණවත් හේතු හෝ එවන් කිසියම් බලපත්‍රයක්, සහතිකයක්, අවසර පත්‍රයක්, බලය පැවරුමක් හෝ අනුමැතියක් දරන්නකු ශ්‍රී ලංකාවේ ජාතික සුරක්ෂිතතාව කෙරෙහි හෝ ජාතික ආරක්ෂාව කෙරෙහි හෝ තර්ජනයක් විය හැකි බවට සැක කිරීමට තරම් ප්‍රමාණවත් හේතු අධ්‍යක්ෂ ජනරාල්වරයා හට ඇති අවස්ථාවක, මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක ඇතුළත් යම් විධි විධානයක හෝ මේ පනත යටතේ ප්‍රදානය කර ඇති හෝ නිකුත් කර ඇති එවැනි යම් බලපත්‍රයක, සහතිකයක, අවසර පත්‍රයක, බලය පැවරුමක හෝ අනුමැතියක හෝ ඇතුළත්වන නියමයන් සහ කොන්දේසි කිසිවක් පටහැනිව කුමක් සඳහන් වුව ද යම් බලපත්‍රයක්, සහතිකයක්, අවසර පත්‍රයක්, බලය පැවරුමක් හෝ අනුමැතියක් හෝ ප්‍රදානය කර ඇත්තේ හෝ නිකුත් කර ඇත්තේ හෝ තමන් විසින් වුව ද, අධිකාරිය විසින් වුවද ජාතික සිවිල් ගුවන් සේවා සුරක්ෂිතතාව පිළිබඳ වගකිව යුතු ආණ්ඩුවේ නමෝදිශ්‍ය නියෝජ්‍යායතනය වශයෙන් ක්‍රියා කරමින් වහාම බලපැවැත්වෙන පරිදි එවැන්නක් අවලංගු කිරීමේ බලය, අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

සමහර අවස්ථානුගත තත්වයන් යටතේ බලපත්‍ර ආදිය අවලංගු කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බලය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලපත්‍රයක්, සහතිකයක්, අවසර පත්‍රයක්, බලය පැවරුමක් හෝ අනුමැතියක් අවලංගු කිරීම සම්බන්ධයෙන් 26 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සහ මේ පනතේ 112 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

**110.** මේ පනත යටතේ ප්‍රදානය කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ යම් බලපත්‍රයක්, සහතිකයක්, අවසර පත්‍රයක්, අවසරයක් හෝ අනුමැතියක් යම් සංස්ථාපිත මණ්ඩලයකට හෝ හවුල් ව්‍යාපාරයකට ප්‍රදානය කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ අවස්ථාවක එකී සංස්ථාපිත මණ්ඩලයේ හෝ හවුල් ව්‍යාපාරයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදුවන යම් වෙනසක්, එකී වෙනස සිදුවී සති දෙකක් ඉකුත්වීමට පෙර, අවස්ථාවෝචිත පරිදි එකී බලපත්‍රය, සහතිකය, අවසර පත්‍රය, අවසරය හෝ අනුමැතිය ප්‍රදානය කළ හෝ නිකුත් කළ උචිත අධිකාරියට සංදේශනය කළ යුතු ය.

යම් අධිකාරයක් ප්‍රදානය කරනු ලැබූ සංස්ථාපිත මණ්ඩලයක හෝ හවුල් ව්‍යාපාරයක සිදුවන වෙනස්කම්.

සේවා ගාස්තුවක් පැනවිය යුතු බව.

**111.** (1) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ යම් ගගන නාවික සේවා සැපයීම සඳහා බලය පවරනු ලැබූ සෑම තැනැත්තකුගෙන්ම හෝ ගෘහස්ථ හෝ ජාත්‍යන්තර වාණිජ ගුවන් ප්‍රවාහනයෙහි නියුක්තව සිටින සෑම තැනැත්තකුගෙන්ම හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන අනුප්‍රමාණයක සේවා ගාස්තුවක් වාර්ෂිකව අයකළ යුතු ය. මේ උපවගන්තිය යටතේ පනවනු ලබන සේවා ගාස්තුව, අදාළ බලපත්‍රය නිකුත් කිරීමේ දී ඒ සඳහා අයකරනු ලබන බලපත්‍ර ගාස්තුවට අමතරව අය කළ යුතු අතර මෙම සේවා ගාස්තුවේ හේතුවෙන් බලපත්‍ර ගාස්තුවේ අඩුවීමක් සිදු විය යුතු නොවේ.

එසේ වුව ද, යම් ගගන නාවික සේවා සැපයීමට බලයලත් හෝ ගෘහස්ථ හෝ ජාත්‍යන්තර වාණිජ ගුවන් ප්‍රවාහනයේ යෙදී සිටින්නා වූ හෝ යම් රාජ්‍ය සංස්ථාවක් හෝ ආණ්ඩුව විසින් බහුතර කොටස් සංඛ්‍යාවක් දරනු ලබන යම් සමාගමක් අමාත්‍යවරයා විසින් මේ උපවගන්තිය යටතේ පනවනු ලබන සේවා ගාස්තුවක් ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පනවනු ලබන සේවා ගාස්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවිය යුතු අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තමාට ලැබුණු එකී සියලු ගෙවීම් සම්බන්ධයෙන් විධිමත් වාර්තා පවත්වාගෙන යා යුතු ය. තව ද, එසේ ලබාගත් සියලු මුදල් අරමුදලට බැර කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ තමන් විසින් ගෙවිය යුතුව ඇති සේවා ගාස්තුව ගෙවීම පැහැර හරින සෑම තැනැත්තකුම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමෙන් පසු අධිකරණය මගින් නියම කරනු ලබන වෙනත් යම් දඬුවමකට අමතරව, ඒ තැනැත්තාට මේ පනත යටතේ නිකුත් කර ඇති යම් බලපත්‍රයක් හෝ බලපත්‍ර, හෝ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් වුව ද අත්හිටුවනු ලැබීමට හෝ අවලංගු කරනු ලැබීමට ද යටත් වන්නේ ය.

අභියාචනා කාර්ය පටිපාටිය

**112.** (1) අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධිකාරිය විසින් මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග හෝ රීති යටතේ හෝ දෙන ලද නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තිමත් වන යම් තැනැත්තකුට එවැනි නියෝගයක් හෝ තීරණයක් තමන් වෙත ලැබුණු දිනයෙන් පසු වැඩ කරන දින තිහක් ඉකුත් වීමට පෙර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හැකි වන්නේ ය. මේ වගන්තිය යටතේ තමන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් පිළිබඳ කටයුතු කිරීමේ දී අමාත්‍යාංශයේ ලේකම්වරයා

විසින් අවස්ථාවෝචිත පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් හෝ අධිකාරියෙන් හෝ නිරීක්ෂණ ලබාගත යුතු අතර ඉන් අනතුරුව සුදුසු විමර්ශනයක් පැවැත්වීමෙන් පසු, එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ නියෝගය හෝ තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ කළ යුත්තේ ය.

(2) මෙහි (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගනු ලබන තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන අතර ඊට එරෙහිව කිසිදු අධිකරණයක් වෙත හෝ විනිශ්චය සභාවක් වෙත හෝ අභියාචනයක් ඉදිරිපත් කළ නොහැකි වන්නේ ය.

බලය පැවරුණු තැනැත්තන් සඳහා ප්‍රවේශවීමේ අවසරය.

**113.** මේ පනතේ විධිවිධාන යටතේ හෝ මේ පනත යටතේ සාදනු ලබන යම් නියෝග හෝ රීති යටතේ තමා වෙත පැවරී ඇති බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවේශවීමට අවශ්‍ය කවර හෝ ස්ථානයකට සියලු සාධාරණ වේලාවන් හි ප්‍රවේශවීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සඳහා බලය පවරන ලද යම් තැනැත්තකුට හැකියාව තිබිය යුතු අතර, එවැනි ස්ථානයක දී සොයාගනු ලැබූ යම් ලේඛන පිරික්සා බැලීමට ද බලය ඇත්තේ ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ අධිකාරියේ හෝ යම් නියෝගයක් හෝ තීරණයක් බලාත්මක වීම.

**114.** මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝග හෝ රීති යටතේ, අවස්ථාවෝචිත පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධිකාරිය විසින් හෝ දෙනු ලබන නියෝගයක් හෝ තීරණයක් එකී නියෝගය හෝ තීරණය එය අදාළ වන තැනැත්තා වෙත දැනුම් දුන් දිනයේ දී බලාත්මක විය යුතු අතර, එවැනි නියෝගයකට හෝ තීරණයකට හෝ එරෙහිව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත 112 වන වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත්කොට ඇතත් එය නොතකා ලේකම්වරයා විසින් ඒ සම්බන්ධව තීරණයක් ගන්නාතුරු අඛණ්ඩව බලාත්මකව පවතින්නේ ය.

බලපත්‍ර ආදිය අන් අයට පැවරීම තහනම් කිරීම.

**115.** (1) මේ පනත යටතේ යම් තැනැත්තකුට ප්‍රදානය කරන ලද හෝ නිකුත් කරන ලද බලපත්‍රයක්, සහතිකයක්, අවසර පත්‍රයක්, බලය පැවරුමක් හෝ අනුමැතියක් :-

(අ) වෙනත් යම් තැනැත්තකුට පවරා දිය නොහැක්කේ ය;

(ආ) වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය සඳහා යෙදවිය නොහැක්කේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් බලපත්‍රයක්, සහතිකයක්, අවසර පත්‍රයක්, බලය පැවරුමක් හෝ අනුමැතියක් හෝ වෙනත් තැතැත්තකුට පවරාදීම ශූන්‍ය හා බලරහිත වන්නේ ය.

රාජ්‍ය ආරක්ෂක වැඩ සටහන, ආරක්ෂක දත්ත සමුච්ච සහ සකස් කිරීමේ පද්ධතිය ස්ථාපිත කිරීම.

**116.** (1) අධිකාරිය විසින්, එය විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ ආරක්ෂක දර්ශක, සහ පිළිගත් ආරක්ෂක මට්ටම් ළඟා කර ගැනීම සඳහා පවත්වාගෙන යා යුතු ආරක්ෂක ඉලක්ක ද දක්වමින්, පනත ප්‍රකාර හෝ ඒ යටතේ සාදනු ලබන යම් රීති හෝ නියෝග ප්‍රකාර පවත්වාගෙන යනු ලබන විවිධ සහ බහු ක්‍රියාකාරී ගුවන් සේවා ක්‍රියාකාරකම් අනුසන්ධනීය වැඩසටහනක් තුළට ඒකාබද්ධ කිරීමේ අදහසින්, රාජ්‍ය ආරක්ෂක වැඩසටහනක් ස්ථාපිත කළ යුතු ය.

(2) අධිකාරිය විසින්, මේ පනත සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ අවස්ථාවෝචිත පරිදි අධිකාරිය හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ විසින් එහි හෝ ඔහුගේ හෝ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී එකී අධිකාරියට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලැබෙන සියලු තොරතුරු ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා ආරක්ෂක දත්ත සමුච්ච සහ සකස් කිරීමේ පද්ධතියක් පිහිටුවා පවත්වාගෙන යා යුතුය.

නියෝග

**117.** (1) අමාත්‍යවරයා විසින්, රාජ්‍යයේ ජාතික ආර්ථිකයේ සහ ජාතික ආරක්ෂාවේ යහපත සැලකිල්ලට ගනිමින් නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත හා නියෝග සෑදිය යුතු යයි මේ පනතින් බලය දෙන ලද සියලු කාරණා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියෙන් පවරනු ලැබ ඇති බලතලවල පොදු භාවයට අගතියක් නොවන පරිදි සහ මේ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් විධිවිධානයන්ට යටත්ව, පහත සඳහන් කාරණා කිසිවක් සඳහා හෝ සියල්ල සඳහා හෝ, එකී කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සාදනු ලැබිය හැකි ය :-

(අ) සම්මුතියේ සහ (සම්මුතියට සහ එහි යම් සංශෝධනයකට අදාළව සම්මත කර ගනු ලැබූ) ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අදාළ එහි යම් ඇමුණුමක ද විධිවිධාන ක්‍රියාත්මක කිරීම;

(ආ) ගුවන් යෝග්‍යතා සහතික නිකුත් කිරීම සහ එකී සහතික නිකුත් කිරීමේ දී ඒවා යටත් කරනු ලැබිය යුතු වූ නියමයන් සහ කොන්දේසි නිශ්චිතව සඳහන් කිරීම;

(ඇ) ගගන යාත්‍රාංගන සඳහා බලපත්‍ර නිකුත් කිරීම, ගගන යාත්‍රාංගන පරීක්ෂා කිරීම, නියාමනය සහ පාලනය සහ බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය සඳහා ගගන යාත්‍රාංගන වර්ග කිරීම;

(ඈ) පරීක්ෂණ පැවැත්වීමේ කාර්යය සඳහා ගගන යාත්‍රාංගන තුළට, ගුවන් යානා ගොඩබෑස්වීම් සිදුකරන ස්ථානවලට සහ ගුවන් යානා කර්මාන්තශාලා තුළට ප්‍රවිෂ්ටවීම සහ ගගන යාත්‍රාංගන තුළට අයුතු ලෙස ඇතුල්වීම තහනම් කිරීම;

(ඉ) පුද්ගලයන් ගුවන් සංතරණ කාර්යයන්හි හෝ ඊට සම්බන්ධව හෝ සේවයෙහි යොදවා ගැනීම සහ බලපත්‍රලත් ගගන යාත්‍රාංගනයන්හි ගුවන් යානා පරීක්ෂා කිරීමේ හෝ අධීක්ෂණය කිරීමේ නියුක්තව සිටින තැනැත්තන්ට ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීම;

(ඊ) ශ්‍රී ලංකාවට ඇතුල්වන හෝ ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන ගුවන් යානා, පියසැරියේ දී යටත් වනු ලැබිය යුතු කොන්දේසි සහ ශ්‍රී ලංකාවේ එක් කොටසක සිට ශ්‍රී ලංකාවේ ම තවත් කොටසක් දක්වා පියාසර කිරීමේ දී ගුවන් යානා යටත් වනු ලැබිය යුතු කොන්දේසි නියම කිරීම;

(උ) මගීන් සහ භාණ්ඩ ගුවනින් ප්‍රවාහනය කිරීමේ දී යටත් වනු ලැබිය යුතු කොන්දේසි, සහ වෙනත් වාණිජ, කාර්මික හෝ ලාභ ලැබිය හැකි කාර්යයන් සඳහා ගුවන් යානා පාවිච්චි කිරීමේ දී යටත් වනු ලැබිය යුතු කොන්දේසි ද ගුවනින් ප්‍රවාහනය කිරීම තහනම් කෙරෙන භාණ්ඩ වර්ග ද නිශ්චිතව දැක්වීම;

(ඌ) ගුවන් සංතරණ කාර්යයන් සඳහා යොදාගනු ලබන උපකරණ පාවිච්චිය සමග හෝ එකී උපකරණවල ප්‍රබල භාවය සමග මැදිහත්වීමේ ක්‍රියා වැලැක්වීම සහ එවැනි උපකරණවල පාවිච්චිය සහ ගුවන් යානාවලට අනතුරු සිදුවිය හැකි සලකුණු සහ ආලෝක ප්‍රදර්ශනය කිරීම පාලනය කිරීම සහ තහනම් කිරීම;

(එ) ගුවන් සංතරණ කාර්යයන්හි නිරුපද්‍රිතතාව, කාර්යක්ෂමතාව සහ ක්‍රමවත් භාවය, ගුවන් යානාවන්හි සහ ඒ තුළ රැගෙන යන පුද්ගලයින් සහ දේපළවල නිරුපද්‍රිතතාව, ගුවන් යානා මගින් වෙනත් පුද්ගලයන්ට සහ දේපළවලට සිදු විය හැකි අනතුරු වැළැක්වීම සහ මේ ඡේදයේ නිශ්චිතව සඳහන් කාර්යයන් සඳහා ගුවන් යානා රඳවා තබා ගැනීම;

(ඒ) සිවිල් ගුවන් සේවාවෙහි නිරුපද්‍රිතතා අධීක්ෂණය සහ ඒ හා සම්බන්ධ කාරණා;

(ඔ) අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් ඔහුගේ හෝ ඇයගේ කාර්යයන් ඉටුකිරීමේ දී සිදු වන ලද යම් අනතුරක, සිද්ධියක හෝ පවත්වන ලද පරීක්ෂණයක ඍජු ප්‍රතිඵලයක් වශයෙන් එකී යම් නිලධරයකුට හෝ සේවකයකුට සිදු වූ ජීවිත හානියක් හෝ ශාරීරික තුවාල හෝ සඳහා වන්දි ගෙවීම;

(ඕ) ගුවන් සංතරණ කාර්යයෙහි හෝ ඊට සම්බන්ධ කාර්යයන්හි නියුක්තව සිටින හෝ සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින තැනැත්තන් විසින් ගුවන් සංතරණ කාර්යයන් සඳහා කාලගුණ විද්‍යා තොරතුරු සැපයීම;

(ක) ගුවන් යානා විසින් සහ ඒ තුළ සිටින තැනැත්තන් විසින් හෝ ගුවන් යානා වෙත සහ ඒ තුළ සිටින තැනැත්තන් වෙත, සංඥා සහ වෙනත් පණිවුඩ යැවීම විධිමත් කිරීම;

(ග) සිවිල් ගුවන් සේවා ලාංඡනය සහ ගුවන් සංතරණයට සම්බන්ධ කාර්යයන් සඳහා අමාත්‍යවරයා විසින් ස්ථාපනය කරන ලද වෙනත් යම් ලාංඡනයක් භාවිත කිරීම විධිමත් කිරීම ;

(ජ) තීරු බදු නොගෙවා නීති විරෝධී ලෙස ගුවන් මගින් බඩු ගෙන ඒම සහ ගෙනයාම වැළැක්වීම ;

(ට) මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ යටතේ නිකුත් කිරීමට නියමිත සහතිකයක්, බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක් නිකුත් කිරීම, බලසහිත භාවයට පත් කිරීම, අලුත් කිරීම, දීර්ඝ කිරීම හෝ වෙනස් කිරීම සිදු කළ යුතු ආකාරය සහ ඒ පිළිබඳ කොන්දේසි ද සහ එවැනි යම් ලේඛනයක ආකෘතිය, භාරය සහ එවැනි ලේඛනයක් ඉදිරිපත් කිරීම, අවලංගු කිරීම, අත්හිටුවීම, පිටසන් කිරීම සහ ආපසු භාරදීම ;

(ඬ) ගගන යාත්‍රාංගන සහ ගගන යාත්‍රාංගන තුළ සැපයෙන පහසුකම් පරිහරණය කිරීම වෙනුවෙන් අයකරනු ලැබිය හැකි ගාස්තු විධිමත් කිරීම ;

(ණ) ශ්‍රී ලංකාවට ඉහළින් පියාසර කරන ගුවන් යානාවලින්, ගගන නාවික සේවා ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් හෝ රජය විසින් හෝ ශ්‍රී ලංකාවේ යම් ගගන යාත්‍රාංගනයක් විසින් හෝ සපයනු ලබන වෙනත් පහසුකම් සම්බන්ධයෙන් හෝ අයකරනු ලැබිය හැකි ගාස්තු විධිමත් කිරීම ;

(ත) මේ පනත යටතේ හෝ, ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක් යටතේ යම් සහතිකයක්, බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක් නිකුත් කිරීම, බල සහිත භාවයට පත් කිරීම, දීර්ඝ කිරීම හෝ වෙනස් කිරීම සම්බන්ධයෙන් හෝ ඒ යටතේ නියමිත යම් විභාගයකට හෝ පරීක්ෂණයකට හෝ පෙනී සිටීම සම්බන්ධයෙන් හෝ ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් නියම කිරීම ;

(ද) ගගන යාත්‍රාංගනයක් මත ගුවන් යානා මගින් ඇති කරනු ලැබිය හැකි ශබ්දය සහ කම්පනය විධිමත් කිරීම පාලනය කිරීම; සහ

(න) වාණිජ ගුවන් ප්‍රවාහනය වර්ග කිරීම.

(3) මෙහි ඉහත පවරා දෙන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් පහත සඳහන් කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සිදු කළ හැකිය :–

(අ) විවිධ පංතිවලට අයත් ගුවන් යානා, ගගන යාත්‍රාංගන, පුද්ගලයන් හෝ දේපළ හෝ සම්බන්ධයෙන් ද, විවිධ අවස්ථා සහ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ සම්බන්ධයෙන් ද විවිධ වූ විධි විධාන සැදීම කළහැකි අතර, එහෙත් මෙහි දී හැකිතාක් දුරට, එක් ගුවන් ප්‍රවාහන ව්‍යාපාරයක් විසින් කුලී නියමයන් මත මෙහෙයවනු ලබන ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානා සහ තවත් එවැනිම ගුවන් ප්‍රවාහන ව්‍යාපාරයක් විසින් සමාන අවස්ථාවන් යටතේ මෙහෙයවනු ලබන එවැනි ම වූ ගුවන් යානා අතර විභේදයක් ඇති නොවන පරිදි එකී විධිවිධාන සැලැස්විය යුතු ය ;

(ආ) කවර ස්ථානයක තිබුණ ද, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සියලුම ගුවන් යානා සම්බන්ධයෙන් එම නියෝග අදාළ කර ගන්නා ආකාරය ;

(ඇ) කවර ස්ථානයක තිබුණ ද, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානයන්හි සිටින හෝ එකී යානයන්හි ගුවන් සේවක පිරිසේ සාමාජිකයන් වූ හෝ තැනැත්තන් විසින් සමහර දේ සිදු කිරීම තහනම් කිරීම හෝ පාලනය කිරීම ; සහ

(ඈ) මේ පනතේ විධිවිධාන යටතේ අවසරලත් සේවක පිරිස් නොවන වෙනත් තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලැබූ ගුවන් යානයකට අදාළව යම් දෙයක් කිරීම තහනම් කිරීම හෝ නියාමනය කිරීම.

(4) මේ පනත යටතේ ගුවන් යානා සම්බන්ධයෙන් සාදනු ලබන නියෝග කිසිවක් මගින්, එකී නියෝග සමග හෝ මේ පනතේ විධිවිධාන කිසිවක් සමග හෝ අනුකූලව කටයුතු කිරීම සාක්ෂාත් කිරීම සඳහා එසේ කිරීම අවශ්‍ය වන කල්හි ගුවන් යානා රඳවාගැනීම පිළිබඳව ද විධිවිධාන සැලැස්විය හැකි අතර එවැනි රඳවාගැනීම් සහතික කර ගැනීම සඳහා අවශ්‍ය වන බව හෝ යෝග්‍ය වන බව හෝ අමාත්‍යවරයාට පෙනී යන වැඩිමනත් විධිවිධාන කිසිවක් ද සැලැස්විය හැකි ය.

මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

118. පහත සඳහන් කාරණා සියල්ල හෝ කාරණා කීපයක් හෝ සඳහා ද, ඒ කාරණා සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විමසා නියෝග පැනවීම, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් කළ හැකි වන්නේ ය :–

(අ) ගුවන් යානා මගින් ගමන් කිරීම සඳහා මගී ප්‍රවේශ පත්‍ර විකිණීම සහ ගුවන් යානා මගින් ගමන් කිරීම සඳහා ආසන වෙන් කිරීම ;

(ආ) ගුවන් යානා මගින් අපනයනය කෙරෙන භාණ්ඩවලින් ගුදම් බඩු ගාස්තු අය කිරීම;

(ඇ) එවැනි භාණ්ඩ තොග ප්‍රවාහනය කිරීමේ කොන්ත්‍රාත්තුව ශ්‍රී ලංකාවේ දී සකස් කර ගත් අවස්ථාවන්හි දී ගුවන් යානා මගින් ආනයනය කෙරෙන භාණ්ඩවලින් අය කළ යුතු ගුදම් බඩු ගාස්තු අනුප්‍රමාණ නිශ්චය කිරීම ;

(ඇ) 117 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව කටයුතු කරනු ලබන බව සහතිකවීම පිණිස අවශ්‍ය විය හැකි වූ පහත දැක්වෙන විස්තර ද ඇතුළත් සියලු විස්තර ප්‍රකාශ සහ ප්‍රකාශ 99 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර දරන්නන් විසින් ඉදිරිපත් කරනු ලැබීම :–

(i) එකී නිකුත් කිරීම සම්බන්ධයෙන් මුදල් අය කිරීමක් සම්බන්ධ වුව ද, නොවුව ද කිසියම් මාසයක් තුළ නිකුත් කරන ලද ප්‍රවාහන ලියවිලි ;

(ii) යම් මාසයක් තුළ මගී ප්‍රවේශ පත්‍ර අලෙවියෙන් සහ ගුදම් බඩු ගාස්තු අයකිරීමෙන් රැස් කරගත් සම්පූර්ණ මුදල් ප්‍රමාණය ;

(iii) ශ්‍රී ලංකාව තුළ දී නිකුත් කරන ලද ගුවන් ප්‍රවාහන ලියවිලි වෙනුවෙන් කරන ලද ආපසු ගෙවීම්.

117 සහ 118 වන වගන්ති යටතේ පනවනු ලබන නියෝග ගැසට් පත්‍රයේ පළ කිරීම.

**119.** (1) මේ පනතේ 117 සහ 118 වන වගන්ති යටතේ අමාත්‍යවරයා විසින් සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන සියලු නියෝග ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එසේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පළ කරනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන ආ යුතු ය. එසේ අනුමත නොකරනු ලබන යම් නියෝගයක් එකී අනනුමතයේ දින සිට අවලංගු වූවා සේ සැලකිය යුතු ය. කෙසේ වුවද ඒ යටතේ පූර්වයෙන් සිදු කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ අවලංගු වූවා සේ සලකනු ලබන්නේ යම් දිනයක සිට ද එකී දිනය පිළිබඳ නිවේදනයක් ද ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති නිකුත් කිරීමේ බලය.

**120.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එසේ කටයුතු කිරීම අවශ්‍ය බව හෝ උචිත බව අදහස් කරන ඕනෑම අවස්ථාවක, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් සම්මුති ව්‍යවස්ථා හෝ මේ පනත යටතේ සාදනු ලබන යම් නියෝග හෝ රීති ඇතුලුව මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි හෝ උචිත යයි තමා විසින් සලකනු ලබන යම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති නිකුත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය තිබිය යුතු ය.

(2) (1) වන උප වගන්තිය යටතේ ක්‍රියාත්මක කිරීමේ විධාන කිසිවක් නියම කරනු ලැබූ සෑම තැනැත්තකුම එකී ක්‍රියාත්මක කිරීමේ විධාන සම්පූර්ණයෙන් සහ දැඩි ලෙස පිළිපැදීම ඒ තැනැත්තන්ගේ කාර්යය වන්නේ ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පොදු හෝ විශේෂ හෝ විධාන නිකුත් කරනු ලැබිය හැකි බව.

**121.** ගගන නාවික සේවාවන් සපයන සියලුම මෙහෙයුම්කරුවන් වෙත සහ බලපත්‍ර දරන්නන් වෙත මහජන ආරක්ෂාව සහ ශ්‍රී ලංකා පුරවැසියන්ගේ සුභසිද්ධිය පවත්වා ගැනීමට සම්බන්ධිත හෝ ඊට අදාළ වූ හෝ කාරණා කිසිවක් සම්බන්ධයෙන් පොදු විධාන හෝ විශේෂ විධාන හෝ නිකුත් කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයා සතුව පවතින අතර එවැනි විධානවලට අනුකූලව කටයුතු කිරීම එකී සියලුම මෙහෙයුම් කරුවන්ගේත්, බලපත්‍ර දරන්නන්ගේත් වගකීම වන්නේ ය.

රීති.

**122.** (1) මේ පනත යටතේ රීති සෑදීමට බලය පැවරී ඇති හෝ එසේ රීති පැනවීමට නියමිත සියලු කාරණා හෝ යම් කාරණා කිසිවක් හෝ සම්බන්ධයෙන් රීති පැනවීමට අධිකාරියට හැකි වන්නේ ය.

(2) (1) වන උප වගන්තිය යටතේ සාදනු ලබන කිසිදු රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, එම අනුමැතිය සම්බන්ධ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන තෙක් වලංගු භාවයට පත් නොවිය යුතු ය.

එස්. ඩී. ආර්. හා සමාන රුපියල් අගය.

**123.** මේ පනත යටතේ සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් දඩයක් නියම කිරීමේ කාර්යය සඳහා එස්. ඩී. ආර්. හා සමාන ශ්‍රී ලංකා රුපියල් සංඛ්‍යාව ගණනය කිරීම එකී දඩය පනවන ලද වරද සිදු කළ දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති එස්. ඩී. ආර්. අගය අනුව නිශ්චය කරනු ලබන රුපියලේ අගය පාදක කොට සිදු වන්නේ ය.

අර්ථනිරූපණය

**124.** (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ පනතෙහි :–

''ගුවන්ගත කටයුතු '' යන්නෙන්, කෘෂිකර්ම, ඉදිකිරීම්, ඡායාරූපකරණය, මිනුම්, නිරීක්ෂණ සහ මුරසංචාර, පිරික්සුම් සහ මුදා ගැනීමේ මෙහෙයුම්, ගුවන් ප්‍රචාරණ, ගුවන් විදුලි හෝ සංදේශන, වා කැළඹුම්, පියසැරි පුහුණු, මල් හෙළීම් සහ හදිසි අවස්ථා මෙහෙයුම් කාර්යයන් සඳහා ගුවන් යානයක් භාවිත කිරීමේ ගුවන් යානා මෙහෙයුම් අදහස් වේ.

''ගගන යාත්‍රාංගනය '' යන්නෙන්, සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ගුවන් යානා ගොඩ බැස්සවීම සහ පිටත් කර යැවීම සඳහා භාවිත කිරීමට අදහස් කරනු ලබන, මායිම් නියම කරන ලද, යම් භූමි හෝ ජල ප්‍රදේශයක් සහ ඒ මත පිහිටි හෝ ඊට අයත් වන හෝ සියලු ගොඩනැගිලි, මඩු, යාත්‍රා, ගොඩබසින පාලම් සහ වෙනත් ඉදිකිරීම් ද අදහස් වේ ;

''ගුවන් සංතරණ පනත '' යන්නෙන්, (365 වන අධිකාරය) වන ගුවන් සංතරණ පනත අදහස් වන අතර ඊට 1992 අංක 55 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත ද ඇතුළත් වන්නේ ය ;

''ගුවන් සංතරණ සේවා '' යන්නෙන්, ගගන නාවික ආධාර සහ ගගන නාවික පහසුකම් අදහස් වේ ;

''ගුවන් ගමන් පාලනය '' යන්නෙන්, –

(අ) (i) ගුවන් යානා අතර ; සහ

(ii) හැසිරීම් ප්‍රදේශය තුළ ගුවන් යානා සහ බාධක අතර,

ගැටීම් වැලැක්වීමේ සහ

(ආ) ගුවන් යානා (ගමන්) ක්‍රමවත් ලෙස ගලායාම පවත්වාගෙන යාම සහ ඉක්මන් කරවීමේ කාර්ය සඳහා,

සපයනු ලබන සේවාවන් අදහස් වේ ;

''ගුවන් යානය '' යන්නෙන්, වාතය භූතලය මත ගැටීමෙන් ඇති කරන ප්‍රතික්‍රියා හැර, වාතයේ වායුගතික ප්‍රතික්‍රියාවන්ගෙන් වායුගෝලය තුළ දී සහාය/පෝෂණය උත්පාදනය කර ගැනීමට හැකි ඕනෑම යන්ත්‍රයක් අදහස් වේ ;

''අධිකාරිය '' යන්නෙන්, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අදහස් වේ ;

''බලය ලත් ආරක්ෂක සේවක පිරිස'' යන්නෙන්, ගුවන් සේවා ආරක්ෂක සේවාවක් සැපයීම සහ පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති, සේවා සපයන්නකු විසින් නඩත්තු කරනු ලබන, ආරක්ෂක සේවාවන්ට අයත් සාමාජිකයන් අදහස් වන අතර ගුවන් තොටුපළ ඇතුළත රාජකාරි ඉටු කරන හෝ එසේ රාජකාරි ඉටු කිරීමට කැඳවන ලද සන්නද්ධ බලකායේ හෝ පොලිස් බලකායේ යම් සාමාජිකයකු ද ඊට ඇතුළත් වන්නේ ය ;

''ගුවන් ප්‍රවාහන ව්‍යාපාරය'' (ගුවන් යානයක මෙහෙයුම්කරුවකු වශයෙන් හෝ ප්‍රධානියකු වශයෙන් හෝ අනුයෝජිතයකු වශයෙන්) ගුවන් යානා මගින් (ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කොට තිබුණ ද, නොතිබුණ ද) ශ්‍රී ලංකා දේශය තුළට හෝ ඉන් පිටතට හෝ සිදු කරනු ලබන පියසරයන් ද ඇතුළුව, ලෝකයේ කවර හෝ පෙදෙසකට, පුද්ගලයින්, භාණ්ඩ හෝ තැපැල ගුවන් යානා මගින් ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රයෝජන ලබාගැනීමට ඉඩප්‍රස්ථා ඇතිකර තිබීම අදහස් වේ ;

''ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත'' යන්නෙන්, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත අදහස් වේ ;

''සම්මුතිය'' යන්නෙන්, පසුව සම්මත කර ගන්නා ලද කිසියම් සම්මුතියක් මගින් හෝ ගිවිසුමක් මගින් හෝ සිදු කරන ලද සංශෝධන සමග කියැවිය යුතු 1944 දෙසැම්බර් මස 7 වන දින චිකාගෝ නගරයෙහි දී අත්සන තැබීම සඳහා විවෘතව තබන ලද ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා ප්‍රඥප්තිය අදහස් වන අතර ඊට අනුබද්ධ කරන ලද ඇමුණුම් ද එම යෙදුමෙහි අර්ථයට ඇතුළත් වන්නේ ය ;

''අන්තරායකාරී ද්‍රව්‍ය'' යන්නෙන්, සෞඛ්‍ය, නිරුපද්‍රිතතාව, දේපළ හෝ පරිසරය කෙරෙහි තර්ජනයක් එල්ල කිරීමට හැකියාව ඇත්තා වූ ද, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් නිකුත් කරන ලද තාක්ෂණික උපදෙස්වල නිශ්චිතව සඳහන් අන්තරායකාරී ද්‍රව්‍ය ලැයිස්තුවෙහි දක්වා ඇත්තා වූ ද හෝ එකී තාක්ෂණික උපදෙස් වලට අනුකූලව අන්තරායකාරී ද්‍රව්‍ය වශයෙන් වර්ග කරන ලද්දා වූ ද ද්‍රව්‍ය හෝ භාණ්ඩ අදහස් වේ ;

''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යන්නෙන්, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 11 වන වගන්තිය යටතේ පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;

''විදේශ ගුවන් යානය'' යන්නෙන්, මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු නොලැබූ ගුවන් යානයක් අදහස් වේ ;

''අරමුදල'' යන්නෙන්, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 12 වන වගන්තියෙන් ස්ථාපිත කරනු ලැබූ අධිකාරියේ අරමුදල අදහස් වේ ;

''බිම් මෙහෙවර සේවා" යන්නෙන්, ගගන යාත්‍රාංගනයකට ගොඩබෑම සඳහාත්, ගගන යාත්‍රාංගනයකින් පිටත්වීම සඳහාත් ගුවන් යානයකට අවශ්‍ය වන්නා වූ ද, ගුවන් ගමන් සේවාවන් නොවන්නා වූ ද සේවාවන් අදහස් වේ ;

''යුද ගුවන් යානය" යන්නෙන්, කුලියක් සඳහා හෝ පරිදාන සඳහා, මගීන් හෝ භාණ්ඩ ප්‍රවාහනය කිරීම හැර වෙනත් කාර්යයන් සඳහා රජය විසින් හෝ රජය වෙනුවෙන් භාවිතා කරනු ලබන හෝ මෙහෙයවනු ලබන ගුවන් යානයක් අදහස් වේ;

" ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තිය" යන්නෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සකස් කරන ලද සහ සම්මත කරන ලද ගුවන් සේවාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අදහස් වේ;

" ගගන නාවික ආධාරක" යන්නෙන්, ගුවන් මාර්ගයක් ඔස්සේ ඇති දෘශ්‍ය සහ අදෘශ්‍ය ආධාරක සහ ගගන යාත්‍රාංගනයකට ළඟාවීම සහ ගොඩ බැස්සවීම සඳහා වූ දෘශ්‍ය සහ අදෘශ්‍ය ආධාරක අදහස් වන අතර ඊට සංදේශන සේවා, කාලගුණ විද්‍යා සේවා සහ ගුවන් ගමන් පාලන සේවා ද ඇතුළත් වේ;

" ගගන නාවික පහසුකම්" යන්නෙන්, ගුවන් යානා නිරුපද්‍රිතතාව යාත්‍රා කරවීම සඳහා සපයනු ලබන පහසුකම් අදහස් වන අතර ඊට දෘශ්‍ය සහ අදෘශ්‍ය ගගන නාවික ආධාරක ද අතුළත් වන්නේ ය;

"මෙහෙයුම්කරු" යන්නෙන්, ගුවන් යානා මෙහෙයුම් කාර්යයෙහි නිරත වී සිටින හෝ එසේ නිරතවීමට ඉදිරිපත් වන තැනැත්තකු, සංවිධානයක් හෝ ව්‍යාපාරයක් හෝ අදහස් වන අතර අදාළ ගුවන් යානය පිළිබඳ පාලනයක් (ගුවන් යානයේ හිමිකරු, බදුකරු වශයෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ) තමන් වෙත ඇතිව හෝ නැතිව හෝ ගුවන් යානයක් මෙහෙයුම් කිරීම සිදු කරවන හෝ ඒ සඳහා බලය පවරන හෝ කිසියම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වන්නේය;

"ගගන යාත්‍රාංගන මෙහෙයුම්කරු" යන්නෙන්, ගගන යාත්‍රාංගනයක් වශයෙන් භාවිත කරන හෝ භාවිත කිරීම සඳහා ලබාගත්, යම් ස්ථානයක් සම්බන්ධයෙන් වූ විට, එම ස්ථානය තුළ ගගන යාත්‍රාංගන ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්නාවූ හෝ

මෙහෙයවන්නා වූ හෝ ඒ සඳහා බලය ලැබූවා වූ හෝ යම් තැනැත්තකු අදහස් වන අතර රජය විසින් හෝ රජය වෙනුවෙන් හෝ පිහිටුවා පවත්වා ගෙන යනු ලබන ගගන යාත්‍රාංගනයක් සම්බන්ධයෙන් වූ කල්හි, ඒ කාර්යය සඳහා පත් කරන ලද සේවා සැපයුම්කරු අදහස් වන්නේය;

"කලාපීය ගුවන් සංතරණ සැලැස්ම" යන්නෙන්, කලාපීය ගුවන් සංතරණ සම්මේලනයක දී රජය විසින් එකඟත්වයට එළඹෙන ලදුව ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ කවුන්සිලය විසින්, අනුමත කරන ලද, ගුවන් මාර්ග, සේවා සහ පහසුකම් පිළිබඳ සැලැස්ම අදහස් වේ;

"ප්‍රනිප" යන්නෙන්, 37 වන ව්‍යවස්ථාව යටතේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ කවුන්සිලය විසින් සම්මත කරන ලද ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් අදහස් වේ;

"එස්. ඩී. ආර්." යන්නෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් අර්ථ නිරූපණය කරන ලද පරිදි විශේෂ ගැණුම් හිමිකම් අදහස් වේ;

"ප්‍රමිති" යන්නෙන් -

(අ) සම්මුතියේ 37 වන වගන්තිය යටතේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් සම්මත කරන ලද සහ ශ්‍රී ලංකාව විසින් ප්‍රඥප්තියේ 38 වන වගන්තිය යටතේ ප්‍රතිවිරෝධයක් ගොනු කර නැති ජාත්‍යන්තර ප්‍රමිති ; සහ

(ආ) සම්මුතියේ 37 වන වගන්තිය යටතේ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් සම්මත කරන ලද සහ ශ්‍රී ලංකාවෙහි යථා පරිදි ක්‍රියාත්මක කර බලාත්මක කර ඇත්තාවූ නිර්දේශිත පරිචයන් ද

අදහස් වේ;

"සම්මුතියෙහි රාජ්‍ය පාර්ශ්වය" යන්නෙන්, සම්මුතිය අනුමත කළ හෝ සම්මුතියට ආසක්ත වූ රාජ්‍යයක් අදහස් වේ ;

"ශ්‍රී ලංකා භූමි ප්‍රදේශය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ ගොඩබිම් ප්‍රදේශය, අභ්‍යන්තර ජලාශ සහ දේශීය සමුද්‍ර තීරය ද අදහස් වන අතර එකී ප්‍රදේශයන්ට ඉහළින් ඇති ගුවන් අවකාශය ද ඊට ඇතුළත් වන්නේ ය.

(2) මේ පනතේ "භාණ්ඩ හෝ ද්‍රව්‍ය" යන්නට කර ඇති යම් සඳහනකට තැපැල සහ සතුන් ද ඇතුළත් වන ලෙස තේරුම් ගත යුතු අතර මේ පනතේ "රට හෝ දේශය" යන්නට කර ඇති යම් සඳහනක් පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, අදාළ රටට හෝ දේශයට හෝ යාව දේශීය සමුද්‍ර තීරයක් තිබේ නම් එකී දේශීය සමුද්‍ර තීරයට කරනු ලබන සඳහනක් ද ඇතුළත් වන ලෙස තේරුම් ගත යුතු ය.

(3) මෙම පනතෙහි "සිවිල් ගුවන් සේවා කාර්යයන් " යන්නෙන් වූ යෙදුමට ශ්‍රී ලංකාව ගුවන් මඟින් ආරක්ෂා කිරීමට සම්බන්ධ කාර්යයන් හැර ගුවන් සංතරණයට සම්බන්ධ සියලුම කාර්යයන් ඇතුළත් වන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**125.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

ඉවත් කිරීමේ සහ ශේෂ කිරීමේ විධිවිධාන.

**126.** (1) (අ) (365 වන අධිකාරය වූ ) ගුවන් සංතරණ පනතේ III වන කොටසේ ඇතුළත් විධිවිධාන හැර, එකී ගුවන් සංතරණ පනතේ ඇති සියලු විධිවිධාන; සහ

(ආ) 1992 අංක 55 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනතේ II වන කොටස හැර, එකී ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනතේ සියලු විධිවිධාන

මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ඉවත් කිරීම නොතකා -

(අ) ඉවත් කරන ලද විධිවිධාන යටතේ යම් අනුයෝජිතයකු වෙත පවරන ලද බලතල ප්‍රකාර එකී අනුයෝජිතයා විසින් කරගෙන යනු ලැබූ ගගන නාවික සේවා සැපයීම හා සම්බන්ධ වූ සියලු ක්‍රියාකාරකම්, එකී අනුයෝජිතයාට 127 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරුවකුගේ තත්ත්වයෙන් උචිත බලපත්‍ර නිකුත් කරන තෙක් එකී අනුයෝජිතයා විසින් දිගටම කරගෙන යනු ලැබිය යුතු ය.

(ආ) ඉවත් කරන ලද කවර හෝ විධිවිධානයක් යටතේ සාදන ලද සහ නියමිත දිනයේ දී බලාත්මකව පවතින සෑම නියෝගයක්ම හෝ නියමයක්ම, එකී නියෝගය හෝ නියමය මේ පනතේ විධිවිධාන හා පටහැනි නොවන තාක්, මේ පනත යටතේ සාදන ලද නියෝගයක් හෝ නියමයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ සාදනු ලබන යම් නියෝගයක් හෝ නියමයක් මගින් සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ කළ හැකි ය;

(ඇ) ඉවත් කරන ලද විධිවිධාන කිසිවක් යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ නිකුත් කරන ලද හෝ වලංගු භාවයට පත් කරන ලද සහ නියමිත දිනයේ දී බලාත්මකව පවත්නා සෑම බලපත්‍රයක් ම හෝ සහතිකයක් ම මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ සහතිකයක් වශයෙන් සැලකිය යුතු අතර, එවැනි බලපත්‍රයක් හෝ සහතිකයක් නිකුත් කරන ලද හෝ වලංගු භාවයට පත් කරන ලද කාල පරිච්ඡේදය අවසන් වන තුරු වලංගුව සහ ක්‍රියාත්මකව පැවතිය යුතු ය;

(ඈ) ඉවත් කරන ලද විධිවිධාන කිසිවක් යටතේ සාදන ලද නියෝගයක් යටතේ ප්‍රදානය කරන ලද සෑම අනුමැතියක් හෝ දෙන ලද සෑම ධුරයක්, බලය පැවරීමක් හෝ කරන ලද සෑම පත්කිරීමක්, නිකුත් කරන ලද සෑම විධානයක්, චක්‍රලේඛයක්, අත්පොතක්, උපදෙසක් සහ නිකුත් කරන ලද වෙනත් යම් ප්‍රකාශයක් හෝ පිහිටුවන ලද යම් මණ්ඩල කිසිවක් මේ පනත යටතේ ප්‍රදානය කරන ලද, දෙන ලද, නිකුත් කරන ලද හෝ පිහිටුවන ලද සේ සැලකිය යුතු අතර වෙනත් ආකාරයකින් අවලංගු කරනතුරු හෝ බලරහිත භාවයට පත්කරනතුරු තවදුරටත් බලාත්මකව පැවතිය යුතු ය;

(ඉ) සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවට පක්ෂව හෝ එරෙහිව, කිසියම් උසාවියක් විසින්, විනිශ්චය සභාවක් විසින් හෝ වෙනත් මණ්ඩලයක් විසින් යම් නඩුවක දී, කාරණයක දී, පටිපාටියක දී හෝ දෙයක දී ඇතුළත් කරන ලද හෝ දෙන ලද තීන්දු ප්‍රකාශයක්, නියෝගයක් හෝ ප්‍රදානයක්, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අධිකාරියට පක්ෂව හෝ එරෙහිව හෝ ඇතුළත් කරන ලද හෝ දෙන ලද තීන්දු ප්‍රකාශයක්, නියෝගයක්, හෝ ප්‍රදානයක් වශයෙන් සලකා ඒ අනුව බලාත්මක කළ යුතුය.

127. (1) මේ පනතේ 6 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (365 වන අධිකාරය වූ) ගුවන් සංතරණ පනතේ 21අ වගන්තිය යටතේ පත්කරනු ලැබූ (මේ පනතේ "ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු" ලෙස හඳුන්වනු ලබන) අනුයෝජිතයා, මේ පනතේ කාර්ය සඳහා සේවා සැපයුම්කරු ලෙස පත් කරනු ලැබිය යුතු අතර, එකී අනුයෝජිතයා විසින් එකී නියමිත දිනයේ දී සැපයීම සඳහා බැඳී සිටි ගගන නාවික සේවා සැපයීමට එකී ව්‍යවස්ථාපිත සැපයුම්කරුට හැකිවන පරිදි මේ පනත යටතේ නිකුත් කිරීමට නියමිත සියලු අදාළ බලපත්‍ර, එකී ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරුට නිකුත් කරනු ලැබිය යුතු ය. මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ තැනැත්තන් මත පනවනු ලබන නියමයන්ට අදාළ මේ පනතේ සියලු විධිවිධාන එකී ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරුට සහ එකී ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(365 වන අධිකාරය වන) ගුවන් සංතරණ පනතේ 21අ වගන්තිය යටතේ පත් කරනු ලැබූ අනුයෝජිතයාට අදාළ විධිවිධාන.

(2) අමාත්‍යවරයා විසින්, ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරුගේ පත්කිරීමට අදාළ වූ නියමයන් ගැසට් පත්‍රයේ පළකිරීමට සැලැස්විය යුතු ය.

(3) (365 වන අධිකාරය වූ) ගුවන් සංතරණ පනතේ 21අ වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ අනුයෝජිතයකුගේ තත්ත්වයෙන් යම් ව්‍යවස්ථාපිත සැපයුම්කරුවකු වෙත පනවනු ලැබ ඇති යම් වගකීම් ඉටුකිරීම සඳහා එකී ව්‍යවස්ථාපිත සැපයුම්කරු වෙත නියම කොට ඇති යම් කාර්යයන්ට මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ එකී ව්‍යවස්ථාපිත සැපයුම්කරුට බලපත්‍ර නිකුත් කිරීම කිසිදු ආකාරයකින් බලපෑම් ඇති නොකළ යුතු ය. නැතහොත් අගතියක් සිදු නොකළ යුතු ය.

128. මේ පනතේ 127 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරුට බලපත්‍ර නිකුත් කිරීමේ දී, යම් ගගන නාවික සේවා හෝ යම් ගගන නාවික සේවා සැපයීම හා සම්බන්ධිත වූ හෝ ඊට ආනුෂංගික වූ සේවා හෝ සැපයීමට ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරුට හැකි වන පරිදි ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරු පත් කරනු ලැබූ දිනය වන විට අනුයෝජිතයකුගේ තත්ත්වයෙන් ඔහුගේ සන්තකයේ තිබූ යම් නිශ්චල දේපළ රඳවා තබාගැනීමට අධිකාරිය විසින් ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරුට ලිඛිතව අවසර දෙනු ලැබිය යුතු ය.

ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරු විසින් දේපළ රඳවා තබා ගැනීම.

**උපලේඛනය** [2 වගන්තිය]

සිවිල් ගුවන් සේවාවේ නිරුපද්‍රිතතාවය, විධිමත්භාවය, කාර්යක්ෂමතාවය සහ ආරක්ෂාවට අදාළ සම්මුතියේ ව්‍යවස්ථා

1 වන ව්‍යවස්ථාව

ස්වාධිපත්‍යය

සෑම රාජ්‍යයකටම, ස්වකීය රාජ්‍යය සතු දේශයට ඉහළින් ඇති ගුවන් අවකාශය සම්බන්ධව සම්පූර්ණ සහ අනන්‍ය ස්වාධිපත්‍යයක් තිබෙන බව ගිවිසුම්ගත රාජ්‍ය විසින් පිළිගනු ලැබේ.

2 වන ව්‍යවස්ථාව

දේශය

මෙම සම්මුතියෙහි කාර්යයන් සඳහා රාජ්‍යයක් සතු දේශය යන්නෙන් ස්වකීය රාජ්‍යයෙහි ස්වාධිපත්‍යය, රාජ්‍යත්වය, ආරක්ෂාව හෝ භාරකාරත්වය හෝ යටතේ පවත්නා භූමි ප්‍රදේශ සහ ඊට යාබද රාෂ්ට්‍රීය සමුද්‍ර තීරයන් සැලකිය යුතු ය.

3 වන ව්‍යවස්ථාව

සිවිල් සහ රාජ්‍ය ගුවන් යානා

(අ) මෙම සම්මුතිය සිවිල් ගුවන් යානාවලට පමණක් අදාළ කරගත යුතු අතර රාජ්‍ය ගුවන් යානාවලට අදාළ කරගත යුතු නොවේ ;

(ආ) යුද කටයුතු, රේගු කටයුතු සහ පොලිස් සේවාවන් සඳහා යොදාගනු ලබන ගුවන් යානා, රාජ්‍ය ගුවන් යානා වශයෙන් සැලකිය යුතු ය ;

(ඇ) ගිවිසුම්ගත රාජ්‍යයක් සතු කිසිම රාජ්‍ය ගුවන් යානයක්, විශේෂ එකඟත්වය මත හෝ වෙනත් ආකාරයකින් ලබාගත් බලයක් මත හෝ එහි නියමයන්ට අනුකූලව විනා වෙනත් ගිවිසුම්ගත රාජ්‍යයක් සතු දේශයට ඉහළින් පියාසර කිරීම හෝ එම දේශය මත ගොඩ බැස්සවීම හෝ සිදු නොකළ යුතු ය ;

(ඈ) ස්වකීය රාජ්‍ය ගුවන් යානා සම්බන්ධයෙන් නියෝග පැනවීමේ දී සිවිල් ගුවන් යානා සංතරණයෙහි නිරුපද්‍රිතතාවය කෙරෙහි නිසි සැලකිල්ල යොමු කිරීමට ගිවිසුම්ගත රාජ්‍ය විසින් පොරොන්දු වනු ලැබේ.

3 වන ව්‍යවස්ථාව. bis

(අතිරේක)

(අ) පියසැරියේ යෙදී සිටින සිවිල් ගුවන් යානාවලට එරෙහිව අවි භාවිතයට යොමුවීමෙන් සෑම රාජ්‍යයක්ම වැලකිය යුතු බව ගිවිසුම්ගත රාජ්‍යයන් විසින් පිළිගනු ලබන අතර, යම් බාධාකිරීමක

දී ගුවන් යානයේ සිටින තැනැත්තන්ගේ ජීවිතවලට සහ ගුවන්යානයට ද කිසිදු අනතුරක් සිදුනොවිය යුතු ය. මේ විධිවිධානය, එක්සත් ජාතීන්ගේ චාටර් පත්‍රයේ දක්වා ඇති අයිතීන් සහ බැඳීම් කවර ආකාරයකින් හෝ මද වශයෙන් වෙනස් කිරීමක් සිදුකරන බව අර්ථ නිරූපණය නොකළ යුතු ය ;

(ආ) සෑම රාජ්‍යයකටම තම ස්වාධිපත්‍යය ක්‍රියාත්මක කිරීමේ දී, අවසර නොමැතිව තම දේශ භූමියට ඉහළින් පියාසර කරන ගුවන් යානයක්, යම් නියමිත ගුවන් තොටුපළකට ගොඩබැස්සවීමට අවශ්‍ය කිරීමට හෝ එකී ගුවන් යානය මේ සම්මුතියේ ඉලක්ක හා අනනුකූලවන්නා වූ යම් කාර්යයන් සඳහා භාවිත කරන බවට තීරණය කිරීමට යුක්ති සහගත හේතු ඇත්තේ නම් එකී උල්ලංඝනය කිරීම නැවැත්වීම සඳහා එකී ගුවන් යානයට යම් වෙනත් උපදෙස් දීමට හෝ හිමිකම ඇති බව ගිවිසුම්ගත රාජ්‍යයන් විසින් පිළිගන්නා අතර ඒ කාර්යය සඳහා විශේෂයෙන් මේ ව්‍යවස්ථාවේ (අ) ඡේදය සමග ද, මේ සම්මුතියේ අදාළ විධිවිධාන ඇතුළත් වූ ජාත්‍යන්තර නීතියේ අදාළ රීති ද හා අනුකූල වන්නා වූ යම් උචිත ක්‍රියාමාර්ගවලට ගිවිසුම්ගත රාජ්‍යයන් හට යොමුවිය හැකි වන්නේ ය. සිවිල් ගුවන් යානයකට බාධාකිරීම සම්බන්ධයෙන් බලපවත්නා තම නියෝග ප්‍රසිද්ධ කිරීමට සෑම ගිවිසුම්ගත රාජ්‍යයක්ම එකඟ වනු ලැබේ ;

(ඇ) සෑම ගුවන් යානයක් ම, මේ ව්‍යවස්ථාවේ (අ) ඡේදයට අනුකූලව දෙන ලද යම් නියමයක් පිළිපැදිය යුතු ය. මෙය සාක්ෂාත් කිරීම සඳහා එක් එක් ගිවිසුම්ගත රාජ්‍යයක් විසින් තම රාජ්‍යයේ ලියාපදිංචි වී ඇති යම් සිවිල් ගුවන් යානයක් හෝ, මෙහෙයුම්කරුගේ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය හෝ ස්ථිර නිවාසස්ථානය යම් රාජ්‍යයක් තුළ පිහිටා ඇති විටෙක එකී මෙහෙයුම්කරු විසින් මෙහෙයවනු ලබන යම් සිවිල් ගුවන් යානයක් හෝ සම්බන්ධයෙන් එකී පිළිපැදීම අත්‍යවශ්‍ය කිරීම සඳහා අවශ්‍ය සියලු විධිවිධාන තම ජාතික නීති හෝ නියෝගවල ඇතුළත් කළ යුතු ය. එකී අදාළ නීති හෝ රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් බරපතල දඬුවම් මගින් දඬුවම් දිය යුතු බවට එක් එක් ගිවිසුම්ගත රාජ්‍ය සැලකිය යුතු අතර, එවැනි නඩු එකී රාජ්‍යයේ නීති සහ නියෝගවලට අනුකූලව නිසි බලධාරීන් වෙත යොමුකළ යුතු ය ;

(ඈ) එක් එක් ගිවිසුම්ගත රාජ්‍යයක් විසින්, තම රාජ්‍යයේ ලියාපදිංචි වී ඇති යම් සිවිල් ගුවන් යානයක් හෝ මෙහෙයුම්කරුගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හෝ ස්ථිර නිවාසස්ථානය එකී රාජ්‍යය තුළ පිහිටා ඇති විටෙක, එකී මෙහෙයුම්කරු විසින් මෙහෙයවනු ලබන යම් සිවිල් ගුවන් යානයක් හෝ මේ සම්මුතියේ ඉලක්ක හා අනනුකූල වූ යම් කාර්යයක් සඳහා හිතාමතාම භාවිත කිරීම තහනම් කිරීම සඳහා උචිත පියවර ගනු ලැබිය යුතු ය. මේ විධිවිධානය මගින් (අ) ඡේදයට බලපෑමක් ඇති නොවිය යුතු ය. මේ ව්‍යවස්ථාවේ (ආ) සහ (ඇ) ඡේද හීන කිරීමක් ද සිදු නොවිය යුතු ය.

### 4 වන ව්‍යවස්ථාව

### සිවිල් ගුවන් සේවාව අයථා ලෙස භාවිත කිරීම

සම්මුතියේ අරමුණුවලට අනුකූල නොවන්නා වූ කිසියම් කාර්යයක් සඳහා සිවිල් ගුවන් සේවාව භාවිත නොකිරීමට එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය එකඟ වනු ලැබේ.

### 5 වන ව්‍යවස්ථාව

### අනියම් පියසර සඳහා අයිතිය

ඉහළින් පියාසර කරනු ලබන රාජ්‍යය සතු, ගොඩබැස්සවීමට නියම කිරීමේ අයිතියට යටත්ව සහ මෙම සම්මුතියේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීමේ කොන්දේසිය මත අනෙකුත් ගිවිසුම්ගත රාජ්‍යවලට අයත්, නියමිත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවාවන් හි නිරත නොවන සියලුම ගුවන් යානාවන්ට පූර්ව අනුමැතියක් ලබාගැනීමේ අවශ්‍යතාවයෙන් තොරව ස්වකීය දේශය තුළට හෝ, සංක්‍රමණ වශයෙන් ස්වකීය දේශය හරහා නැවතීමකින් තොරව හෝ පියාසර කිරීමේ අයිතියත්, එමෙන්ම ප්‍රවාහන කාර්යයන් නොවන කාර්යයන් සඳහා නැවැත්වීමේ අයිතියත් හිමිවිය යුතු බවට එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය එකඟවන්නේ ය. කෙසේ වුව ද, පියසර නිරුපද්‍රිතතා හේතූන් මත, ප්‍රවිෂ්ට විය නොහැකි හෝ ප්‍රමාණවත් ගුවන් සංතරණ පහසුකම් නොමැති හෝ කලාපවලට ඉහළින් පියාසර කිරීමට අපේක්ෂා කරන ගුවන් යානාවන්ට, නියම කරනු ලබන ගුවන් මාර්ග ඔස්සේ පියාසර කරන ලෙස හෝ එවැනි පියසරයන් සඳහා විශේෂ අවසරයක් ලබාගන්නා ලෙස හෝ නියම කිරීමේ අයිතිය එක් එක් ගිවිසුම්ගත රාජ්‍ය තම තමන් වෙත රඳවාගනු ලැබේ. එවැනි ගුවන් යානා පාරිශ්‍රමිකයක් හෝ කුලියක් හෝ සඳහා මගීන්, ගුවන් භාණ්ඩ හෝ තැපෑල හෝ ප්‍රවාහනය කරන නියමිත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවා නොවන වෙනත් සේවාවන් හි නිරත වන්නේ නම් 7 වන ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට සහ ස්වකීය දේශය තුළ දී ගුවන් යානාවන් තුළට පැටවීම සහ ගොඩ බෑම සම්බන්ධයෙන් පැනවීම උචිත යයි තමන් අදහස් කරන නියෝග, කොන්දේසි හෝ සීමා කිරීම් හෝ කිසිවක් පැනවීමට කිසියම් රාජ්‍යයක් සතුව ඇති අයිතියට ද යටත්ව මගීන්, ගුවන් භාණ්ඩ හෝ තැපෑල හෝ පටවා ගැනීමේ හෝ ගොඩබෑමේ හෝ වරප්‍රසාදය ද එකී ගුවන් යානාවන්ට හිමි විය යුතු ය.

### 6 වන ව්‍යවස්ථාව

### විධිමත් කාලසටහනක් සහිත ගුවන් ප්‍රවාහන සේවා

යම් ගිවිසුම්ගත රාජ්‍යයකින් ලබාගත් විශේෂ අවසරයක් හෝ වෙනත් බලය පැවරුමක් හෝ සහිතව සහ එවැනි අවසරයක හෝ බලය පැවරුමක හෝ අන්තර්ගත නියමයන්ට අනුකූලව මිස කිසිම ගිවිසුම්ගත රාජ්‍යයක දේශය තුළට හෝ ඊට ඉහළින් හෝ විධිමත් කාලසටහනක් සහිත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයවීම සිදු නොකළ යුතු ය.

### 7 වන ව්‍යවස්ථාව

### අභ්‍යන්තර ප්‍රවාහනය

එක් එක් ගිවිසුම්ගත රාජ්‍යයකට අයත් ගුවන් යානාවන්ට ස්වකීය දේශය තුළ පිහිටි තවත් ස්ථානයක් දක්වා පාරිශ්‍රමිකයක් හෝ කුලියක් හෝ අය කිරීම සඳහා මගීන්, ගුවන් භාණ්ඩ සහ තැපෑල ප්‍රවාහනය කිරීමට අවසරදීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය වෙනත් ගිවිසුම්ගත රාජ්‍යයකට හිමිවන්නේ ය. එවැනි වරප්‍රසාදයක් නිශ්චිත වශයෙන් වෙනත් කිසියම් රාජ්‍යයකට හෝ වෙනත් රාජ්‍යයකට අයත් ගුවන් ප්‍රවාහන සමාගමකට හෝ තනිකරම පවරාදීමේ ගිවිසුම් කිසිවකට බැඳීමෙන් වලකින බවටත් තමන් ද වෙනත් රාජ්‍යකින් එවැනි තනි වරප්‍රසාදයක් ලබා නොගන්නා බවටත් එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය පොරොන්දු වෙයි.

8 වන ව්‍යවස්ථාව

නියමුවන් රහිත ගුවන් යානා

අදාළ රාජ්‍යයෙන් විශේෂ බලය පැවරුමක් ලබාගෙන එකී බලය පැවරුමේ ඇතුළත් නියමයන්ට අනුකූලව විනා නියමුවකු රහිතව පියාසර කරවිය හැකි කිසිම ගුවන් යානයක් ගිවිසුම්ගත රාජ්‍යයක් සතු දේශයට ඉහළින් එසේ නියමුවකු රහිතව පියාසර කරවීම සිදු නොකළ යුතු ය. සිවිල් ගුවන් යානාවන්ට විවෘතව ඇති කලාප තුළ දී එවැනි නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් සිදුකරන කල්හි ඒ මගින් සිවිල් ගුවන් යානාවන්ට සිදුවිය හැකි අනතුරු වැලැක්වෙන ආකාරයට එකී මෙහෙයුම් පාලනය කරන බව සහතික කිරීමට ද එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය පොරොන්දු වෙයි.

9 වන ව්‍යවස්ථාව

තහනම් ප්‍රදේශ

(අ) යුදමය අවශ්‍යතාවන් හෝ මහජන ආරක්ෂාව හෝ පිළිබඳ හේතුන් මත අනෙක් ගිවිසුම්ගත රාජ්‍ය සතු ගුවන් යානා ස්වකීය දේශයේ යම් යම් ප්‍රදේශවලට ඉහළින් පියාසර කිරීම ක්‍රමානුකූලව තහනම් කිරීම හෝ සීමා කිරීම හෝ එක් එක් ගිවිසුම්ගත රාජ්‍යයට කළ හැකි වන්නේ ය. කෙසේ වුව ද මෙම කාර්යයේ දී නියමිත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවාවන්හි නිරත වන, අදාළ දේශය අයත් වන රාජ්‍යයේ ගුවන් යානා සහ එවැනිම වූ සේවාවන් හි නිරත වන අනෙකුත් ගිවිසුම්ගත රාජ්‍යවලට අයත් ගුවන් යානා අතර වෙනසක් සිදු නොවිය යුතු ය. එවැනි තහනම් ප්‍රදේශ ගුවන් සංතරණ කාර්යයට අනවශ්‍ය ලෙස අවහිර නොවන පරිදි යුක්ති සහගත ප්‍රමාණත්වයකින් සහ පිහිටීමකින් යුක්ත විය යුතු ය. ගිවිසුම්ගත රාජ්‍යයක් සතු දේශය තුළ පිහිටි, එවැනි තහනම් ප්‍රදේශ සහ පසුව එකී ප්‍රදේශ තුළ සිදුකරන ලද වෙනස්කම් ද සම්බන්ධ විස්තර හැකිතාක් ඉක්මණින් අනෙක් ගිවිසුම්ගත රාජ්‍ය වෙත සහ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය වෙත දන්වා යැවිය යුතු ය ;

(ආ) සුවිශේෂී තත්ත්වයන් හි දී හෝ හදිසි අවස්ථා වකවානුවක දී හෝ එසේත් නැතහොත් මහජන ආරක්ෂාව තකා හෝ ස්වකීය දේශයට ඉහළින් හෝ ඉන් කොටසකට ඉහළින් හෝ පියාසර කිරීම වහාම බලපැවැත්වෙන පරිදි තාවකාලිකව තහනම් කිරීමේ හෝ සීමා කිරීමේ හෝ අයිතිය එක්සත් ගිවිසුම්ගත රාජ්‍ය විසින් තම තමන් වෙත රඳවා ගනු ලැබේ. කෙසේ වුව ද එසේ කටයුතු කළ යුත්තේ එවැනි තහනම් කිරීමක් හෝ සීමා කිරීමක් හෝ ජාතිකත්වය අනුව සිදුකෙරෙන විශේෂත්වයකින් තොරව අනෙකුත් සියලුම රාජ්‍යයන් සතු ගුවන් යානා කෙරෙහි එකසේ අදාළ විය යුතු ය යන කොන්දේසි මතය ;

(ඇ) මෙහි ඉහත (අ) (ආ) ඡේදයන් හි කියැවෙන ප්‍රදේශවලට ඇතුළුවන කිසියම් ගුවන් යානයකට හැකිතාක් ඉක්මණින් ස්වකීය දේශය තුළ පිහිටි කිසියම් නම් කරන ලද ගුවන් තොටුපළකට ගොඩබසින ලෙස, ඒ සම්බන්ධයෙන් පනවනු ලබන නියෝග කිසිවක් යටතේ නියම කිරීමේ අයිතිය ද එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය සතුව පවත්නේ ය.

### 10 වන ව්‍යවස්ථාව

### රේගු ගුවන් තොටුපළවල ගොඩබැස්වීම

මෙම සම්මුතියේ නියමයන් යටතේ හෝ විශේෂ බලය පැවරුමක් යටතේ හෝ ගුවන් යානාවන්ට ගොඩබැස්වීමකින් තොරව ගිවිසුම්ගත රාජ්‍යයක දේශය හරහා පියාසර කිරීමේ අවසරය ලැබුණ අවස්ථාවක විනා කිසියම් ගිවිසුම්ගත රාජ්‍යයක් සතු දේශය තුළට ඇතුළුවන සෑම ගුවන්යානයක්ම, එම දේශයේ නියෝග අනුව එසේ කිරීම අවශ්‍ය වන්නේ නම්, රේගු සහ වෙනත් පරීක්ෂණ කාර්යයන් සඳහා එකී රාජ්‍යය විසින් නම් කරන ලද ගුවන් තොටුපලක ගොඩබැස්වීම සිදු කළ යුතු ය. ගිවිසුම්ගත රාජ්‍යයක දේශයෙන් පිටත්වීමේ දී එවැනිම වූ නම් කරන ලද රේගු ගුවන් තොටුපලකින් පිටත්විය යුතු ය. සියලුම, නම් කරන ලද රේගු ගුවන් තොටුපළවල විස්තර අදාළ රාජ්‍ය විසින් ප්‍රසිද්ධියට පත්කළ යුතු අතර, අනෙකුත් සියලුම ගිවිසුම්ගත රාජ්‍ය වෙත දන්වා යැවීම සඳහා මෙම සම්මුතියේ දෙවන කොටස යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය වෙත ඉදිරිපත් කළ යුතු ය.

### 11 වන ව්‍යවස්ථාව

### ගුවන් නියෝගවල අදාළත්වය

මේ සම්මුතියෙහි විධිවිධානයන්ට යටත්ව, ජාත්‍යන්තර ගුවන් සංතරණයෙහි නිරතවන ගුවන් යානා ස්වකීය දේශය තුළට ඇතුළුවීම හෝ ස්වකීය දේශයෙන් පිටවීම හෝ සම්බන්ධව හෝ එවැනි ගුවන් යානා ස්වකීය දේශය තුළ තිබෙන අතර සිදු කරනු ලබන මෙහෙයුම් සහ සංතරණ කටයුතු සම්බන්ධව හෝ කිසියම් ගිවිසුම්ගත රාජ්‍යයක් විසින් පනවා ඇති නීති සහ නියෝග ජාතිකත්වය අනුව සිදු කෙරෙන විශේෂත්වයකින් තොරව සියලුම ගිවිසුම්ගත රාජ්‍යවලට අයත් ගුවන් යානා සම්බන්ධයෙන් එකසේ අදාළ කරගත යුතු අතර, අදාළ ගුවන් යානා එකී දේශයට ඇතුළුවීමේ දී හෝ ඉන් පිටවීමේ දී හෝ එකී දේශය තුළ තිබෙන අතරතුර දී හෝ එම නීති සහ නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

### 12 වන ව්‍යවස්ථාව

### ගුවන් නීති

එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය, ස්වකීය දේශයට ඉහළින් පියාසර කරන හෝ ස්වකීය දේශය ඇතුළත හැසිරවීම් සිදුකරන හෝ සෑම ගුවන් යානයක්මත් කිනම් ස්ථානයක තිබුණ ද ස්වකීය ජාතිකත්ව සලකුණ දරන සෑම ගුවන්යානයක්මත්, ගුවන් යානා පියාසර සහ හැසිරවීම්වලට අදාළව බලයේ පවතින නීති සහ නියෝගවලට අනුකූලව කටයුතු කරන බව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් පියවර ගැනීමට පොරොන්දු වේ. මෙම කරුණු සම්බන්ධයෙන් තමන් විසින් පනවනු ලබන නියෝග තමන්ට හැකි උපරිම ප්‍රමාණයට, කලින් කල මෙම සම්මුතිය යටතේ පිහිටුවා ඇති නියෝග සමග ඒකාකාරී වන පරිදි පවත්වා ගැනීමට එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය පොරොන්දු වෙයි. අදාළ නියෝග උල්ලංඝනය කරන සියලුම පුද්ගලයින්ට එරෙහිව නඩු පැවරීමට ද එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය පොරොන්දු වෙයි.

### 13 වන ව්‍යවස්ථාව

### පිවිසුම් සහ පැහැයුම් නියෝග

ගුවන් යානාවන් හි මගීන්, සේවක පිරිස හෝ ගුවන් භාණ්ඩ හෝ තම දේශය තුළට ඇතුළුවීම හෝ ඉන් පිටවීම හෝ සම්බන්ධයෙන් ගිවිසුම්ගත රාජ්‍යයක් විසින් පනවා ඇති, පිවිසුම්, පැහැයුම්, ආගමනය, ගමන් බලපත්‍ර, තීරුබදු සහ නිරෝධායනයට අදාළ නියෝග වැනි නීති සහ නියෝග එකී දේශයට ඇතුළුවීමේ දී, ඉන් පිටවීමේ දී හෝ එම දේශය තුළ දී අදාළ මගීන් සහ සේවක පිරිස් විසින් හෝ ගුවන් භාණ්ඩ වෙනුවෙන් හෝ පිළිපැදිය යුතු ය.

### 14 වන ව්‍යවස්ථාව

### රෝග පැතිරීම වැලැක්වීම

කොළරාව, ටයිපස් උණ (වසංගත), වසූරිය, කහ උණ, මහාමාරිය සහ ගිවිසුම්ගත රාජ්‍ය විසින් කලින් කල නම් කිරීමට තීරණය කරනු ලැබිය යුතු එවැනි වෙනත් සංක්‍රමික රෝග ගුවන් සංතරණය මගින් පැතිරයාම වැලැක්වීම සඳහා ඵලදායී පියවර ගැනීමට එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය එකඟ වන අතර, එම අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ගුවන් යානාවන්ට අදාළ වන සනීපාරක්ෂක පියවර සම්බන්ධයෙන් ප්‍රවේදිත වන්නා වූ නියෝජිත ආයතන සමග සමීප සම්බන්ධතාවක් සහ පිළිවිසීම් පැවැත්වීමට ද ගිවිසුම්ගත රාජ්‍ය කටයුතු කළ යුතු ය. එවැනි පිළිවිසීම් හේතුවෙන් මෙම විෂයට අදාළව ගිවිසුම්ගත රාජ්‍ය බැඳී ඇති කිසියම් ජාත්‍යන්තර සම්මුතියක් අනුව කටයුතු කිරීමට කිසිදු බාධාවක් නොවිය යුතු ය.

### 15 වන ව්‍යවස්ථාව

### ගුවන් තොටුපළ ගාස්තු සහ වෙනත් එවැනි ගාස්තු

ගිවිසුම්ගත රාජ්‍යයක පිහිටි, එම රාජ්‍යයේ ගුවන් යානාවන් විසින් පොදුවේ භාවිත කිරීම සඳහා විවෘතව ඇති සියලුම ගුවන් තොටුපළ, 68 වන ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව, ඒ ආකාරයෙන් ම ඒකාකාරී කොන්දේසි මත අනෙකුත් සියලුම ගිවිසුම්ගත රාජ්‍යවල ගුවන් යානා උදෙසා විවෘතව තැබිය යුතු ය. ගුවන් සංතරණයේ නිරුපද්‍රිතතාව සහ කඩිනම්භාවය අපේක්ෂාවෙන් පොදු පරිහරණය සඳහා සපයනු ලබන, ගුවන් විදුලි සහ කාලගුණ විද්‍යාත්මක සේවාවන් ඇතුළු සියලුම ගුවන් සංතරණ පහසුකම් පරිහරණය කිරීමේ දී සියලුම පාර්ශ්ව රාජ්‍යවල ගුවන්යානාවන්ට ඒකාකාරී කොන්දේසි අදාළ කරගත යුතු ය. යම් ගිවිසුම්ගත රාජ්‍යයක් විසින් වෙනත් ගිවිසුම්ගත රාජ්‍යයක ගුවන් යානයක් එවැනි ගුවන් සේවා සහ ගුවන් සංතරණ පහසුකම් පරිහරණය කිරීම සම්බන්ධයෙන් පනවනු ලැබිය හැකි හෝ පැනවීමට අවසර දී ඇති ගාස්තු :

(අ) නියමිත ජාත්‍යන්තර ගුවන් සේවාවන් හි නිරත නොවන ගුවන් යානා සම්බන්ධයෙන් වන විට, සමාන මෙහෙයුම්වල නියුතු සමාන පන්තියේ ජාතික ගුවන් යානා විසින් ගෙවනු ලබන ගාස්තුවලට වඩා ; සහ

(ආ) නියමිත ජාත්‍යන්තර ගුවන් සේවාවන් හි නියුතු ගුවන් යානා සම්බන්ධයෙන් වන විට, සමාන ජාත්‍යන්තර ගුවන් සේවාවන් හි නියුතු එම රාජ්‍යයේ ජාතික ගුවන් යානා සඳහා ගෙවනු ලබන ගාස්තුවලට වඩා,

වැඩි නොවිය යුතු ය.

එකී සියලු ගාස්තු ප්‍රසිද්ධ කළ යුතු අතර ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයට දැන ගැනීමට සැලැස්විය යුතු ය :

එසේ වුව ද, උනන්දුවක් දක්වන ගිවිසුම්ගත රාජ්‍ය විසින් කරුණු ඉදිරිපත් කිරීමේ දී, ගුවන් තොටුපළ හා පහසුකම් පරිහරණය කිරීම සම්බන්ධයෙන් පනවන ලද ගාස්තු මධ්‍ය මණ්ඩලය විසින් සමාලෝචනයට භාජනය කළ යුතු අතර එකී සමාලෝචනය පිළිබඳ වාර්තාව ද, නිර්දේශ ද අදාළ රාජ්‍යය හෝ රාජ්‍යයන් විසින් සලකා බලනු ලැබීම සඳහා එකී රාජ්‍යය හෝ රාජ්‍ය වෙත ඉදිරිපත් කළ යුතු ය.

යම් ගිවිසුම්ගත රාජ්‍යයක ගුවන් යානයකට හෝ එකී යානයේ සිටින තැනැත්තන්ට හෝ එකී යානයේ ඇති යම් දේපළකට හෝ ස්වකීය දේශයට ඉහළින් පියාසර කිරීම, දේශය තුළට ඇතුළුවීම හෝ දේශයෙන් පිටවීම සඳහා ඇති අයිතිය නිසාම පමණක් ගාස්තු හෝ අයකිරීම් පැනවීම නොකළ යුතු ය.

16 වන ව්‍යවස්ථාව

ගුවන් යානා සෝදිසි කිරීම

අනෙකුත් ගිවිසුම්ගත රාජ්‍යවල ගුවන් යානා තම දේශය තුළ ගොඩබැස්සවීමේ දී හෝ පිටත්වීමේ දී හෝ, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සෝදිසි කිරීමේ හා මෙම සම්මුතිය මගින් නියම කර ඇති සහතික සහ වෙනත් ලියවිලි පරීක්ෂා කිරීමේ ද අයිතිය, එක් එක් ගිවිසුම්ගත රාජ්‍යයෙහි නිසි බලධාරීන්ට හිමි වේ.

17 වන ව්‍යවස්ථාව

ගුවන් යානා ජාතිකත්වය

ගුවන් යානයකට, එය ලියාපදිංචි කරන ලද රාජ්‍යයේ ජාතිකත්වය හිමි වේ.

18 වන ව්‍යවස්ථාව

ද්විත්ව ලියාපදිංචිය

කිසිම ගුවන් යානයක් එක් රාජ්‍යයකට වැඩි රාජ්‍ය සංඛ්‍යාවක, වලංගුභාවයෙන් යුක්තව ලියාපදිංචි කළ නොහැක. එහෙත් ලියාපදිංචිය එක් රාජ්‍යයකින් තවත් රාජ්‍යයකට වෙනස් කළ හැක.

19 වන ව්‍යවස්ථාව

ලියාපදිංචි කිරීම පාලනය කෙරෙන ජාතික නීති

ගුවන් යානයක් යම් ගිවිසුම්ගත රාජ්‍යයක ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචිය පැවරීම හෝ සිදු කළ යුත්තේ එම රාජ්‍යයේ නීති සහ නියෝගවලට අනුකූලවය.

20 වන ව්‍යවස්ථාව

සලකුණු ප්‍රදර්ශනය කිරීම

ජාත්‍යන්තර ගුවන් සංතරණයෙහි නිරත වන සෑම ගුවන් යානයකම එයට උචිත ජාතිකත්ව සහ ලියාපදිංචි කිරීමේ සලකුණු ප්‍රදර්ශනය කළ යුතු ය.

21 වන ව්‍යවස්ථාව

ලියාපදිංචිය වාර්තා කිරීම

යම් ගිවිසුම්ගත රාජ්‍යයක ලියාපදිංචි කරන ලද යම් නිශ්චිත ගුවන් යානයක ලියාපදිංචිය සහ හිමිකාරත්වය පිළිබඳ විස්තර වෙනත් ගිවිසුම්ගත රාජ්‍යයක් වෙත හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය වෙත හෝ, ඉල්ලූවිට සැපයීමට එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය පොරොන්දු වෙයි. ඊට අමතරව එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය විසින් සිරිත් පරිදි ජාත්‍යන්තර ගුවන් සංතරණයෙහි නිරතවන ස්වකීය රාජ්‍යයෙහි ලියාපදිංචි කරන ලද ගුවන් යානාවන් හි හිමිකාරත්වය හා පාලනය පිළිබඳ ලබාදිය හැකිතාක් තොරතුරු අඩංගු කරන ලද වාර්තා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් ඒ සම්බන්ධව පනවනු ලැබිය හැකි නියෝග යටතේ එකී සංවිධානය වෙත සැපයිය යුතු ය. එසේ ලබාගන්නා තොරතුරු ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් අනෙකුත් ගිවිසුම්ගත රාජ්‍යවලට ද ඉල්ලීම මත ලබාදිය යුතු ය.

22 වන ව්‍යවස්ථාව

උපචාර විධි සඳහා පහසුකම් සැලසීම

ගිවිසුම්ගත රාජ්‍ය සතු දේශයන් අතර සිදු කෙරෙන ගුවන් යානා සංතරණය විශේෂ නියෝග නිකුත් කිරීම මගින් හෝ වෙනත් ආකාරයකින් හෝ පහසු කිරීමටත්, කඩිනම් කිරීමටත් ගත හැකි සෑම පියවරක්ම ගැනීමටත් එමෙන්ම, විශේෂයෙන් ආගමන, නිරෝධායන, රේගු සහ පැහැයුම් නීති ක්‍රියාත්මක කිරීමේ දී ගුවන් යානාවන්ට, සේවක පිරිසට, මගීන්ට සහ ගුවන් භාණ්ඩ ආදියට සිදුවිය හැකි අනවශ්‍ය ප්‍රමාද වැලැක්වීමටත් එක් එක් ගිවිසුම්ගත රාජ්‍ය පොරොන්දු වනු ලැබේ.

23 වන ව්‍යවස්ථාව

රේගු සහ ආගමන කාර්ය පටිපාටි

සම්මුතියට අනුව කලින් කල පිහිටුවිය හැකි හෝ නිර්දේශ කරනු ලැබිය හැකි පරිචයන්ට අනුකූලව ක්‍රියාවට නැංවීමට හැකිතාක් දුරට, ජාත්‍යන්තර ගුවන් සංතරණයට බලපාන්නා වූ රේගු සහ ආගමන කාර්ය පටිපාටියක් පිහිටුවීමට එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය විසින් පොරොන්දු වනු ලැබේ. මේ සම්මුතියේ සඳහන් කිසිවකින් රේගු බද්දෙන් නිදහස් ගුවන් තොටුපොළ පිහිටුවීම වලක්වනු ලැබෙතැයි තේරුම් නොගත යුතු ය.

24 වන ව්‍යවස්ථාව

තීරු බදු

ගිවිසුම්ගත රාජ්‍ය විසින්, වෙනත් ගිවිසුම්ගත රාජ්‍යයක දේශයක් කරා හෝ එවැනි දේශයක සිට හෝ එවැනි දේශයක් හරහා හෝ පියසරයෙහි යෙදෙන ගුවන් යානා, තම රාජ්‍යයේ බලපැවැත්වෙන රේගු නියෝගවලට යටත්ව බද්දෙන් නිදහස් කර ස්වකීය දේශයට තාවකාලිකව ඇතුළු කරගත යුතු ය. එක් ගිවිසුම්ගත රාජ්‍යයක් සතු ගුවන් යානයක් තවත් ගිවිසුම්ගත රාජ්‍යයක් සතු දේශයට පැමිණීමේ දී එම රාජ්‍යයේ දේශයෙන් ඉවත්ව යන විටත් ගුවන් යානය තුළම රඳවා ගනු ලබන ඉන්ධන, ස්නේහක තෙල්, අමතර කොටස්, නිතිපතා අවශ්‍ය වන උපකරණ සහ ගුවන්යානා ගබඩා භාණ්ඩ තීරුබදු, පරීක්ෂණ ගාස්තු හෝ ඒ හා සමාන ජාතික හෝ දේශීය බදුවලින් හෝ ගාස්තුවලින් නිදහස් කළ යුතු ය. එකී ද්‍රව්‍ය ගුවන් යානයෙන් පිටතට බෑමෙන් පසු රේගු අධීක්ෂණය සහ පාලනය යටතේ තැබිය යුතු බව නියම කළ හැකි, අදාළ රාජ්‍යයේ නියෝගවලට අනුකූලව විනා ගුවන් යානයෙන් පිටතට බෑම සිදු කරන ද්‍රව්‍ය තොග කිසිවක් සඳහා මෙම නිදහස් කිරීම අදාළ නොවිය යුතු ය.

වෙනත් ගිවිසුම්ගත රාජ්‍යයක් සතු ජාත්‍යන්තර ගුවන් සංතරණයෙහි නිරතවන ගුවන් යානා තුළ සවිකිරීම සඳහා හෝ එකී ගුවන් යානා සඳහා භාවිත කිරීම සඳහා හෝ කිසියම් ගිවිසුම්ගත රාජ්‍යයක් සතු දේශය තුළට ආනයනය කරනු ලබන අමතර කොටස් සහ උපකරණ, එකී ද්‍රව්‍ය රේගු අධීක්ෂණය සහ පාලනය යටතේ තැබිය යුතු බවට නියම කළ හැකි, අදාළ රාජ්‍යයේ රේගු නියෝගවලට අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවයන්ට යටත් කොට, තීරුබදු ගෙවීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර, අදාළ රාජ්‍යයේ දේශය තුළට ඇතුළු කර ගත යුතු ය.

25 වන ව්‍යවස්ථාව

ආපදාවට පත් වූ ගුවන් යානා

ස්වකීය දේශය තුළ දී ආපදාවට පත් වන ගුවන් යානාවන්ට සහාය ලබාදීම සඳහා තමන්ට ගතහැකි සියලුම පියවර ගැනීමටත්, තම බලධාරීන්ගේ පාලනයට යටත්ව, අදාළ ගුවන්යානයේ හිමිකරුවන්ටත්, එය ලියාපදිංචි කරන ලද රාජ්‍යයේ බලධාරීන්ටත් පවත්නා තත්ත්වයන් අනුව අවශ්‍ය වන පරිදි අදාළ ගුවන් යානයට සහායවීමේ පියවර ගැනීමට අවසර දීමටත් එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය පොරොන්දුවනු ලැබේ. එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය සොයා ගැනීමට නොහැකි වූ ගුවන් යානා සෙවීම බාරගන්නා විට මෙම සම්මුතිය යටතේ කලින් කල නිර්දේශ කරනු ලබන සමායෝජිත පියවර ගැනීම සඳහා එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය සහයෝගයෙන් කටයුතු කළ යුතු ය.

26 වන ව්‍යවස්ථාව

අනතුරු විමර්ශනය කිරීම

ගිවිසුම්ගත රාජ්‍යයක් සතු ගුවන් යානයක් වෙනත් ගිවිසුම්ගත රාජ්‍යයක් සතු දේශය තුළ දී, ජීවිත හානි හෝ බරපතල තුවාල හෝ සිදුකරමින් හෝ ගුවන් යානයේ බරපතල තාක්ෂණික දෝෂයක් හෝ ගුවන් සංතරණ පහසුකම්වල

දෝෂයක් පෙන්නුම් කරමින් හෝ අනතුරකට පාත්‍ර වූ අවස්ථාවක, එකී අනතුර සිදු වූ දේශය අයත් රාජ්‍යය විසින් අනතුරට සම්බන්ධ වූ අවස්ථානුගත තත්ත්වයන් පිළිබඳව එකී රාජ්‍යයේ නීතියෙන් අවසර ලැබෙනතාක් ප්‍රමාණයට, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් නිර්දේශ කරනු ලැබිය හැකි කාර්ය පටිපාටියට අනුකූලව විමර්ශනයක් ආරම්භ කළ යුතු ය. ගුවන් යානය ලියාපදිංචි කරන ලද රාජ්‍යයට, විමර්ශනයට සහභාගි වීම සඳහා නිරීක්ෂකයින් පත් කර එවීමට අවස්ථාව ලබා දිය යුතු අතර, විමර්ශනය පවත්වන රාජ්‍යය විසින් විමර්ශනයේ සොයා ගැනීම් සහ වාර්තාවද එකී රාජ්‍යයට ලබා දිය යුතු ය.

### 27 වන ව්‍යවස්ථාව

පේටන්ට් හිමිකම් මත තහනම් කිරීමෙන්, නිදහස් කිරීම

(අ) ජාත්‍යන්තර ගුවන් සංතරණයෙහි යෙදී සිටින අතරතුර දී ගිවිසුම්ගත රාජ්‍යයක් සතු ගුවන් යානයක් වෙනත් ගිවිසුම්ගත රාජ්‍යයක් සතු දේශය තුළට අවසර සහිතව ඇතුළුවන හෝ එම දේශය හරහා අවසර සහිතව ගොඩ බැස්සවීමක් සහිතව හෝ රහිතව හෝ සංක්‍රමණය වන හෝ අවස්ථාවක දී ආදළ ගුවන් යානයේ නිර්මාණය, යාන්ත්‍රණය, කොටස්, උපාංග හෝ මෙහෙයුම හෝ මගින් ගුවන් යානය ඇතුළුවන දේශය සතු රාජ්‍යය විසින් යථා පරිදි ප්‍රදානය කරන ලද හෝ ලියාපදිංචි කරන ලද හෝ කිසියම් ස්වාධිකාරයක්, සැලසුමක් හෝ ආදර්ශයක් හෝ පිළිබඳ අයිතියක් උල්ලංඝනය වන බව සලකා, එකී රාජ්‍ය විසින් හෝ එහි කිසියම් පුද්ගලයකු විසින් හෝ ඔවුන් වෙනුවෙන් හෝ අදාළ ගුවන් යානය හිමිකරුගෙන් හෝ මෙහෙයුම්කරුගෙන් හෝ වන්දි ඉල්ලමින් හෝ ඔවුනට එරෙහිව වෙනත් ආකාරයකින් කටයුතු කරමින් හෝ අදාළ ගුවන් යානය තහනම් කිරීම හෝ රඳවා ගැනීම හෝ සිදු නොකළ යුතු ය. කිසියම් ගුවන් යානයක් එලෙස තහනම් කිරීමෙන් හෝ රඳවා ගැනීමෙන් හෝ නිදහස් කිරීම සඳහා අදාළ ගුවන් යානය ඇතුළුවන දේශය සතු රාජ්‍යය විසින් ඇප තැන්පත් කිරීමක් නියම නොකළ යුතු බවටද එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය එකඟ වෙයි ;

(ආ) යම් ගිවිසුම්ගත රාජ්‍යයක ගුවන් යානයක් වෙනත් ගිවිසුම්ගත රාජ්‍යයක දේශය තුළ අලුත්වැඩියා කිරීමේ දී, එකී ගුවන් යානය සඳහා වූ අමතර කොටස් හා අමතර උපකරණ ගබඩා කිරීම සහ ඒවා භාවිතා කිරීම හා සවි කිරීම ද සම්බන්ධයෙන් (අ) ඡේදයෙහි විධිවිධාන අදාළ විය යුතු ය. එසේ වුව ද, එසේ ගබඩා කරන ලද පේටන්ට් ලද අමතර කොටස් හෝ උපකරණ, ගුවන් යානය ඇතුළුවනු ලැබූ රාජ්‍යය තුළ දී බෙදා හැරීම හෝ එකී රාජ්‍යයෙන් වාණිජමය වශයෙන් අපනයනය කිරීම හෝ නොකළ යුතු ය ;

(ඇ) මෙම වගන්තියෙහි සඳහන් ප්‍රතිලාභ හිමිවන්නේ—

(1) කාර්මික දේපළ ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ සහ ඊට සිදු කරන ලද සංශෝධන කිසිවකුත් පාර්ශ්වකරුවන් වන ; හෝ

(2) මෙම සම්මුතියෙහි අනෙකුත් ගිවිසුම්ගත රාජ්‍යවලට අයත් ජාතිකයන්ගේ නිපැයුම් පිළිගනු ලබන සහ එකී නිපැයුම්වලට ප්‍රමාණවත් ආරක්ෂාවක් සලසා දෙන පේටන්ට් නීති පනවා ඇති රාජ්‍ය වන,

මේ සම්මුතියේ ගිවිසුම්ගත රාජ්‍යවලට පමණි.

**28 වන ව්‍යවස්ථාව**

ගුවන් සංතරණ පහසුකම් සහ සම්මත පද්ධති

පහත සඳහන් කාර්යයන් තමන්ට හැකි ප්‍රමාණයකට ඉටු කිරීමට එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය පොරොන්දු වෙයි :—

(අ) මෙම සම්මුතිය ප්‍රකාර කලින් කල පිහිටුවනු ලබන හෝ නිර්දේශ කරනු ලබන හෝ ප්‍රමිතීන්ට සහ පරිචයන්ට අනුකූල වන පරිදි ස්වකීය දේශය තුළ ජාත්‍යන්තර ගුවන් සංතරණය පහසු කරලීම සඳහා අවශ්‍ය වන ගුවන් තොටුපල, ගුවන් විදුලි සේවා, කාලගුණ තොරතුරු සේවා සහ වෙනත් ගුවන් සංතරණ පහසුකම් සැපයීම ;

(ආ) මෙම සම්මුතිය ප්‍රකාර කලින් කල නිර්දේශ කරනු ලැබිය හැකි හෝ පිහිටුවනු ලැබිය හැකි හෝ සංදේශන කාර්ය පටිපාටි, සංකේත, සලකුණු, සංඥා හා ආලෝක සම්බන්ධ උචිත සම්මත ක්‍රම සහ වෙනත් මෙහෙයුම් පරිචයන් සහ නීති, සම්මත කරගෙන ක්‍රියාත්මක කිරීම ;

(ඇ) මෙම සම්මුතිය ප්‍රකාර කලින් කල නිර්දේශ කරනු ලැබිය හැකි හෝ පිහිටුවනු ලැබිය හැකි හෝ ප්‍රමිතීන්ට අනුකූලව ගගන, නාවික සිතියම් සහ ප්‍රස්ථාර පළකිරීම, සහතික කිරීම සඳහා ජාත්‍යන්තර වශයෙන් ගනු ලබන පියවර කෙරෙහි සහයෝගය දැක්වීම.

**29 වන ව්‍යවස්ථාව**

ගුවන් යානා තුළ රැගෙන යනු ලබන ලියකියවිලි

ගිවිසුම්ගත රාජ්‍යයක, ජාත්‍යන්තර ගුවන් සංතරණයෙහි නිරත වන සෑම ගුවන් යානයකම මෙම සම්මුතියෙහි නියමිත කොන්දේසිවලට අනුකූලව පහත සඳහන් ලියකියවිලි රැගෙන යා යුතු යි :—

(අ) එහි ලියාපදිංචි සහතිකය ;

(ආ) එහි ගුවන් යෝග්‍යතා සහතිකය ;

(ඇ) සේවක පිරිසේ එක් එක් සාමාජිකයාට අදාළ, උචිත බලපත්‍ර ;

(ඈ) එහි ගමන් සටහන් පොත ;

(ඉ) එය ගුවන් විදුලි උපකරණවලින් සමන්විතව ඇත්නම්, ගුවන් යානයේ, ගුවන් විදුලි මධ්‍යස්ථාන බලපත්‍රය ;

(ඊ) එහි මගීන් රැගෙන යනු ලැබේ නම්, ඔවුන්ගේ නම් සහ ගමනාරම්භක සහ ගමනාන්ත ස්ථානයන් දැක්වෙන ලැයිස්තුව ;

(උ) එහි ගුවන් භාණ්ඩ රැගෙන යනු ලැබේ නම් ගුවන් භාණ්ඩ ලේඛනය සහ ගුවන් භාණ්ඩ සම්බන්ධ සවිස්තර ප්‍රකාශනය.

30 වන ව්‍යවස්ථාව

ගුවන් යානා තුළ රැගෙන යනු ලබන ගුවන් විදුලි උපකරණ

(අ) වෙනත් ගිවිසුම්ගත රාජ්‍යවලට අයත් දේශයන් තුළට හෝ එම දේශයන්ට ඉහලින් හෝ පියාසර කරන එක් එක් ගිවිසුම්ගත රාජ්‍යයට අයත් ගුවන් යානා, ගුවන් විදුලි සම්ප්‍රේෂණ උපකරණ රැගෙන යා යුත්තේ අදාළ ගුවන් යානය ලියාපදිංචි කරන ලද රාජ්‍යයේ නියමිත බලධාරීන් විසින් එකී ගුවන් යානය තුළ ගුවන් විදුලි සම්ප්‍රේෂණ උපකරණ සවි කිරීම සහ ක්‍රියා කරවීම සඳහා බලපත්‍රයක් නිකුත් කොට තිබෙන්නේ නම් පමණකි. කිසියම් රාජ්‍යයකට ඉහලින් පියාසර කරද්දී ඒ දේශය තුළ ගුවන් විදුලි සම්ප්‍රේෂණ උපකරණ භාවිතා කළ යුත්තේ එකී රාජ්‍ය විසින් නියම කරන ලද නියෝගවලට අනුකූලව වන්නේ ය ;

(ආ) ගුවන් යානයක් තුළ ගුවන් විදුලි සම්ප්‍රේෂණ උපකරණ පාවිච්චි කිරීම කළ හැකි වන්නේ එකී කාර්යය සඳහා ගුවන් යානය ලියාපදිංචි කරන ලද රාජ්‍යයේ නියමිත බලධාරීන් විසින් නිකුත් කරන ලද විශේෂ බලපත්‍රයක් දරන පියසර කාර්ය මණ්ඩලයේ සාමාජිකයනට පමණකි.

31 වන ව්‍යවස්ථාව

ගුවන් යෝග්‍යතා සහතික

ජාත්‍යන්තර ගුවන් සංතරණයෙහි නිරත වන සෑම ගුවන් යානයකටම එය ලියාපදිංචි කරන ලද රාජ්‍යය විසින් නිකුත් කරන ලද හෝ වලංගුභාවයට පත් කරන ලද හෝ ගුවන් යෝග්‍යතා සහතිකයක් සපයා තිබිය යුතු ය.

32 වන ව්‍යවස්ථාව

සේවක පිරිස් බලපත්‍ර

(අ) ජාත්‍යන්තර ගුවන් සංතරණයෙහි නිරතවන සෑම ගුවන් යානයකම නියමුවාටත් මෙහෙයුම් සේවක පිරිසට අයත් සෑම සාමාජිකයකුටමත් අදාළ ගුවන්යානය ලියාපදිංචි කරන ලද රාජ්‍යය විසින් නිකුත් කරන ලද හෝ වලංගුභාවයට පත් කරන ලද ප්‍රවීණතා සහතික සහ බලපත්‍ර සපයා තිබිය යුතු ය ;

(ආ) ස්වකීය දේශයට ඉහළින් පියාසර කිරීම සඳහා ස්වකීය ජාතිකයින් වෙත වෙනත් ගිවිසුම්ගත රාජ්‍යයක් විසින් නිකුත් කරන ලද ප්‍රවීණතා සහතික සහ බලපත්‍ර පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය එක් එක් ගිවිසුම්ගත රාජ්‍යයන් විසින් රඳවාගනු ලැබේ.

### 33 වන ව්‍යවස්ථාව

#### සහතික සහ බලපත්‍ර පිළිගැනීම

ගුවන් යානයක් ලියාපදිංචි කරන ලද ගිවිසුම්ගත රාජ්‍යය විසින් නිකුත් කරන ලද හෝ වලංගු භාවයට පත්කරන ලද හෝ ගුවන් යෝග්‍යතා සහතික, ප්‍රවීණතා සහතික සහ බලපත්‍ර, එකී සහතික හෝ බලපත්‍ර හෝ නිකුත් කිරීමේ දී හෝ වලංගු භාවයට පත් කිරීමේ දී හෝ යටත් කරන ලද නියමයන් මෙම සම්මුතිය අනුව කලින් කල පිහිටුවනු ලබන අවම ප්‍රමිතීන්ට සමාන වන්නේ නම් හෝ ඉක්මවා යන්නේ නම් හෝ පමණක් අනෙක් ගිවිසුම්ගත රාජ්‍යය විසින් වලංගු සහතික ලෙස හෝ වලංගු බලපත්‍ර ලෙස හෝ පිළිගනු ලැබිය යුතු ය.

### 34 වන ව්‍යවස්ථාව

#### ගමන් සටහන් පොත්

ජාත්‍යන්තර ගුවන් සංතරණයෙහි නිරත වන සෑම ගුවන් යානයක් වෙනුවෙන්ම මෙම සම්මුතිය යටතේ කලින් කල නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් අදාළ ගුවන් යානය, එහි සේවක පිරිස සහ එක් එක් ගමන සම්බන්ධයෙන් විස්තර ඇතුළත් කටයුතු ගමන් සටහන් පොතක් පවත්වාගත යුතු ය.

### 35 වන ව්‍යවස්ථාව

#### ගුවන් භාණ්ඩ සම්බන්ධ සීමා කිරීම්

(අ) ජාත්‍යන්තර ගුවන් සංතරණයෙහි නිරතවන ගුවන් යානා තුළ යුද්ධායුධ හෝ යුද්ධෝපකරණ හෝ කිසිවක් අදාළ රාජ්‍යයේ අවසරයක් සහිතව විනා කිසියම් රාජ්‍යයක් සතු දේශය තුළ හෝ ඊට ඉහළින් හෝ රැගෙන නොයා යුතු ය. සමානභාවය පවත්වා ගැනීමේ කාර්යය සඳහා, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් කලින් කල කරනු ලබන නිර්දේශයන් කෙරෙහි නිසි සැලකිල්ල යොමු කරමින්, එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය විසින් මේ වගන්තියේ කාර්ය සඳහා යුද්ධායුධ සහ යුදෝපකරණවලට අයත් වන්නේ කිනම් දෑ ද යන්න තමන්ගේ නියෝග මගින් නිශ්චය කළ යුතු ය ;

(ආ) පොදු විනය සහ මහජන ආරක්ෂාව පිළිබඳ හේතූන් මත මෙහි (අ) ඡේදයේ සඳහන් ද්‍රව්‍ය නොවන වෙනත් ද්‍රව්‍ය වුව ද තමන් සතු දේශය තුළ හෝ ඊට ඉහළින් හෝ ගුවන් යානා මගින් ගෙන යාම සීමා කිරීමේ හෝ තහනම් කිරීමේ හෝ අයිතිය එක් එක් ගිවිසුම්ගත රාජ්‍ය විසින් රඳවාගනු ලැබේ :

එසේ වුව ද, මෙහිදී ජාත්‍යන්තර ගුවන් සංතරණයෙහි නිරත වන ස්වකීය ගුවන් යානා සහ එවැනිම වූ සේවාවන් හි නිරතවන, අනිකුත් රාජ්‍යවලට අයත් ගුවන් යානා අතර විශේෂතාවයක් සිදු නොකළ යුතු අතර, තවදුරටත්, ගුවන් යානා මෙහෙයුම් සඳහා හෝ සංතරණය සඳහා හෝ සේවක පිරිස්වල හෝ මගීන්ගේ හෝ නිරුපද්‍රිතතාව සඳහා හෝ අවශ්‍ය වන ගුවන් යානා උපකරණ රැගෙන යාම සඳහා පාවිච්චි කිරීම කෙරෙහි බලපෑම් ඇතිකරවිය හැකි ආකාරයේ සීමා කිරීම් පැනවීම ද සිදු නොකළ යුතු ය.

36 වන ව්‍යවස්ථාව

ඡායාරූප උපකරණ

ස්වකීය දේශයට ඉහළින් පියාසර කරන ගුවන් යානා තුළ ඡායාරූප උපකරණ භාවිත කිරීමේ අයිතිය එක් එක් ගිවිසුම්ගත රාජ්‍ය විසින් තහනම් කිරීම හෝ පාලනය කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

37 වන ව්‍යවස්ථාව

ජාත්‍යන්තර ප්‍රමිති සහ කාර්ය පටිපාටි සම්මත කිරීම

ගුවන් සංතරණය දියුණු කිරීමෙහි සහ සුහසාධනය කිරීමෙහි ලා ඉවහල් වන සමානභාවයත් අවශ්‍ය වන ගුවන් යානා, සේවක පිරිස්, ගුවන් මාර්ග සහ සහායක සේවා ආදියට අදාළ නියෝග, ප්‍රමිති, කාර්ය පටිපාටි සහ සංවිධාන ආදී කරුණුවලදී හැකි උපරිම ප්‍රමාණයේ සමානභාවය සුරක්ෂිත කිරීම සඳහා සහය දැක්වීමට එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය පොරොන්දු වෙයි. මෙම අරමුණ උදෙසා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් කලින් කල පහත සඳහන් කරුණුවලට අදාළව ජාත්‍යන්තර ප්‍රමිති, නිර්දේශිත පරිචයන් සහ කාර්ය පටිපාටි එ මත කිරීමත් අවශ්‍ය වන පරිදි සංශෝධනය කිරීමත් සිදුකරනු ඇත :—

(අ) සංදේශන ක්‍රම සහ භූමි සලකුණු ඇතුළු ගුවන් සංතරණ ආධාරක ;

(ආ) ගුවන් තොටුපල සහ ගොඩ බැසීම් ප්‍රදේශවල ගති ලක්ෂණ ;

(ඇ) ගුවනේ නීති සහ ගුවන් ගමන් පාලන පරිචයන් ;

(ඈ) මෙහෙයුම් සහ යාන්ත්‍රික සේවක පිරිස් සඳහා බලපත්‍ර නිකුත් කිරීම ;

(ඉ) ගුවන් යානා ගුවන් යෝග්‍යතාව ;

(ඊ) ගුවන් යානා ලියාපදිංචි කිරීම සහ හඳුනා ගැනීම ;

(උ) කාලගුණ විද්‍යා තොරතුරු රැස්කිරීම සහ හුවමාරු කිරීම ;

(ඌ) සටහන් පොත් ;

(එ) ගගන නාවික සිතියම් සහ ප්‍රස්ථාර ;

(ඒ) රේගු සහ ආගමන කාර්ය පටිපාටි ;

(ඔ) ආපදාවට පත් වූ ගුවන් යානා සහ අනතුරු විමර්ශනය,

සහ කලින් කල උචිත බව පෙනී යන, ගුවන් සංතරණයේ නිරුපද්‍රිතතාව, ක්‍රමවත් භාවයට සහ කාර්යක්ෂමතාව හා සම්බන්ධ වෙනත් කරුණු.

### 38 වන ව්‍යවස්ථාව

ජාත්‍යන්තර ප්‍රමිති සහ කාර්ය පටිපාටි කෙරෙන් අපගමනය වීම

යම් ජාත්‍යන්තර ප්‍රමිතියකට හෝ කාර්ය පටිපාටියකට හෝ මුළුමනින් ම අනුකූලව කටයුතු කළ නොහැකි වන හෝ කිසියම් ජාත්‍යන්තර ප්‍රමිතියක් හෝ කාර්ය පටිපාටියක් හෝ සංශෝධනය කළ පසු තමන්ගේ නියෝග සහ පරිචයන් එසේ සංශෝධිත ප්‍රමිති හෝ කාර්ය පටිපාටි සමග පූර්ණ අනුකූලතාවයකින් යුක්තව පවත්වාගත නොහැකි වන හෝ එසේත් නැතහොත් ජාත්‍යන්තර ප්‍රමිතියකට අනුව පිහිටුවා ඇති නියෝග සහ පරිචයන්ට කිසියම් නිශ්චිත ආකාරයකින් වෙනස් වන නියෝග හෝ පරිචයන් හෝ පිහිටුවීම අවශ්‍ය වෙතැයි අදහස් කරන හෝ යම් ගිවිසුම් රාජ්‍යයක් විසින් එකී රාජ්‍යය අනුගමනය කරන පරිචයත් ජාත්‍යන්තර ප්‍රමිති මගින් පිහිටුවා ඇති පරිචයත් අතර ඇති වෙනස්කම් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය වෙත වහාම දැනුම් දිය යුතු ය. ජාත්‍යන්තර ප්‍රමිතීන් සංශෝධනය කරනු ලබන අවස්ථාවන් හි දී ඊට අනුගාමීව තමන්ගේ නියෝග සංශෝධනය නොකරන යම් ගිවිසුම්ගත රාජ්‍යයක්, ඒ බව ජාත්‍යන්තර ප්‍රමිතිය සංශෝධනය කිරීම සම්මත කරන ලද දිනයේ සිට දින හැටක් ඇතුළත මධ්‍ය මණ්ඩලය වෙත දැනුම් දිය යුතු ය. එසේ නැතහොත් ස්වකීය රාජ්‍යය ඒ පිළිබඳව ක්‍රියා කිරීමට යෝජනා කරන ආකාරය දැනුම් දිය යුතු ය. මෙවැනි ඕනෑම අවස්ථාවක දී මධ්‍යමණ්ඩලය විසින් ජාත්‍යන්තර ප්‍රමිතියක එක් අංගයක් හෝ වැඩි ගණනක් සහ අදාළ රාජ්‍යයේ අනුරූපී ජාතික පරිචයන් අතර ඇති වෙනස සියලුම ගිවිසුම්ගත රාජ්‍ය වෙත වහාම දැනුම් දිය යුතු ය.

### 39 වන ව්‍යවස්ථාව

සහතික සහ බලපත්‍ර පිටසන් කිරීම

(අ) කිසියම් ගුවන් යානයක හෝ එහි කොටසක හෝ ගුවන් යෝග්‍යතාවය පිළිබඳව හෝ ක්‍රියාකාරීත්වය පිළිබඳව හෝ ජාත්‍යන්තර ප්‍රමිතියක් බලයේ පවත්නේ නම් සහ ඊට ගුවන් යෝග්‍යතා සහතිකයක් නිකුත් කරන අවස්ථාව වන විට පෙර කී ජාත්‍යන්තර ප්‍රමිතිය සමග කිසියම් ආකාරයකින් හෝ සපුරා ගැනීමට එකී ගුවන් යානය අපොහොසත් වන්නේ නම් ඊට නිකුත් කරනු ලබන ගුවන් යෝග්‍යතා සහතිකයෙහි එකී අඩුපාඩුව පිළිබඳ සම්පූර්ණ විස්තරයක් පිටසනක් වශයෙන් යෙදීම හෝ අදාළ ගුවන් යෝග්‍යතා සහතිකයට අනුබද්ධ කිරීම හෝ සිදු කරනු ලැබිය යුතු ය ;

(ආ) කිසියම් බලපත්‍රයක් දරන පුද්ගලයකු එකී බලපත්‍රය හෝ සහතිකය හෝ අදාළ ජාත්‍යන්තර ප්‍රමිතියෙහි නියමිත කොන්දේසි පූර්ණ වශයෙන් සපුරාලන්නේ නැති අවස්ථාවක ඔහුගේ එකී අඩුපාඩු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඔහුගේ බලපත්‍රය මත පිටසනක් වශයෙන් යෙදීම හෝ බලපත්‍රයට අනුබද්ධ කිරීම හෝ සිදු කළ යුතු ය.

### 40 වන ව්‍යවස්ථාව

පිටසන් යෙදූ සහතික සහ බලපත්‍රවල වලංගු භාවය

අදාළ ගුවන් යානය ඇතුළුවන දේශය සතු රාජ්‍යයෙන් හෝ රාජ්‍යවලින් හෝ අවසර ලබගෙන විනා එවැනි පිටසන් සහිත සහතික හෝ බලපත්‍ර හෝ

දරන කිසිම ගුවන් යානයක් හෝ කිසිම සේවක පිරිසක් විසින් හෝ ජාත්‍යන්තර ගුවන් සංතරණයෙහි සහභාගි නොවිය යුතු ය. එවැනි යම් ගුවන් යානයක් හෝ සහතික කරන ලද ගුවන් යානා කොටසක් හෝ එය මුලින් සහතික කරන ලද රාජ්‍ය හැර වෙනත් රාජ්‍යයක් ලියාපදිංචි කිරීම හෝ භාවිත කිරීම හෝ සිදු කළ යුත්තේ එකී ගුවන් යානය හෝ කොටස හෝ කවර රාජ්‍යයක් තුළට ආනයනය කරන ලද්දේ ද එකී රාජ්‍යයේ අභිමතය පරිදිය.

### 41 වන ව්‍යවස්ථාව

#### පවත්නා ගුවන් යෝග්‍යතා ප්‍රමිති පිළිගැනීම

කිසියම් ගුවන් යානා වර්ගයක් හෝ ගුවන් යානා උපකරණ වර්ගයක් සම්බන්ධව ජාත්‍යන්තර ප්‍රමිතියක් සම්මත කරගත් දිනයෙන් වර්ෂ තුනකට පසුව එළඹෙන දිනයට පෙර එකී ගුවන් යානා වර්ගයෙහි හෝ ගුවන් යානා උපකරණ වර්ගයෙහි හෝ මූලාදර්ශය අදාළ ජාතික බලධාරීන් වෙත සහතික කිරීම සඳහා ඉදිරිපත් කර ඇත්නම් එවැනි ගුවන් යානා සහ ගුවන් යානා උපකරණ සම්බන්ධයෙන් 37, 38, 39 සහ 40 වන ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ කරගත යුතු නොවේ.

### 42 වන ව්‍යවස්ථාව

#### පුද්ගලයන්ගේ ප්‍රවීණතාව පිළිබඳව පවත්නා ප්‍රමිති පිළිගැනීම

සේවක පිරිස්වලට තිබිය යුතු සුදුසුකම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිතියක් සම්මත කරන ලද දිනයෙන් එක් එක් වර්ෂයකට පසුව එළඹෙන දිනයට පෙර එකී පුද්ගලයන්ගේ පුද්ගල බලපත්‍ර මුල්වතාවට නිකුත් කර ඇත්නම් එවැනි පුද්ගලයන් සම්බන්ධයෙන් 37, 38, 39 සහ 40 වන ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ කරගත යුතු නොවේ. කෙසේ වුව ද, ජාත්‍යන්තර ප්‍රමිතියක් සම්මත කර ගන්නා ලද දිනයෙන් වර්ෂ පහකට පසුවත් බල සහිතව පවත්නා බලපත්‍ර දරන සියලුම පුද්ගලන් සම්බන්ධයෙන් එකී විධිවිධාන අදාළ විය යුතු ය.

### 67 වන ව්‍යවස්ථාව

#### මධ්‍ය මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කිරීම

ස්වකීය ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සමාගම් විසින්, මධ්‍ය මණ්ඩලය නියම කරන නියමයන්ට අනුකූලව, ගමනාගමන වාර්තා, පිරිවැය සංඛ්‍යාලේඛන සහ වෙනත් දේවලට අමතරව සියලුම ලැබීම් සහ එම ලැබීම් ප්‍රභවයන් පෙන්නුම් කෙරෙන මූල්‍ය ප්‍රකාශ ද, මධ්‍ය මණ්ඩලය වෙත යවනු ලබන බව සහතික වීමට එක් එක් ගිවිසුම්ගත රාජ්‍ය පොරොන්දු වෙයි.

### 68 වන ව්‍යවස්ථාව

#### ගුවන් මාර්ග සහ ගුවන් තොටුපල නම් කිරීම

එක් එක් ගිවිසුම්ගත රාජ්‍යය විසින්, මෙම සම්මුතියේ විධිවිධානයන්ට යටත්ව, යම් ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවයක් විසින් ස්වකීය දේශය තුළ දී භාවිතා කළ යුතු ගුවන් මාර්ගය සහ භාවිත කළ යුතු ගුවන් තොටුපල නම් කරනු ලැබිය හැකි ය.

72 වන ව්‍යවස්ථාව

ඉඩම් අත්පත්කර ගැනීම හෝ පරිහරණය

ගිවිසුම්ගත රාජ්‍යයක ඉල්ලීමක් මත මධ්‍ය මණ්ඩලය විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ මූල්‍යයනය කරනු ලබන පහසුකම් කිසිවක් සඳහා ඉඩම් අවශ්‍ය වූ අවස්ථාවක අදාළ රාජ්‍යය විසින් සිය කැමැත්ත අනුව, ඉඩම්වල සන්තකය තමන් වෙත රඳවාගෙන මධ්‍ය මණ්ඩලය වෙත අවශ්‍ය ඉඩම් පවරා දීම හෝ අදාළ රාජ්‍යයේ නීතිවලට අනුකූලව සහ සාධාරණ සහ යුක්ති සහගත නියමයන් යටතේ ඉඩම් පරිහරණය කිරීමට මධ්‍ය මණ්ඩලයට ඉඩ දීම හෝ කළ යුතු ය.

81 වන ව්‍යවස්ථාව

පවත්නා ගිවිසුම් ලියාපදිංචි කිරීම

මෙම සම්මුතිය බල සහිත භාවයට පත්වන විට ක්‍රියාත්මකව පවතින සහ එක් ගිවිසුම්ගත රාජ්‍යයක් සහ තවත් ගිවිසුම්ගත රාජ්‍යයක් අතර වූ ද, නැතහොත් එක් ගිවිසුම්ගත රාජ්‍යයක ගුවන් ප්‍රවාහන සමාගමක් සහ තවත් රාජ්‍යයක් හෝ තවත් රාජ්‍යයක ගුවන් ප්‍රවාහන සමාගමක් හෝ අතර වූ ද, සියලුම ගගන නාවික ගිවිසුම් වහාම මධ්‍ය මණ්ඩලයෙහි ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

83 වන ව්‍යවස්ථාව

නව වැඩපිළිවෙල ලියාපදිංචි කිරීම

ඉහත ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව, යම් ගිවිසුම්ගත රාජ්‍යයකට මෙම සම්මුතියෙහි විධිවිධානයන්ට අනනුකූල නොවන වැඩපිළිවෙල කිසිවක් සකස් කර ගැනීමේ අයිතිය තිබේ. එවැනි වැඩපිළිවෙළක් වහාම මධ්‍ය මණ්ඩලයෙහි ලියාපදිංචි කළ යුතු අතර, මධ්‍ය මණ්ඩලය විසින් එය හැකි පහසු ඉක්මනින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබිය යුතු ය.

83 වන ව්‍යවස්ථාව. **bis** (අතිරේක)

(අ) ගිවිසුම්ගත රාජ්‍යයක් තුළ ලියාපදිංචි වී ඇති යම් සිවිල් ගුවන් යානයක්, තම ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හෝ එවැනි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයක් නොමැත්තේ නම්, තම ස්ථිර නිවාසස්ථානය වෙනත් රාජ්‍යයක් තුළ පිහිටා ඇති මෙහෙයුම්කරුවකු විසින්, යම් බදු ගිවිසුමක් මත හෝ චාටර් ගිවිසුමක් මත හෝ ගුවන් යානා හුවමාරුවකට අදාළව හෝ මෙහෙයවනු ලබන අවස්ථාවක එකී සිවිල් ගුවන් යානය ලියාපදිංචිව ඇති රාජ්‍යය විසින්, 12, 30, 31 සහ 32(අ) වන ව්‍යවස්ථාවල කුමක් සඳහන් වුව ද, එකී වෙනත් රාජ්‍යයන් සමග ඇතුළත් වූ ගිවිසුමක් මගින් 12, 30, 31 සහ 32(අ) වන ව්‍යවස්ථා යටතේ එකී ගුවන් යානය සම්බන්ධයෙන් ලියාපදිංචි රාජ්‍යය ලෙස තමන්ට පැවරී ඇති සියලු කර්තව්‍ය සහ කාර්ය හෝ ඉන් කොටසක් එකී වෙනත් රාජ්‍යයට පැවරිය හැකි වේ ;

එසේ පවරනු ලබන කර්තව්‍ය හෝ කාර්ය සම්බන්ධයෙන් ලියාපදිංචි රාජ්‍යය වගකීමෙන් නිදහස් වන්නේ ය.

(ආ) එකී පැවරීම, එසේ රාජ්‍යයන් අතර ඇති වූ ගිවිසුම සභාව වෙත ලියාපදිංචි කොට 83 වන ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රසිද්ධ කිරීමට පෙර හෝ ගිවිසුමක් පවතින බව සහ එකී ගිවිසුමේ වපසරිය ගිවිසුමට පාර්ශවකරුවකු වූ රාජ්‍යයක් විසින් උනන්දුවක් දක්වන අන් ගිවිසුම්ගත රාජ්‍යයක හෝ රාජ්‍යයන්හි බලධාරීන්ට සෘජුව සංදේශනය කිරීම හෝ යන කාරණා දෙක අතරින් එක් කාරණයක් සිදු වීමට පෙර අන් ගිවිසුම්ගත රාජ්‍යයන් සම්බන්ධයෙන් බලාත්මකභාවයට පත් නොවන්නේ ය.

**89 වන ව්‍යවස්ථාව**

යුද හා හදිසි අවස්ථා තත්ත්වයන්

කිසියම් යුද්ධයකදී, සංග්‍රාමිකයින් වශයෙන් හෝ අපක්ෂපාතී රාජ්‍යයක් වශයෙන් හෝ යුද බලපෑම්වලට මුහුණ දෙන කිසියම් ගිවිසුම්ගත රාජ්‍යයක් සතු ක්‍රියා කිරීමේ අයිතිය කෙරෙහි මෙම සම්මුතියේ විධිවිධානයන්ගෙන් බලපෑමක් සිදු නොවේ. ජාතික හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කරන සහ ඒ බව මධ්‍ය මණ්ඩලය වෙත දැනුම් දෙන යම් ගිවිසුම්ගත රාජ්‍යයක් සම්බන්ධයෙන් ද එම මූලධර්මයම අදාළ වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.